ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



වසරේ හොඳම ආගමික පුවත්පත



කොළඹ අගරදගුරු පදවි කාලීන සිදුවීම් අධ්‍යයන කමිටුවේ ඉල්ලීමක්...

**සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනස් කරන්න**

3 පිටුව



**දේව සේවක තෝමස් කාදිනල් කුරේ උතුමාණෝ**

දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ 23 වන අනුස්මරණය අළලා පළවන්නකි.

9 පිටුව



**"ඔව්හු ඉසිලිය නොහැකි මහා බර පොදි බැඳ මිනිසුන්ගේ කරේ තබති. එහෙත් ඒ බර පොදි ඉසිලීමට සුළැඟිල්ලක තරම් වත් ආධාරයක් දීමට කැමැති නොවෙති."**

(මතෙව් 23:1-12)


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

ක්‍රි.ව. 2011 ක් වූ ඔක්තෝබර් මස 30 ඉරිදා 146 වෙළුම 22 කලබ සතිපතා පත්‍රය - පිටු 20 - මිල රු. 20 QD/18/NEWS/2011 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.


# සිංහල දමිළ සමඟියට කල්කුඩා දෙව්මැඳුර ආදර්ශයක්!

## ත්‍රි'මලය - මඩකලපුව සහයක රදගුරු හිමි කියයි

**ප්‍රැන්සිස් වීරප්පෙරුම විසිනි**

**කල්කුඩා ප්‍රදේශයේ ජනප්‍රිය පාසිකුඩා වෙරළ තීරය අසළ පිහිටි ඓතිහාසික ආරෝග්‍ය මාතා දෙව්මැඳුර ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු පසුගියදා විවෘත විය. වසර තිහකට වැඩි කාලයක් පැවති රුදුරු ත්‍රස්තවාදයෙන් හා සුනාමි උවදුරින් කල්කුඩා ප්‍රදේශය විනාශ වී ගිය අතර මෙම කතෝලික දෙව්මැඳුර ද සම්පූර්ණයෙන් ම අබලන් වී තිබිණ. පසුව මීසම් සේවක ගරු ක්ලෙමන්ට් වී. අන්නදාස් පියතුමන්ගේ ආරාධනයෙන් මඩවල එන්ටර්ප්‍රයිසස් ආයතනයේ අධිපති දේශමාන්‍ය, සමස්ත ලංකා සාම විනිසුරු ඩී. ජේ. මඩවල මහතා විසින් මෙම දෙව්මැඳුර රුපියල් මිලියන තුනක් පමණ වැය කර සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලදි. පසුගිය දා එහි වාර්ෂික මංගලෝත්සවය ත්‍රිකුණාමල, මඩකලපුව සහයක රදගුරු අති උතුම් පොන්නයියා ජෝශප් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර දේවමාතා පිළිරුව රැගත් අලංකාර පෙරහරක් ගම වටා ද, බෝට්ටු පෙරහරක් කල්කුඩා මුහුදු තීරයේ ද සංචාරය කරන ලදි.**

මෙම උත්සවය දෙමළ - සිංහල හා හින්දු බැතිමතුන්ගේ සුහදත්වයේ ප්‍රතිමූර්තියක් බඳු විය. ත්‍රස්තවාදය විනාශ වීමෙන් පසු ඇති වූ ද්‍රවිඩ සිංහල සමඟියට මේ දෙව්මැඳුර හොඳම සංකේතයක් බවත්, මඩවල මහතා කාලීන අවශ්‍යතාවයක් ඉටු කළ බවත් ත්‍රිකුණාමලය - මඩකලපුව සහයක රදගුරු අති උතුම් පොන්නයියා ජෝශප් හිමිපාණෝ පවසති.

මංගල දේව මෙහෙය සිංහල හා ද්‍රවිඩ බසින් පැවත්වීම ම ප්‍රදේශයේ සිංහල, දෙමළ සමඟිය යළි ගොඩනැගී ඇති බවට සාක්ෂියක් විය. රදගුරුතුමන්ගේ දේශනය ද ද්‍රවිඩ හා සිංහල දෙබසින් ම පැවති අතර එම දේව මෙහෙය සඳහා වාලච්චේන, මාන්කෙනි, එරාවූර්, චෙන්කලඩි යන ප්‍රදේශ වලින් ද සිංහල, ද්‍රවිඩ කතෝලික බැතිමතුන් විශාල පිරිසක් සහභාගී වී සිටීම කැපී පෙනෙන සිද්ධියක් විය.



අභිනවයෙන් තනා නිම කරන ලද කල්කුඩා දෙව්මැඳුර



## කතෝලික සාහිත්‍ය සම්මාන උළෙල

අන්තර්ජාතික කතෝලික මාධ්‍ය සංවිධානය හා අනුබද්ධිත ජාතික කතෝලික ලේඛක හවුලේ 26 වන සංවත්සරය හා සමගාමී "කතෝලික සාහිත්‍ය උලෙළ" නොවැම්බර් මස 06 වන ඉරුදින ප.ව. 3.00 ට කොළඹ පිටකොටුව, මල්වත්ත පාරේ, 6 වැනි පාවුළු මධ්‍යස්ථානයේ දෙවන මහලේ කාදිනල් කුරේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිතය. මෙම උලෙළ ඇතුගල්පුර රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් අන්තර්ජාතික කතෝලික මාධ්‍ය සංවිධානයේ මහා ලේකම් ජෝශප් චිත්තිලාපිල්ලි මහතාගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

**(සී. ආර්. ඩික්සන් ඇන්ටනි)**

## නොවැ. 02 මාදම්පිටිය දේව මෙහෙය

නැසීගියාවූ සියලුම ආත්මයන් සිහිපත් කරමින්, තුති පිදීමේ දිව්‍ය යාගය, කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ උතුරු කොළඹ දිසාවේ පියවරුන්ගේ සහභාගිත්වයෙන් නොවැම්බර් මස 02 දින ප.ව. 4.00 ට කොළඹ 14, මාදම්පිටිය කතෝලික සුසාන භූමියේ දී පැවැත්වේ. ප.ව. 4.00 ට ජපමාලය උච්චාරණය කරනු ලැබේ.

## මියුසිකල් මිස්ටික් සා. ජෝශප් විදුහලේ

කොළඹ සා. ජෝශප් විදුහලේ සාන්ත සිසිලියා ගීතිකා කණ්ඩායමේ "මියුසිකල් මිස්ටික්" සංගීත සංධ්වනිය ඔක්. 29 ප.ව 6.30 ට සා. ජෝශප් විද්‍යාලයීය "ස්ටැන්ලි අබේසේකර පිය" ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

## දේව ධර්ම නිකේතනය මීගමුව ශාඛාවේ අයදුම්පත්

ලබන වසරේ දේව ධර්ම නිකේතනය මඟින් පවත්වනු ලබන පාඨමාලා සඳහා අයදුම්පත් නොවැ. මස 01 සිට 10 දා දක්වා කාලය තුළ දී මීගමුව තෝමස් කාදිනල් කුරේ දේව ධර්ම නිකේතනයේ දී ලබාගත හැකි බව පාඨමාලා අධ්‍යක්ෂ පියවරු දන්වා සිටිති.

## ආගමික නිදහස තහවුරු කරන්න

### සමයාන්තර සංවාදය පිළිබඳ සසුන් කොමිසම දීපවාලි පණිවුඩයෙන් ඉල්ලා සිටී

**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

ආගමික නිදහස අපගේ තේමාව ලෙස සමාජය මධ්‍යයට ගෙන එන ලෙස අපි යෝජනා කරන්නේ බොහෝ පෙදෙස්වල ජනතාව සිය ආගමික විශ්වාසය නිසා තාඩන පීඩන වලට, නොතකා හැරීමට, අගතිගාමි ප්‍රහාරයන්ට ගොදුරු වන නිසා යැයි සමයාන්තර සංවාදය පිළිබඳ අපෝස්තලික සසුන් කොමිසම මගින් දීපවාලි උත්සවය නිමිත්තෙන් නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටී.

සමයාන්තර සංවාදය පිළිබඳ අපෝස්තලික සසුන් කොමිසමේ සභාපති අති උතුම් ජීන් ලුවි කාදිනල් ටවුරන් හිමිපාණන් විසින් නිකුත් කරන ලද නිවේදනයේ මෙසේ ද දැක්වේ.

15 පිටුවට ▶

## කාර්දිනල් කුරේ දෙවන මුද්‍රණය



කාර්දිනල් කුරේ හිමියන් ගැන පළමු පොතේ දෙවන මුද්‍රණය 2011 ඔක්. 29 වන දින උන්වහන්සේගේ ස්වර්ගස්ථ වීමේ 23 වන සංවත්සරය නිමිත්තෙන් කතෝලික මුද්‍රණාලයෙන් මුද්‍රණය වී තිබේ.

15 පිටුවට ▶

## යුද්ධය අවසන් නමුත් සියල්ල තවම යහපත් වී නැහැ!

### මහනුවර රදගුරු හිමිපාණෝ පවසති

**ඒන්ස්ලි ජෝශප් විසිනි**

යුද්ධය අවසාන වීම නිසා ජනතාවට යම් සහනදායී හැඟීමක් ඇති වී ඇතිමුත් සියල්ල තවම යහපත් වී නැතැයි මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණෝ පවසති.

රදගුරු හිමි මේ බැව් පළ කළේ කරිටාස් ශ්‍රී ලංකා ක්‍රියාකාරී කමිටුවේ තුන් දින රැස්වීමේ තේමා දේශනය පවත්වමිනි. එහි දී වැඩිදුරටත් කතා කළ රදගුරු හිමි උතුරු නැගෙනහිර ගැන සඳහනට ලක් කරමින් වෙඩි හඬ තව දුරටත් සවන් නොවැකෙන අතර, හදිසි නීතිය ඉවත් කර තිබේ. සටන්කාමීන් පුනරුත්ථානයත්, යටිතල පහසුකම්

15 පිටුවට ▶

## අගරදගුරු වසමේ කලාපීයකරණය ආරම්භ කිරීමට පූජක අනුමතිය

**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

කොළඹ අගරදගුරු වසමේ ව්‍යුහමය වෙනස්කම් සහ කලාපීයකරණය කටයුතු ආරම්භ කිරීමට පූජකතුමන්ගේ එකඟතාව පළවිය. එහි දී මුල් අදියර වශයෙන් කොළඹ උතුරු කලාපයෙන් අවශ්‍ය ව්‍යුහමය වෙනස්කම් සහ කලාපීයකරණය සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම් කිරීමට අගරදගුරු වසමේ පූජකතුමෝ සිය දැත් ඔසොවා එකඟතාව පළ කළහ.

ඉකුත් සඳුදා හා අඟහරුවාදා පැවැති අගරදගුරු වසමේ වාර්ෂික පූජක රැස්වීමේ දී මේ තීරණයට එළඹිණි. කොළඹ බොරැල්ල ජුසේ වාස් දේව ධර්ම නිකේතන ශ්‍රවණාගාරයේ පැවැති මේ රැස්විම කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. සමාරම්භක සැසිවාරයට ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් ද සහභාගි විය.





සේයා - ටී. සුනිල් ප්‍රනාන්දු

15 පිටුවට ▶

## ප්‍රධාන බාල දක්ෂ කොමසාරිස්ගෙන් කරුණු පැහැදිලි කිරීමක්

ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ ඔක්තෝබර් 16 වන දින කලාපයේ පළ වූ "ශ්‍රී ලංකා බාල දක්ෂ සියවස් ජම්බෝරිය 2012 ශුද්ධවු සතියේ" යන ලිපිය පිළිබඳව ප්‍රධාන බාල දක්ෂ කොමසාරිස් සී. බටුවන්ගල මහතා කරුණු පැහැදිලි කිරීමක් කර ඇත.

මෙවර අප සියවස් බාල දක්ෂ ජම්බෝරියට සමගාමීව ආසියා පැසිපික් කලාපීය ජම්බෝරිය පැවැත්වීම සඳහා අපහට අවස්ථාව උදා වී ඇති අතර, මෙය ශ්‍රී ලංකා බාල දක්ෂ ව්‍යාපාරයේ වසර 99 ක ඉතිහාසයේ පළමුවරට පැවැත්වෙන ජාත්‍යන්තර ජම්බෝරිය වනු ඇත. තවත් ආසියා පැසිපික් කලාපීය රටවල් 03 ක් මේ සඳහා ඉල්ලුම් කර තිබුණ ද වසර 03 කට පෙර අප කළ ඉල්ලීමකට අනුව හා අප රටේ බාලදක්ෂ ව්‍යාපාරයේ දියුණුව මත අප හට මෙම අවස්ථාව ලබා දෙන ලදි.

මෙහි දින නියම කරනු ලැබූයේ 2010 ජූනි මාසයේ දී බංග්ලාදේශයේ පැවති ආසියා පැසිපික් සමුළුවේ වන අතර, මේ වන විට අප කතෝලික රදගුරු මැඳුරෙන් ශුද්ධවු සතියේ 2012 දින පිළිබඳව විමසීම් කරන ලද නමුත් ඒ වන විට 2012 එම දින පිළිබඳව ස්ථිරව පැවසීමට ඔවුනට නොහැකි විය.

15 පිටුවට ▶

## ලොකු සැර්



පොලිසිය වැඩ පෙන්නුවොත් මාස්පතා තෑගි
- පුවතක්

**අතේ පයේ හිරි ඇර ගන්නවාටත් එක්ක ද?**

**"ඔවුහු මුවින් පවසන දේ ක්‍රියාවෙන් නොපෙන්වති."** (ශු. මතෙව් 23:3)

පදවියෙන් පදවියට



ගාල්ල ජපමාල මාතා ආසන දෙව්මැඳුරේ වාර්ෂික මංගල්ලය ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මංගල මෙහෙයෙන් පසු ප්‍රතිමාව වීදි සංචාරය කරද්දී ගාල්ල ශ්‍රී විනයාගර් කෝවිල අබියසදී හින්දු බැතිමතුන් දේවමාතාවන්ට මල්මාලා දමා උපහාර දැක්වූ අයුරු.

ඩන්ස්ටන් වික්‍රමරත්න

# වැඩිහිටි කිතුනු ජීවිතය යනු දිනෙන් දින සමිඳුන්ව අනුගමනය කර වෙනස් වීමයි

## හලාවත රදගුරු හිමි බොරලැස්සේදී පවසයි

**වැඩිහිටි කිතුනු ජීවිතය යනු දිනෙන් දින ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරමින් වෙනස්වන පුද්ගලයන්ය. සිත වෙනස් කරගෙන ජීවිත අභියෝග වලට මුහුණ දෙන පුද්ගලයා නියම කිතුනුවෙක් යැයි හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ පවසති.**



රදගුරු හිමි එසේ පැවසුවේ බොරලැස්ස සා. ආනා දේවස්ථානයේ දරු දැරියන් 78 දෙනකුට අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ මෙහෙයේදීය.

උන්වහන්සේ වැඩිදුරටත් මෙසේ පැවසූහ. පසුතැවිල්ල තුළ අප නැවත ශක්තිමත් වෙන බවත්, ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අපව වෙනස් කරන බවත්, අන් අයගේ අසරණ කමේදී සංවේදි වන්නට අප යොමුකරන්නේද ශුද්ධාත්මයාණන් වහන්සේ බවත්ය.

බොරලැස්සේ ශාන්ත ආනා දේවස්ථානයේ අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ මෙහෙය මීසම් සේවක ගරු නිශාන්ත ජානක සහ සහයක ගරු දිනේෂ් කීර්ති පියතුමන් ඇතුලු මීසම් වාසීන් විසින් සංවිධානය කරන ලදී.

ටී. එම්. අජිත් ශාන්ත

## වාර්ෂික ධර්මවිවේකය 3

**මීසම් වල සේවය කරන ගරු පියතුමන් සඳහා**

**දිනය** - නොවැම්බර් 06 ඉරිදා (රාත්‍රි ආහාරය) සිට නොවැම්බර් 11 සිකුරාදා (රාත්‍රි ආහාරය) දක්වා

**දේශක** - ගරු ස්ටීවන් බ්‍රොක් පියතුමා

**සහභාගි වන පිරිස**

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි, අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු, ගරු මාකස් ප්‍රදිනන්දිස්, ගරු නික්ලස් බටේපොල, ගරු ටෙරන්ස් කේ. පෙරේරා, ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු, ගරු විල්ප්‍රඩ් පින්තු, ගරු හියුගෝ පලිහවඩන, ගරු මහේෂ් ගනේමුල්ල, ගරු ඒ. උදයදාස්, ගරු ප්‍රසන්න සංජීව, ගරු සුනිල් ද සිල්වා, ගරු මර්ල් ශාන්ති පෙරේරා, ගරු සික්ස්ටස් කුරුකුලසූරිය, ගරු ජේ. පැට්‍රික් පෙරේරා, ගරු ටෙරන්ස් ප්‍රනාන්දු, ගරු නිහාල් අයිවන් පෙරේරා, ගරු මහේන්ද්‍ර ගුණතිලක, ගරු සුමිත් කුමාර, ගරු අනුර සිල්වෙස්ටර් පෙරේරා, ගරු වික්ටර් සිල්වා, ගරු දේශාන් ලසන්ත, ගරු එඩ්වඩ් රේවල්පුල්ලේ, ගරු වින්සන්ට් ඩෙප්, ගරු ප්‍රසාද් ඉන්දික, ගරු ගිහාන් ආර්. පෙරේරා, ගරු ලෙස්ටර් නෝනිස්, ගරු ලියෝ කැමිලස්, ගරු දිනේෂ් ප්‍රනාන්දු, ගරු හේමන්ත උදයකුමාර, ගරු ගියෝම් නෝනිස්, ගරු ක්ලෙමන්ට් රොසයිරෝ, ගරු රුවන්දන මෙන්ඩිස්, ගරු ඔගස්ටින් ප්‍රනාන්දුපුල්ලේ, ගරු ටිරෝන් පෙරේරා, ගරු ප්‍රිය ජයමාන්න, ගරු ටෝනි මාටින්, ගරු නුවන් බුද්ධික, ගරු නොයෙල් නෝනිස්, ගරු රවීන් සඳසිරි, ගරු ප්‍රසාද් පෙරේරා, ගරු කාල්ටන් ද සිල්වා, ගරු බර්ට්‍රම් රංජිත්, ගරු වසන්ත ප්‍රසන්න, ගරු හිෂාන්ත පෙරේරා, ගරු ප්‍රසාද් පොන්නම්පෙරුම, ගරු ප්‍රගීත් චාමර, ගරු සිසිර ප්‍රියශාන්ත, ගරු රංජිත් මදුරාවල, ගරු එච්. ඩී. ඇන්ටනි, ගරු ටෙරන්ස් බෝදියාබදුගේ, ගරු සංජීව මෙන්ඩිස්

**අතිඋතුම් මේරියස් පීරිස්**
**සහයක රදගුරු හිමි**

## භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු පිය මංගලෝත්සවය මුල්වරට මාඑළියේදී



**භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු පියාණන්ගේ මංගල්‍යය ශ්‍රී ලංකාවේදී ප්‍රථමවරට පසුගිය සති අන්තයේදී පැවැත්විණ. මාඑළිය අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු මධ්‍යස්ථානයේදී විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සන්ධ්‍යා මෙහෙය පැවැත්විණ.**

එහිදී කතාකළ විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු පියාණන් ජීවතුන් අතර සිටියදී වන්දනීය ජුසේ වාස් පියතුමන් භාග්‍යවරයට එසවීම සඳහා මෙරටට සැපත්වූ අවස්ථාවේ පැවැත්වූ දෙසුම් යළි සිහිපත් කළහ.

දමිළ අපෝස්තලික සේවාව පිළිබඳ කලාපීය නාහිමි අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා හැඳින්වීමේ දෙසුම පැවැත්විය. මාඑළිය අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පිය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ගරු සිරිල් පෙරේරා පියතුමාගේ මෙහෙයවීමෙන් මුල්වරට මේ මංගලෝත්සවය පැවැත්වීමට කටයුතු සංවිධානය කැරිණ.

## සාන්ත පියෝ මංගල්ලය සැමරේ



**නිහතමානී වන්න, මානුෂිකත්වයට ගෞරව දක්වන්න. මෙම ගුණාංග පිරිහී යෑම අරගල ඇතිවීමට සාධකයක් වන බැවින් යාච්ඤා කරන්නැයි ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණෝ සාන්ත පියෝ මුනිඳුන්ගේ මංගල්‍ය දිව්‍ය යාගයේ දී පැවසීය.**

ෆ්‍රැන්සිස්කාන කැපුචීන් නිකාය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර දස වසර පිරීමේ සංවත්සරය සැමරීම ද මෙදින සිහිපත් කැරිනි. ෆ්‍රැන්සිස්කාන කැපුචීන් නිකායේ පල්ලන්සේන ප්‍රාදේශීය දෙව්සත්හල් එළිමහන් මණ්ඩපයේ දී ඒකාබද්ධ දිව්‍ය යාගය අපෝස්තලික තානාපති හිමි සමඟ පකිස්තානයේ උප ප්‍රාදේශාධිපති ගරු ක්ලැරන්ස් හෙයින් සහ බෙල්ජියම් ප්‍රාදේශාධිපති ගරු ඇඩ්රි ගීර්ට්ස් පියතුමන් විසින් සිදුකරන ලදි.

කැපුචීන් නිකායේ ශ්‍රී ලංකා ප්‍රාදේශීයාධිපති ගරු නෝබට් සෝසා, ඉන්දියාවේ කර්නාටක ප්‍රාන්තයේ ප්‍රාදේශාධිපති ගරු පීටර් සිප්රියන්, පල්ලන්සේන මීසම් සේවක ගරු ජයන්ත නිමල් ජපමාල නිකායේ කොච්චිකඩේ කනිටු දෙව්සත්හලේ පූජක සිසුන් බාර ගරු අනිල් ප්‍රියශාන්ත පියතුමන, පැවිදි සොහොයුරියන් ප්‍රදේශවාසීන් විශාල සංඛ්‍යාවක් ද සහභාගි වූහ.

සේයා - නීල් පැස්කුවෙල්
සටහන - මෙල්වින් ද කොස්තා

## කරිටාස් ළමා දින වැඩසටහනක්

**ලෝක ළමා දිනය නිමිත්තෙන් කරිටාස් ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙයවීමෙන් සෙඩෙක් ශ්‍රවණාගාරයේදී සිසු නායකයන් සිය දෙනෙක්, ගුරුවරුන් හා දෙමාපියන්ගේ සහභාගිත්වයෙන් වැඩසටහනක් පැවැත්විණ.**

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශයේ අධ්‍යක්ෂිකා ශිරානි රාජපක්ෂ මහත්මිය හා කරිටාස් ළමා ආරක්ෂණ වැටසටහන් නිළධාරිනි ගරු නිලන්ති රණසිංහ පැවිදි සොයුරිය දෙසුම් පැවැත්වූහ.

ඒන්ස්ලි ජෝශප්

## ලෝක විවාහ හමුවේ 36 වන ආසියාතික සම්මේලනය ඉන්දියාවේ

**රටවල් 87 ක ව්‍යාප්තව ඇති විවාහ හමු වැඩ සටහනේ 36 වන ආසියාතික මහා සමුළුව ඉන්දියාවේ හයිද්‍රබාද් හිදී මෙවර පැවැත්විය.**

ශ්‍රී ලංකාව ඇතුළු ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, මලයාසියාව, සිංගප්පූරුව, බංගලාදේශය, පිලිපීනය, චීනය, තායිවානය හා එක්සත් එමීර් රාජ්‍යය යන රටවල් 12 ක ජාතික කණ්ඩායම් එයට හවුල් වූහ.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කණ්ඩායමේ ආචාර්ය ගරු ජූඩ් නික්ලස් පියතුමා සමග රිචඩ් + ශ්‍රියානි පොන්සේකා යුවළ ඊට සහභාගි වූහ. මෙවර ආසියාතික සමුළුවේ තේමාව වූයේ "යන්න සියලු ජාතීන්ට දිවැසිවරයකු වන්න" යනුයි.

විල්ප්‍රඩ් හා හෙලන් රාජකරුණා

# ශ්‍රී කුරුසිය ජයග්‍රහණය හා ආනන්දයේ සංකේතයයි

බී. රංජිත් මැන්ඩිස්

රෝම අධිරාජ්‍යය තුළ පරාජයේ හා අපහාසයේ සංකේතයක්ව පැවති කුරුස ගස, ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව සිදුකිරීමට පූජාසනය වශයෙන් තෝරා ගැනීම මඟින් ශ්‍රී කුරුසිය ජයග්‍රහණයේ සංකේතයක් බවට පත්වී ඇති බවත්, ශ්‍රී කුරුසියේ එම ජයග්‍රහණය අප ජීවිත යථාර්ථය බවට පත්කර ගැනීමට උත්සහ කළ යුතු බවත් පොලොන්නරුව පුලස්තිගම ශ්‍රී කුරුස දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යයේදී පලුගස්දමන මීසම් සේවක ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමා ප්‍රකාශ කළේය.

එහිදී වැඩිදුරටත් කතා කළ ගරු පියතුමා මෙසේද පැවසීය. අපගේ මෙම දේවස්ථානය අන්තවාදීන්ගේ කුරිරු ප්‍රහාරයකට ලක්ව විනාශ වීමට ගිය අවස්ථාවේ ශ්‍රී කුරුසියේ බලමහිමයෙන් දේවස්ථානය යථා තත්ත්වයකට පත්කිරීමට හැකි වූ බවත්, ඇපකැපවී දේවස්ථානය යථා තත්ත්වයට පත්කිරීමට ක්‍රියාකළ සැමට තුති පුදන බවත් පැවසීය.

මංගල මෙහෙය සඳහා කඩලාන කුරණ, මහබාගේ. කටුනායක. බුරුල්ලපිටිය, වැලිවේරිය, කොළඹ - මෝදර ප්‍රදේශවලින් විශාල පිරිසක් සහභාගිවූහ. මංගල මෙහෙය අවසානයේ ශ්‍රී කුරුසිය රැගත් පෙරහැර වීදි සංචාරය කළේය.



බෝලවලාන සදාසරණ එක්සත් සමිතියට 50 වසරක් පිරීම නිමිත්තෙන් පැවති ස්වර්ණ ජයන්ති සැමරීමෙන් පසු සහයක ගරු සුමිත් කුමාර පියතුමා සමග සදාසරණ එක්සත් සමිති සමාජික පිරිස සේයාරුවකට පෙනීසිටි අවස්ථාව.

ඇග්නස් සියඹලාපිටිය

## මරිය තුමියගේ ආදර්ශය අපේ පවුල් දිවියට අත්වැලක්

**අප ශරීර මහපොළවට දිරාපත් වූවත් ශුද්ධවනත්භාවයේ උල්පත වූ මරිය තුමිය ආත්ම ශරීර පිටින් ස්වර්ගයට එසවීමට එතුමිය තෝරාගනු ලැබුවේ පිරිසිදුභාවය නිසා බව ගරු මැල්කම් කන්දප්පා පියතුමා රත්මලාන සා. මරියා දෙව්මැඳුරේ වාර්ෂික මංගල දිව්‍ය පූජා යාගයේදී පැවසීය.**

ගරු පියතුමා වැඩිදුරටත් මෙසේ පැවසීය. මරිය මව්ගේ ජීවිතය තුළින් කිතුනු අපේ ජීවිත දෙස ආපසු හැරී බලා, අප දරුවන්ට පවුල් යාච්ඤා, ජපමාලය උච්චාරණයට මුල්තැන දෙන්න. මරියතුමියගේ සරණය මඟපෙන්වීම තුළ අප පවුල් ජීවිතය නැවත ප්‍රතිෂ්ඨාපනය කරගත යුතුයි.

රත්මලාන මීසම් සේවක ගරු රොනී වික්‍රමසිංහ පියතුමාගේ මෙහෙයවීමෙන් මංගල්‍ය කටයුතු පැවැත්විණ.

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රි. ව. 2011 ඔක්තෝබර් 30 ඉරිදා

# නීතියේ ආධිපත්‍යය බිඳ වැටීම

මානව හිමිකම් නොතකා හරිමින් නීතියේ ආධිපත්‍යය ගිලිහී යෑමේ අවදානම් ස්වරූපයක් රටපුරා දිස්වෙනු ලබයි. හැම මැතිවරණයක් පාසාම නීතිය ක්‍රමිකව දුර්වල කරවීමේ ක්‍රමවේදයක් පැවතියා දෝ යන සැකය වඩාත් තහවුරු කරන්නට කරුණු කාරණා සැකසී තිබීමත් එම උක්ත කරුණ තවත් සනාථ බවට පත්කරයි. විශේෂයෙන්ම ගෙවුණු පසුගිය පළාත් පාලන මැතිවරණය පුරාම පැවති යම් අවිනිශ්චිත ගැටළු සහගත තත්ත්වය හා අවසානයේ දී කොළොන්නාවේ සිදුවූ අවාසනාවන්ත සිදුවීම දැන් නිරන්තරයෙන්ම මෙය ප්‍රශ්නාර්ථයෙන් ම අසන්නට වාතාවරණය සූදානම් කොට දී තිබේ. නීතිය හා සාමය සුරකින පොලිසිය දේශපාලනීකරණය වීම තුළ හා මානව හිමිකම් නොතකන පරිසරයක් ඉතාමත් බියකරු අයුරින් නිර්මාණය වෙමින් තිබීම මෙහි තිබෙන භයංකර බව සැබෑවටම පෙන්වා දෙයි. එමනිසා යුක්ති ගරුක සමාජයක් හා දේශයක් පිහිටුවාලීමේ පරම අයිතිය හා සුවිශේෂී ශුද්ධ උරුමය සියලු ජනතාව සතු බැවින් අපිදු ඒ ප්‍රශ්නය නැවතත් අසන්නට මෙම තීරුව මෙලෙස කැප කරන්නෙමු.

විපක්ෂ නායකවරයාට අනුව අද රට තුළ ඝාතන සංස්කෘතියක් නිර්මාණය වෙමින් පවති. ඔහු එම අදහස පතළ කරන්නට මේ දිනවල දේශපාලන වේදිකාව භාවිත කරමින් සිටී. විපක්ෂ නායකවරයා පවසන පරිදි පසුගිය වසරේ සැප්තැම්බර් මස 08 වනදා සිට ශීඝ්‍ර ලෙස මේ පසුබිමේ අඳුර කලළු බැසීම ආරම්භ වී තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වෙනි සංශෝධනය අහෝසි කර නීතියේ පරමාධිපත්‍ය ඝාතනය කරවීමත් ඒ හා සමගාමී ව ඇති වී තිබෙන බවට ඔහු පවසන අදහසෙහි සත්‍යාසත්‍ය බවත් විමසා බැලීම වටී.

රටක නීතියේ පරමාධිපත්‍යය සුරක්ෂිත වීමට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය විධිමත්ව පවත්වා ගත යුතුයි. යුක්තිය පසිඳලීමේ ක්‍රමය පිළිබඳව කිසිදු ගැටළුවක් හෝ ප්‍රශ්නයක් නිර්මාණය වී නොතිබිය යුතුයි. පොලිසිය හා නීතිපති දෙපාර්තුමේන්තුව සාධාරණය ඉටුකළ යුතුයි. අල්ලස් හා දූෂණ කොමිසම සිය කටයුතු නිසි අයුරින් ඉටුකළ යුතුයි. මානව හිමිකම් ආරක්ෂා විය යුතුයි. ඒ සියල්ල නිසි අයුරින් පවත්වාගන්නට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළ යුතුයි.

ව්‍යවස්ථාවලිය ක්‍රියාත්මක වීම හා නොවීම පිළිබඳවත්, විවිධ සංශෝධන එයට එක්කොට ඉනික්බිතිව ඒවා ස්වයං නිෂ්ක්‍රීය තත්ත්වයකට පත්වීමට ඉඩ හැරීමත් නීතියේ ආධිපත්‍ය බිඳවැටීමට තවත් හේතුවක් වී තිබෙන බව පැහැදිළියි. වරක් ආණ්ඩු පක්ෂය හා විපක්ෂය එක්ව 17 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ඒකමතිකව සම්මත කළ ආකාරයක් පසුගිය දශකය ආරම්භයේ දී දැකිය හැකි වූ සුබ නිමිත්තක් බව පෙන්වා දෙන්නේ ඒ හා සමඟ ක්‍රියාත්මක වූ යම් යම් සාධනීය කරුණු පැහැදිළි වී තිබීම නිසායි. පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම, අධිකරණ සේවා කොමිසම, මානව හිමිකම් කොමිසම වැනි විවිධ වූ කොමිසම් බලාත්මක කොට නීතිය ආරක්ෂා කිරීමට සියලු දෙනා පොළඹවා ගැනීමත් එහිදී දැකිය හැකි කරුණක් ද වූ බව පැහැදිළියි.

නමුත් අභාග්‍යයකට යම් යම් අමාත්‍යවරුන්ගේ අමනෝඥ ක්‍රියා පිළිවෙත් හිතුවක්කාරව හෙළිදැක්වීම නිසා පසු කලක එය අක්‍රිය වී 18 වෙනි සංශෝධනයක් කඩිනමින් ක්‍රියාත්මක කරන්නට පෙළඹුන තත්ත්වයක් නිර්මාණය විය. එම සංශෝධනය නිසා ජාත්‍යන්තර, සිවිල් හා දේශපාලන අයිවාසිකම් පිළිබඳව සම්මුතියට අත්සන් තබා ක්‍රියාත්මක කිරීමට තිබූ එකඟත්වය පවා අහෝසි වූ බව විපක්ෂ නායක වරයා පවසයි. ඒ සිදුවීම් හේතුකොට 17 වෙනි සංශෝධනය ඉන්පසු අහෝසි වූ බවත් සඳහන් කරයි.

පොලිසිය ඒ අනුව අකර්මන්‍ය තත්ත්වයක් හා දේශපාලනීකරණය වූ තත්ත්වයක් පෙන්නුම් කොට ඇති බව පෙනේ. මෙහිදී නීතිය නිසි අයුරින් ඉටුකිරීමේ මඟ ඇහිරෙන තත්ත්වයක් ඉස්මතු වී තිබීම තුළ ජනතාව නීතිය අතට ගෙන හිතුවක්කාරව ක්‍රියා කළ ආකාරයක් පසුගිය කාලයේ ඇතිවූ සිද්ධි ගණනාවක් පුරා දැකිය හැකියි. කටුනායක උද්ඝෝෂණය තුළ පොලිසියේ ක්‍රියාකාරිත්වය, ග්‍රීස් යක්කු පිළිබඳව ජනතාව තුළ ඇතිවූ විචිකිච්ඡාවේදී පොලිසියේ ක්‍රියා පටිපාටිය, දොම්පෙ පොලිසියට ගිනි තැබීමේ සිද්ධිය, මොරටුව පොලිස් මුර පොළ සිද්ධිය හා කොළොන්නාව සිද්ධිය ආදි විවිධ වූ සිද්ධීන් තුළ පොලිසිය ස්වාධීනව කටයුතු නොකරන බවට අධි චෝදනා සතර අතින් මේ වන විටද පැන නැගී ඇත. යුක්තිය පසිඳලීම පිළිබඳ ප්‍රශ්න ගණනාවක් මතුවී තිබේ. මාධ්‍ය දැඩි වාරණයකටද ලක්වෙමින් පවතී. නීතිපති දෙපාර්තමේන්තුවටද එල්ල වන චෝදනාවල නිමාවක් දැකිය නොහැකියි. අල්ලස් හා දූෂණ වලින් සමස්තයම පිරී පවතින බවක් පෙනේ.

එමනිසා නැවතත් 17 වෙනි සංශෝධනය ගැන විවෘත කතිකාවක් ඇතිවිය යුතුයි. රටේ සාමය හා නීතිය යළි ස්ථාපිත වීමට එය හේතුවක් නිසා ජනතා ව්‍යාපාර මේ සඳහා කඩිනම් විය යුතුය. දේශපාලන පක්ෂ භේදයෙන් තොරව රට තුළ ස්වාධීනත්වය ස්ථාපිත කරමින් නීතියේ ආධිපත්‍ය යළි පිහිටුවීමට ක්‍රියා කළ යුතුයි. එය අත්‍යාවශ්‍යයෙන්ම සිදුවිය යුතු බව මතක් කරන්නේ සමාජ ක්‍රමය නැතිවන තැනට ගමන් කිරීමට තවමත් ආධ්‍යාත්මයක් ඇති ජනයා තුළ පවතින දැඩි නොකැමැත්ත නිසාමයි.




## යහපත් දේශපාලන සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා

# සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනස් කරන්න

පළාත් පාලන ආයතන කිහිපයක් වෙනුවෙන් පැවැති මැතිවරණයක් නිමාවී තිබේ. මීට ඉහත පැවති මැතිවරණයන්ට සාපේක්ෂව මෙවර, මැතිවරණ දූෂණ හා ප්‍රචණ්ඩ ක්‍රියා අඩුවී ඇති බව පැවෙසතත්, සම්පූර්ණයෙන්ම සාමකාමී නිදහස් මැතිවරණයක් පැවතියේ යැයි කීම උගහටය. එකම පක්ෂයේ ආධාරකරුවන් දෙපිරිසක් අතර කොලොන්නාවේ දී ඇතිවූ සිද්ධියෙන් කිහිපදෙනෙකු ඝාතනයට ලක්වී තවත් පිරිසකට බරපතල තුවාල සිදුවිය. මෙම සිද්ධිය හා සමගම, දේශපාලනය හා පාතාලය අතර ඇති සමීප සම්බන්ධතාවය පිළිබඳ නොයෙක් අදහස් නැවත කරලියට පැමිණ තිබේ. මේ සිද්ධිය පිළිබඳව අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වා වරදකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒම අත්‍යවශ්‍යය. අතීතයේදී මෙන්ම මෙහිදී ද සත්‍යය සැඟවී යනු ඇතැයි යන සැකයක් ජනතාව තුළ පවතී. එය එසේ නොවිය යුතු බව අපි අවධාරණය කරමු.

පසුගිය වසර ගණනාවක් පුරා මේ රටේ සිදුවූ විවිධාකාර සිද්ධීන්ගෙන් විශද වන්නේ නීතියේ ආධිපත්‍යය ක්‍රමයෙන් බිඳ වැටෙමින් ඇති බවයි. විශේෂයෙන්ම ඇතැම් දේශපාලනඥයින් විසින් නීතිය සියතට ගෙන ක්‍රියා කිරීම හේතුවෙන් ද, නීතිය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් අපොහොසත් වීම නිසා ඇතැම් විට මහජනතාව නීතිය සියතට ගෙන ක්‍රියා කිරීමට පෙළඹීම නිසා ද, මේ තත්ත්වය උද්ගත වී තිබෙන බව අපගේ විශ්වාසයයි. එහෙයින්, නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරිම සඳහා කැපවීමෙන් සහ අවංකව ක්‍රියා කරන ලෙස අපි රජයෙන් සහ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට බැඳී සිටින සියලු අංශ වලින් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

1978 පසුව මැතිවරණ ප්‍රචණ්ඩත්වය සහ දූෂණ ක්‍රමයෙන් ඉහළ ගිය බව කවුරුත් පිළිගන්නා සත්‍යයකි. මේ සඳහා මූලික හේතුව වී ඇත්තේ සමානුපාතික ඡන්ද ක්‍රමය ඔස්සේ ගොඩ නැගුන අහිතකර දේශපාලනය සංස්කෘතියය යන්න අපේ විශ්වාසයයි. සමානුපාතික ඡන්ද ක්‍රමය විසින් ආසන සහ කොට්ඨාශ ක්‍රමය අහෝසි කොට දිස්ත්‍රික් ක්‍රමය ස්ථාපිත කළ අතර මනාප ක්‍රමය ද හඳුන්වා දෙන ලදී.

මුළු මහත් දිස්ත්‍රික්කය පුරා තම ප්‍රචාරක කටයුතු කිරීම සඳහා කෝටි ගණන් මුදල් වියදම් කිරීමට අපේක්ෂකයින්ට සිදුවී තිබේ. මේ අරබයා සිදුවන මුදල් නාස්තිය අති මහත්ය. මෙය බොහෝ දූෂණයන්ට මඟ පාදන බව කවුරුත් දන්නා රහසකි. මැතිවරණයට පෙර අපේක්ෂකයින් තම පෞද්ගලික වත්කම් ප්‍රකාශයන් මැතිවරණ කොමසාරිස් වරයා වෙත බාර දීම නීතියෙන් නියම කොට ඇතත්, එය ක්‍රියාත්මක නොවන බව ද කවුරුත් දනිති. මනාප ක්‍රමය හේතුවෙන් එකම පක්ෂයේ අපේක්ෂකයන් සහ ආධාරකරුවන් අතර ඇතිවන තරගකාරිත්වය, වෛරී දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කර ඇති අතර එමගින් මේ වන විට ජීවිත ගණනාවක් සහ දේපල විශාල ප්‍රමාණයක් විනාශ වී තිබේ. එමගින් පක්ෂ තුළ ගොඩ නගනු ලබන අභ්‍යන්තරික අර්බුද රටේ දේශපාලන ස්ථාවරත්වයට මෙන්ම සමාජ සංවර්ධනයට ද අහිතකර බලපෑම් එල්ල කරයි. දිස්ත්‍රික් ක්‍රමය විසින් ජනතා නියෝජිතයින් සහ ඡන්ද දායකයන් අතර තිබිය යුතු සමීප සබඳතාවය බිඳ දමා තම සේවය පිළිබඳ ජනතා වගකීමෙන් නියෝජිතයින් බොහෝ දුරට නිදහස් කර තිබෙන බවක් ද පෙනෙන්නට තිබේ. එසේම ඇතැම් ඡන්ද බල ප්‍රදේශ හා කොට්ඨාශ නියෝජනයට එකම පක්ෂයේ අපේක්ෂකයින් කිහිප දෙනෙකු ඉදිරිපත් කිරීම මඟින් ද මෙම මැතිවරණ ක්‍රියාදාමය සංකීර්ණ හා අර්බුදකාරී දෙයක් බවට පත්කොට ඇත.

මේ තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යාම දේශයේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන ප්‍රගතිය සහ අධ්‍යාත්මික හැදියාව සමපූර්ණයෙන්ම විනාශ කර දමනු ඇත. එම නිසා දැනට පවතින සමානුපාතික සහ මනාප ක්‍රමය වෙනස් කොට දේශයේ සංවර්ධනයට දායක විය හැකි ඡන්ද ක්‍රමයක් ස්ථාපිත කිරීම තව දුරටත් කල් නොදැමිය යුතු අවශ්‍යතාවයකැයි අපි මෙහි ලා අවධාරණය කරමු. මෙය සියලු දේශපාලන පක්ෂවල වගකීමක් වන අතර මේ සඳහා කඩිනම් පියවර ගැනීම පවතින රජයේ මූලික වගකීමකි. දේශයේ අනාගත අභිවෘද්ධිය උදෙසා මෙම වෙනස සිදුකිරීම සඳහා දේශපාලන නායකත්වයට බලපෑම් ඇති කිරීමට ඉදිරිපත් වන්නැයි මෙරට සිවිල් සහ ආගමික නායකත්වයෙන් අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

**කොළඹ අගරදගුරු පදවි කාලීන සිදුවීම් අධ්‍යයන කමිටුව**

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# දුක් කරදර බාධක මැද සුබ අස්නේ සාක්ෂිකරුවන් වන්න

## ගාලු රදගුරු හිමිපාණෝ සිරිගම්පලදී ප්‍රකාශ කරති



**ජීවිතයේ දුක වේදනාව තුළ හමුවන ක්‍රිස්තුන් වහන්සේව හඳුනාගෙන උන්වහන්සේගේ හඬට සවන් දී සැබෑ ක්‍රිස්තු අනුගාමිකයකුසේ සාක්ෂි දරන්නට ශුද්ධාත්මයාණෝ ඔබට සහය වන සේක. ඒ නිසා ඔබ ඉන්න විදිහටම ඉඳිමින් ශුද්ධාත්මයාණන් තුළ පූර්ණ වන්න. දුක වේදනාව තුළ හමුවන ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගන්න. ඒ ක්‍රිස්තුස් වහන්සේව අන් අයට හඳුන්වා දෙමින් ඔබ මෙන්ම අන් අයවත් ශුද්ධවත් කිරීමට සිතට ගන්න යැයි ගාලු රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ පැවසූහ.**

උන්වහන්සේ මේ අදහස් පළ කළේ පසුගියදා සලාපුර පදවියේ සිරිගම්පල මීසමේ දරුවන් 92 දෙනෙකුට අභිවෘද්ධි ආලේපයේ සක්‍රමේන්තුව දානය කිරීමේ මෙහෙයේදීය. රදගුරු හිමිපාණන්ගේ ප්‍රථම අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ මෙහෙය හා සලාපුර පදවියට උන්වහන්සේ සැපත් වන ප්‍රථම අවස්ථාව මෙය බැවින් මීසම් වාසින් අති උත්කර්ශවත් අන්දමින් උන්වහන්සේව පිළිගනු ලැබූහ.

දෙමටපිටිය මංසන්ධියේ සිට අලංකාර රථ පෙරහැරකින් උන්වහන්සේව දෙව්මැඳුර දක්වා කැඳවාගෙන ආ අතර සන්තානාපුර සා. ආනා තුමියගේ දේවස්ථානය අසල දී මීසම් සේවක ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමා ප්‍රමුඛ ආයක සභාව උන්වහන්සේව පිළිගත්හ.

මේ අවස්ථාවට ජුසේවාස් ලේකම් කාර්යාලයේ ගරු ඇලෙක්ස් දසනායක පියතුමා ද දිව්‍ය හෘදයේ අප ස්වාමිදුවගේ නිකායේ ශ්‍රේෂ්ඨ මව්තුමිය වන ගරු මාරිස්ටෙලා පැවිදි සොයුරිය ඇතුළු ගිහි පැවිදි විශාල පිරිසක් සහභාගී වූහ. මීසම් සේවක ගරු පියතුමා, සොයුරියන් හා දහම් ගුරු මණ්ඩලය ප්‍රමුඛ ආයක සභාව විසින් ගම් වාසින් හා එක්ව මෙය මනාව සංවිධානය කර තිබිණි.

ප්‍රසාද් නුවන්ත

## වැඩිහිටි දිනය උයනේදී සැමරේ

මොරටුව උයන ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරට අයත් ශු. ජුසේ මුනිඳුන්ගේ සහෝදර සමිතිය ලෝක වැඩිහිටි දිනයට සමගාමීව සංවිධානය කරන ලද උයන මීසම් සංඝයේ වැඩිහිටි දිනය පසුගියදා උයන දෙව්මැඳුරේ දී පවත්වන ලදි.

මීසමේ කොට්ඨාශ වලින් තෝරා ගන්නා ලද වැඩිහිටියන් හැට හය දෙනෙකු සමඟ මෙදින උදෑසන තුති පිදීමේ දේව මෙහෙය පවත්වන ලදි. ඉන් අනතුරුව වැඩිහිටියන් සඳහා උදෑසන ආහාරය සූදානම් කර තිබූ අතර හෝරා කිහිපයක් විනෝදයෙන් ගත කිරීමට ඔවුන්ට අවස්ථාව සලසා දී තිබුණි.

මීසමේ ජනතාව ඔවුන් සමඟ එක්ව ගීත ගායනා කරමින් සහභාගි වූ වැඩිහිටියන් සතුටු කිරීමට උනන්දු වීමත්, ඔවුන්ව ඇගයීමට ලක්කරමින් තිළිණ ලබාදීමත් සතුටට කරුණක් වන අතර මෙවන් කාලීන උත්සවයක් සංවිධානය කළ සහෝදර සමිතියටත්, ඔවුන්ට සහය දුන් මීසම් සේවක ගරු බර්ට්‍රම් රංජිත් පියතුමාටත් සහභාගි වූ වැඩිහිටියන්ගේ හෘදයාංගම ස්තූතිය හිමිවිය.

මාසලස් ජයන්ත



ලෝකයේ මරිය හමුදාව අරඹා වසර 90 ක් පිරීමේ සංවත්සරය නිමිති කොටගෙන හලාවත පදවි කොමිට්ෂියම් අධ්‍යක්ෂ ගරු ජුඩ් ඩයස් පියතුමාගේ හා කොමිට්ෂියම් නිළ මඬුල්ලේ සංවිධානයෙන් සංවත්සර තුති පිදීමේ දිව්‍ය යාගයක් හලාවත සුදසුන ශාලාවේදී, පවත්වන ලදි. මරිය හටයින් 400 කගේ පමණ සහභාගීත්වයෙන් පැවති මෙහිදී විසි පංති ජපමාලය උච්චාරණයෙන් අනතුරුව හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දිව්‍ය පූජා යාගය සිදුකරන ලදි.

කොකුම් වාසනා ජයරුවන් ප්‍රනාන්දු

## මහනුවර රදගුරු හිමිපාණෝ කටුගස්තොට මීසම බැහැදකිති

එදා කිතුනු ජනතාව තම ජීවිතය පූජා කළාසේ අද අප සියලුම දෙනා අත්වැල් බැඳගෙන ඉරිදා දිව්‍ය පූජාවට කැපවීමෙන් යුතුව පැමිණිය යුතුයි. දේව වචනය ගැන ලොකු පිපාසයක් අපගේ හදවත් තුළ ඇති කරගත යුතුයි. “මා මෙතනින් යනවිට ඉතාමත් සන්තෝසයෙන් යන්නේ. මට පේනවා කටුගස්තොට ජනතාව දේවස්ථානය වටා එක්රොක් වී සිටින ආකාරය. එය මගේ එකම සැනසිල්ල” යැයි මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණෝ කටුගස්තොට ශ්‍රී හෘදයේ දේවස්ථානය බැහැදැකීමට පැමිණි අවස්ථාවේදී ප්‍රකාශ කළහ.

කටුගස්තොට මීසමේ සියලුම සමිති සමාගම් වල ක්‍රියා කලාප සමාලෝචනය කළ අතර එහිදී එතුමා කියා සිටියේ තව තවත් එක්වී ක්‍රියා කළහොත් කටුගස්තොට මීසම ඉතාමත් දියුණු තත්ත්වයට පත්වනු ඒකාන්ත බවත්, එතුමාගේ එකම ප්‍රාර්ථනාව එය බවත්ය.

මීසම් සේවක ගරු මයිකල් සන්දනම් පියතුමා මීසමේ 'සෑම වැඩකටයුත්තක්ම ඉතා කැපවීමකින් සහ සැලසුම් සහගත අන්දමට කිරීම ගැන රදගුරු හිමි සුබ පැතීය.

ශාන්ති ජම්බුගේ



පසුගිය සුනාමි රළ පහර පමුණුගම ඇලෙන්එගෙ ාඩ මුහුදේ ගොඩට ගලා නැවතුන ස්ථානයේ ප්‍රදේශයේ දේව ජනතාව විසින් ඔවුන් මුදවාගත් ග්‍රාමරාක්ෂක ශු. ජුසේ මුනිඳුන්ට උපහාරයක් වශයෙන් ගොඩනැගූ ශු. ජුසේ මුනිඳුන්ගේ විශේෂ සිහිවටන පීඨකයේ වාර්ෂිකව පවත්වන තුතිදීමේ විශේෂ දිව්‍ය පූජා යාගය මෙවර පමුණුගම මීසම් සහයක ගරු නිරෝෂන් මංජුල ප්‍රනාන්දු පියතුමන් විසින් පවත්වන ලදී. දිව්‍ය යාගයට ප්‍රතම ඉටිපහන් පෙරහැරින් ශු. ජුසේ මුනි ප්‍රතිමාව පූජා මණ්ඩපයට රැගෙන ආවේ අසාධ්‍ය රෝගයකින් පෙලී සිට ශු. ජුසේ මුනිඳුන්ගේ මැදහත් කමින් සුවය ලබාගත් ප්‍රදේශයේ සැදැහැවතකු විසිනි.

සටහන - ජෝ සංගපාලආරච්චි, සේයා - උපාලි කරුණානායක

# 75 ජයන්තිය අදූ සමරණ වේවැල්වත්ත සා. අන්තෝනි මුනි දෙව්මැඳුර

රත්නපුර පදවියේ ලාබාල තම ගලබඩ මීසමේ වේවැල්වත්ත සා. අන්තෝනි මුනි දෙව්මැඳුරේ හැත්තෑපස්වන ජයන්ති සංවත්සරය උත්කර්ෂවත් අන්දමින් අද පැවැත්වේ. රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්‍ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.00 ට ජයන්ති මංගලෝත්සව දේව මෙහෙය පැවැත්වේ.



පුදබිමක අසිරිය

1936 දී වේවැල්වත්ත ප්‍රදේශයේ ව්‍යාපාරික කටයුතුවල නියැලුන, සියනෑකෝරලයේ තරාල නිජබිම කරගත් රේන්ද මහත්යා නමින් ප්‍රකටව සිටි ඉසකියස් ස ම ර තු ං ග මහතා තම කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් අක්කරයක පමණ භූමි භාගයක් සුදුවර අන්තෝනි මුනිවරයා නමින් දෙව්මැඳුරක් ඉදිකිරීමට සඳහා පරිත්‍යාග කර ඇත. අසාධ්‍ය තත්ත්වයෙන් පසුවූ තම පුතනුවන්ගේ ප්‍රාතිහාර්යාත්මක සුවවීම නිමිති කොටගෙන වූ ජේ. අල්ගම මහතාද ආයක වූ බවත් පැරැන්නෝ පවසති. දෙව්මැඳුරු පරිශ්‍රයේ පිහිටි ප්‍රාතිහාර්යාත්මක ළිඳ නිසා රෝග සුවවීම හේතුකොට ගෙන ඉමහත් ප්‍රසිද්ධියට පත්ව ඇත. මෙම වේවැල්වත්ත කිතුනු සංඝයේ අති බහුතරය අල්ගම හා සමරතුංග පරම්පරාවෙන් පැවැතෙන්නෝ වෙති.

වේවැල්වත්ත ගාල්ල රදගුරු පදවියට අයත් වූ නිසා එවක ගාල්ල රදගුරු අතිඋතුම් එන්. එම්. ලව්ඩාඩියෝ ජේ. න්. හිමිපාණන්ගේ ආශිර්වාදය මත රත්නපුර මීසම් සේවකව සිටි ගරු එල්. මැල්සිංඤනෝ සහ බලංගොඩ මීසම් සේවක ගරු පෙසා ජේ.නි. පියතුමන්ගේ සහභාගිත්වයෙන් දෙව්මැඳුර 1936 ඉදිවූ බව කියැවේ. මෙහි විශේෂත්වය වන්නේ එදා 1929 සිට 1933 දක්වා රත්නපුර මීසම්පතිව සිටි ගරු එන්. එම්. ලව්ඩාඩියෝ ජේ.නි පියතුමා ගාල්ල රදගුරු හිමිපාණන් ලෙස පත්වීමත් උන්වහන්සේගේ අවසාන මීසම් බලප්‍රදේශයේ දෙව්මැඳුරක් ඉදිකිරීමට රදගුරුවරය ලැබ වසරක් ඇතුළත අනුමතිය දීමත්ය. 2010 ඔක්තෝබර් මස රත්නපුර මීසම් සේවක ගරු රංජන්මාල් මොරායස් පියතුමා ජුබිලි වසර ප්‍රකාශයට පත් කළේය. ගලබඩ මීසම් සේවක ගරු නිරෝෂන් වාස් පියතුමාගේ සැලසුම් අනුව වේවැල්වත්ත 75 ජයන්ති උලෙළ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

තියබෝල්ඩ් සමරතුංග

## දිව බොදුන් ලබනා ළමුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමක්!

මතුගම මීසමේ ප්‍රථමවරට දිව බොදුන් ලබනා ළමුන්ගේ දෙමාපියන් වෙනුවෙන් විශේෂ වැඩසටහනක් මතුගම මිදීමේ අප ස්වාමිදු දෙව්මැඳුරේදී පැවැත්වුණි.

මහාචාර්ය ඇන්ටන් මීමන මහතා මෙහෙයවූ මේ වැඩසටහනේදී දරුවන් පිළිබඳව විශේෂ අවධානයක් දෙමාපියන් යොමුකළ යුතු බවත්, තම දිවි පෙවෙත ළමුන්ට ආදර්ශවත්ව ගත කළ යුතු බවත්, ළමුන්ගේ හැසිරීම හා ක්‍රියාකාරකම් පිළිබඳවත් වැඩි අවධානයක් යොමුකළ යුතු බවත් පැවසීය. දෙමාපියන්ටද ළමුන් දිව බොදුන් ලබාගැනීමේ වැදගත්කම හා විශේෂත්වය වඩාත් පසක් කර දීම සඳහා මතුගම මීසම් සේවක ගරු දෙව්ෂාන් අසංක පියතුමන්ගේ අදහසකට අනුව මෙය සංවිධානය කරතිබිණි.

කුමර



හලාවත පදවියේ ඉතා දුෂ්කර මීසමක් වන කරුවල ගස්වැව මීසමේ එගොඩපිටිය ශු. ජපමාල දේවමාතා වහන්සේගේ දෙවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා සිදුකෙරිණි. වෙන්නප්පුව මීසම් වාසි ජනතාවගේ සංවිධානයෙන් මෙහිදි මංගල දිව්‍ය පූජා යාගය සිදුකැරිණ. කරුවලගස්වැව මීසම් සේවක ගරු සමන්ත කිත්සිරි පියතුමා දේවමාතා ප්‍රතිමාව ප්‍රදර්ශනය කළ අයුරු.

සටහන - ප්‍රියන්ත පීටර්ස්
සේයා - ජේ. කේ. මයිකල් පෙරේරා

කිතුනු ජීවිතයේ කේන්ද්‍රස්ථානය හා මුදුන් මල්කඩ විය යුත්තේ ද අපගේ අධ්‍යාත්මික භෝජනය විය යුත්තේ ද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේමයි. අපගේ ආධ්‍යාත්මික ජීවිතයේ සමීපතම වූ ජීවමාන වස්තුව පීඩනයට පත් මිනිසා තුළින් අපට ක්‍රිස්තුන් වහන්සේ දැකිය හැකි නම්, හමුවිය හැකිනම් පිළිගත හැකිනම් දෙවිඳුන් අප වෙනුවෙන් කරනු ලැබූ කැඳවීම ඵලබර වනු ඇත. තම සේවාවන් නිසිලෙස වටහාගෙන එයට ජීවිතයේ පැවැත්ම පැවතිය යුත්තේ ද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළයි.

නූතන සමාජ අවශ්‍යතාවන්හිදී කිතුනු සාංඝිකත්වය වඩාත් අවශ්‍යය වනු ඇත. සමාජය තුළ පවතින දරිද්‍රතාවය, ක්‍රමයකි. ජීවන මාර්ගයකි. දිව්‍ය සත්ප්‍රසාදීය පිළිවෙත් අන්තර්ගතවන දිව්‍ය පූජාව ද කිතුනු ජීවිතයට අත්‍යවශ්‍යවන අධ්‍යාත්මික පිළිවෙතකි.

කිතුනු ජනවන්දනාව තුළ දිව්‍ය පූජාවට හිමිවන්නේ ඉහළම ප්‍රමුඛත්වයකි.

# දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයක් කරා...

වන්නේ ද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යයි කීවොත් එය නිවැරදි ය. දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් තම ජීවිතයම කර ගත හැකි නම් එය කොතරම් භාග්‍යයක් ද? දිව්‍ය සත්ප්‍රසාද භෝජනය යනු ආධ්‍යාත්මික වූ දේව ආදරය යන්න අර්ථ කථනය කිරීමේ ද වරදක් නැත. කල්වාරිය මත තම ජීවිතය පුද දෙනු පෙර රාත්‍රියේ දී, අප සමිඳාණන් වහන්සේ මේ උතුම් වූ භෝජනය අප වෙනුවෙන්ම ස්ථාපිත කළේ මනුෂ්‍යා සඳහාම වූ දේව ආදරය ප්‍රකාශ කිරීමේ සංකේතයක් ලෙසිනි. එදා සිට අද දක්වා මේ ජීවමාන ප්‍රාතිහාර්යය දිව්‍ය පූජාව තුළ සිදුවීමේ දී අප සිහිපත් කළ යුත්තේ අප ස්වාමින් වහන්සේගේ ජීවිතයේ සාංඝික බවයි. සකල මනුෂ්‍යා වෙනුවෙන් තම ජීවිතය පූජා කළ අප සමිඳාණෝ මරණින් පසුවද තම අවසාන ලේ බිඳුවත් මනුෂ්‍යයා වෙනුවෙන්ම වැය කළේ මනුෂ්‍ය ජීවිතය ද අරුත් ගන්වමිනි. එනම් "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබ ද එකිනෙකාට ප්‍රේම කරන්න" යන්න සිහිපත් කරවමිනි. දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් තුළින් අප අත් දැකිය යුතු වන්නේ ද කිතු සමිඳුන්ගේ ඒ උතුම් වූ ආදරයයි. ඔවුන් වහන්සේගේ ජීවිතයේ සාංඝික බවයි. එකිනෙකා වෙනුවෙන් වැය වෙන්නට, කැප වෙන්නට, කැඩෙන්නට, බිඳෙන්නට, රිදෙන්නට, පූජා වෙන්නට හා පරිත්‍යාගී වන්නට අප පොළොඹවන්නේ ද මේ උතුම් වූ දේව ආදරයයි. දිව්‍ය සත්ප්‍රසාදය තුළින් අප ලබනා පෝෂණයයි. ලොව උපදින සැම මිනිස් හදවතක් තුළම මේ දේව ආදරයේ බීජය දෙවිඳුන් විසින් රෝපණය කරනු ලබන්නේ මවු කුස තුළදීම ය. එය පෝෂණය කරනු ලබන්නේ ත්‍රිත්වයික දෙවිඳුන් විසිනි. අප අන්‍යයන් වෙනුවෙන් සාංඝික වන්නේ නම්, සාංඝික විය යුතු නම්, සාංඝික වන්නට කැමැත්තේ නම් අප දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයක් ගත කළ යුතු වෙමු. ඔවුන් වහන්සේ හා නිරන්තර සබඳතාවයක් පවත්වා ගත යුතු වෙමු. එවිට ඔවුන් වහන්සේ සැම යහපත කරාම අප යොමු කරවන සේක. මෙහෙයවනු ලබන සේක. පවුල තුළ සමාජය තුළ, මීසම තුළ අපගේ වගකීම හා යුතුකම ඉටුකළ යුතු වෙමු. පවුල තුළ, සමාජය තුළ, මීසම තුළ වැය වෙන්නට, කැප වෙන්නට, දිය වෙන්නට, කැඩෙන්නට, බිඳෙන්නට, පූජාවෙන්නට හා පරිත්‍යාගී වෙන්නට කිතුනු අපට බොහෝ අවස්ථා උදා වනු ඇත. ඒ සඳහා වූ ගිහි අපෝස්තලික සේවාවන් ද අප මීසම් තුළ බිහිව ඇත. මේ හැම සේවාවක් තුළම තම කැඳවීම අනුව පූජාවීමක් ද ඇත. ගිහි අපෝස්තලික සේවාව ද දේව කැඳවීමකි. දරිද්‍රතාවයට, අසහනයට, සම්බන්ධ විය යුතුය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අපගේ පැවැත්ම කරගත යුතු වන්නේ එහෙයිනි. වෙනත් කිසිවෙකු හෝ කිසිවක් තුළ අප නොපැවතිය යුතු වෙමු.

ධනය, බලය, මානය, උගත්කම ආදී සියලු ලෞකිකත්වයන් දෙවිඳුන් ඉදිරියේ අළු දූවිල්ලක් තරම්වත් නොවටිනාබව අප සිහිතබා ගත යුතුය. ඇපවීමේ, කැපවීමේ, පූජා වීමේ හා පරිත්‍යාගී වීමේ



ජීවිතය දෙවිඳුන් ප්‍රිය කරනු ලබයි. දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් අප ජීවිතයට, අප හදවත් වලට සම්බන්ධ වන සැම මොහොතක දීම අප ඔවුන් වහන්සේ ආදරයෙන් වැළඳගත යුතු වෙමු. ඒ යහපත කරා අප මෙහෙයවන පරාර්ථය කරා අප යොමු කරවන එකම බලය, එකම ශක්තිය දිව්‍ය සත්ප්‍රසාදිය සමිඳුන් වන හෙයිනි. කිතුනු හිංසනය, පීඩනය, අසහනය, අසාධාරණය හමුවේ කිතුනු වගකීම වටහාගත යුතු වෙමු. හැකි තරමින් දායක විය යුතුවෙමු. මේ සඳහා සංවේදී වන්නට, කැප වෙන්නට, වැය වෙන්නට, කැඩෙන්නට පූජා වෙන්නට අවස්ථාවන් සමාජය තුළ අපට හමුවනු ඇත.

කිසිදු භේදයකින් තොරව අපගේ දයාවේ දෑත් ඔවුන් වෙත දිගු කළ යුතු වෙමු. ජාතිය, කුලය, ආගම, උස් පහත් භේද බාධාවක් කර නොගත යුතුය. පවුල තුළ, ගම තුළ, වැඩපළේ කාර්යාලයේ දී අපට මේ සඳහා දායක විය හැකිය. ඒ ක්‍රිස්තු ප්‍රේමය පෙරදැරි කරගෙන ය. දිව්‍ය සත්ප්‍රසාදය තුළ වූ ජීවමාන ක්‍රිස්තුන් වහන්සේගේ ආදරය අන් අය වෙත යොමු කළ හැක්කේ ද, අප ජීවිත තුළ අත්දැකිය හැකි වන්නේ ද එකිනෙකාගේ අවශ්‍යතාවන් වෙනුවෙන් අප වැය වුණොත් පමණි. කැපවුවහොත් පමණි. පූජාවූවොත් පමණි. පූප කැඩීමෙන් හා මිදි රස බෙදා ගැනීමෙන් සංකේතවත් කළේ ද මේ ක්‍රිස්තු සාංඝිකත්වයම යි. අප ජීවිතයන්හි අධ්‍යාත්මික පූර්ණභාවය අත්කර ගත හැකි වන්නේ ද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළිනි. එකිනෙකා කෙරෙහි දක්වන ආදරය, කරුණාව, දයාව මෙන්ම පරිත්‍යාගී වීම හා පූජා වීම ද මේ සඳහා අවශ්‍ය වනු ඇත. දිව්‍ය සත්ප්‍රසාදය යනු පූප කැඩීමේ හා බෙදා ගැනීමේ හුදු පිළිවෙතක් පමණක් නොව තම ජීවිත ක්‍රියාකාරිත්වය තුළින් ද පෙන්නුම් කළ යුතු ජීවිත දෙවිඳුන්ට දිය හැකි නමස්කාරය, ප්‍රශංසාව, වන්දනාව, ස්තෝත්‍ර පිදීම හා උතුම් වූ ගෞරවය දිව්‍ය පූජාවට ඇතුළත්ව ඇත. ඉමහත් ගෞරවයකින් හා භක්තියකින් යුතුව අප දිව්‍ය පූජාවට සහභාගි විය යුතුය. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයත්, ශ්‍රී රුධිරයත් ජීවමානව අප මධ්‍යයට වැඩම කරන සුවිශේෂී අවස්ථාව දිව්‍ය පූජාවේ ඇතුළත්වන බැවින් කිතුනු අප ලද අමිල තිළිණය වන්නේ ද දිව්‍ය පූජාවයි. සුදෝ සුදු පූපයක් තුළ, අප වෙනුවෙන් සිරගතව සිටින ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ හමුවිය හැක්කේ ද දිව්‍ය පූජාව තුළිනි. දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයක් කරා යොමු වීමේ දී මෙම ආධ්‍යාත්මික වන්දනා පිළිවෙත ද අපගේ ජීවිතයට අත්‍යවශ්‍යම වනු ඇත. මහ බ්‍රහස්පතින්දා පූප කැඩීමේ හා බෙදා ගැනීමේ පිළිවෙතත්, කල්වාරියේ ජීවිත පූජාවත් එකවිට සිහිපත් කෙරෙන මේ ජීවමාන ප්‍රාතිහාර්යාත්මක මොහොත තුළ අප සිහිපත් කළ යුත්තේ ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් ගත කළ, වැය කළ, කැප කළ සාංඝික ජීවිතයයි. ඔවුන් වහන්සේගේ පූජා වීමයි. අප ස්වාමින් වහන්සේගේ ප්‍රේමයේ පණිවුඩය තුළ ඇති මේ උතුම් වූ පූජාවීම අප ජීවිතයන් ද අත් නොදකින්නේ නම් අපට ඔවුන් වහන්සේ හා බද්ද වීමක් ද නැත. ඇසුරක් ද නැත. මිත්‍රත්වයක් හෝ සහෝදරකමක් ද ඇතිවිය නොහැකිය. එතෙර වීමක් හෝ නැවත හැරී ඒමක් ද නැත. ජීවිත වෙනස්වීමක් ද ඇති කරගත නොහැකිය. ක්‍රිස්තුන් වහන්සේ හා බද්දවීම නොහොත් ඔවුන් වහන්සේ තුළ ජීවත්වීම කොතරම් වැදගත් ද, කොතරම් භාග්‍යයක් ද යන්න ඔවුන් වහන්සේගේ වචන වලින්ම පැහැදිලි කර දී ඇත.

"මිදි වැල මමය. ඔබ අතුය. යමෙක් මා තුළ සිටින්නේ ද, මම ඔහු තුළ සිටිම් ද. ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මන්ද මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට ඔබට නොහැකිය" (ජොහාන් 15:4)

අප ස්වාමින් වහන්සේගේ මේ උතුම් වූ වචන අප හදවත් හි නිධන්කර ගත යුතු වෙමු. අප ජීවිතයන්හි වෙනස්වීම, ඵල දැරීම සිදුවිය යුතුවන්නේ ඔවුන් වහන්සේ තුළ ජීවත්වීම තුළයි. එමෙන්ම අපගේ ජීවිත දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයක් කරා යොමු කිරීමේ දී නිරන්තර යාච්ඤාව ද අත්‍යවශ්‍යය. සැමවිට දෙවිඳුන් තුළ, දෙවිඳුන් වෙත, දෙවිඳුන් කරා යොමුවිය යුතුය. දෙවිඳුන් හා සංවාදය. සමීප සම්බන්ධතාවය ගොඩනගා ගත යුතුය. ඔවුන් වහන්සේ හා කතා කළ යුතුය.

**රංජිත් නෝනිස්**

## නිවහන ඒ ලෝකෙ අපේ

ජීවත්වෙන සුළු කාලෙට
දුව පැන නට කර ජරමර
ආශා මිල මුදල් හනික
ගොඩ ලොකු කර ගන්නට හැම
දරනා මේ බොරු වීරිය - අනේ පව්!

නොකා නොබී උදව් නොකොට
තනියම ජීවත් වෙන කොට
දෙවි දහමින් ඈත් වෙලා
මලකඩ යන්තර වීලා
තනනා බොරු දිව්‍ය ලෝක - අනේ පව්!

මේ ලොව හැර යන දින ගැන
ලෙඩ දුක සුදු කෙස් රැළි හම
අපට මතක් කර දෙන විට
හැමදාට ම ඉන්න වගේ
කරනා මළ විකාරයත් - අනේ පව්!

කෙදිනක හෝ ඉපිද මෙලොව
කෙදිනක හෝ ඉන් සමුගෙන
අයිති ලොවට අපි ගිය දා
හර - බැර ගනුදෙනුව අපේ
ඒ ලෝකෙදි විසඳෙනවා

කාටත් බෑ අරන් යන්න
කිසිම කෙනෙක් - කිසිම දෙයක්
හිස් අතින් ම ආ විදියට
හිස් අතින් ම යනව මිසක්
නිවහන ඒ ලෝකෙ අපේ

**ගරු තිලකසිරි ප්‍රනාන්දු**
**පැ.තු. නි සොයුරු** - රෝමයේ සිට

**කතෝලික ලිත් වර්ෂය සඳහා පිළියෙල කර තිබෙන දින දර්ශනය අනුව කුඩා තෙරේසා මුනිවරියගේ මංගල්‍යය 2011 ඔක්තෝබර් මස 1 වන දිනට යෙදුනි.**

ජේසු සමිඳුන්ගේ කුඩා මල වූ තෙරේසා තුමියට කැප කළ දේවස්ථාන 15 ක් ශ්‍රී ලංකාවේ ඇත.

සංස්කෘතිය හා සභා පිළිවෙත් පිළිබඳ ජාතික කොමිසම විසින් නිර්දේශ කර තිබෙන ප්‍රකාර මෙම ගරු ගාම්භීරව ඔක්තෝබර් මස 1 වන ඉරුදින හෝ 2 වන ඉරුදින පැවැත්වේ. අති උත්තම xi පියුස් පාප් වහන්සේ විසින් ජේසු සමිඳුන්ගේ කුඩා මල වූ තෙරේසා තුමියව 1925 මැයි මස 17 වන දින දී, 60,000 ක ජනතාවක් ඉදිරියේ, රෝමයේ සා. පීතර බැසිලිකාවේ දී ශුද්ධවරයට ඔසවන ලදි.

උන්වහන්සේගේ දේශනය අවසන් කරනවාත් සමඟම සා. පීතර බැසිලිකාවේ ගෝලාකාර මුදුන සරසා තිබූ කෘතිම රෝසමල් 5 ක් සැබෑ රෝසමල් බවට පරිවර්තනය වී ශුද්ධෝත්තම පියතුමාගේ පාමුලට වැටුන බැව් වාර්තා වී ඇත. එවිට රැස්වී සිටි ජනතාව අතර ත්‍රාසයක් ඇති විය. දේවස්ථානය ඇතුළත හා පිටත සිටි ජනතාව දේව ප්‍රශංසා ගයන්නට පටන් ගත් හ. දැනට භාග්‍යවරයට ඔසවා සිටින xi පියුස් ශුද්ධෝත්තම පියතුමාගේ ක්‍රියාවලිය දෙවි පියාණන් වහන්සේ ද අනුමත කළ බැව් මෙම ප්‍රාතිහාර්යයෙන් තහවුරු වේ.

කුඩා තෙරේසා තුමිය ශුද්ධවන්ත භාවයට ඔසවන විට සිදුවූ ප්‍රාතිහාර්ය ප්‍රසිද්ධ වීම නිසා එදින සවස්වන විට 500,000 අධික වන්දනාකරුවන් පිරිසක්, රෝමයේ

# ජේසුගේ කුඩා මල වන ශු. තෙරේසා මුනිවරිය



**ඩබ්. ජේ. එම්. ෆීලික්ස් සෝවිස් විසිනි**

සා. පීතර දෙව් විමනට එක් රොක් වූහ. සාන්තුවරයට ඔසවන අවස්ථාවේ දී පවත්වන ලද දේශනයේ දී ශුද්ධෝත්තම පියතුමා "අළුත් තෙරේසා තුමිය, සුපුවත පහදා දීමට මහත් වෙහෙසක් දැරූ අතර එදිනෙදා ජීවිතයේ තම වචනයෙන් හා ක්‍රියාවෙන් එහි උපදෙස් ක්‍රියාවට නංවන ලදි.

ආත්මික ළදරු භාවය, වචනයෙන් හා ආදර්ශයෙන් ආධුනික පැවිදි සොහොයුරියන්ට ඉගැන්වූ අතර එතුමිය අපට ඉතිරිකර තිබෙන ලිඛිත සාක්ෂි වලින් මුළු ලොවටම එය එළිදරව් කර ඇත. "ආත්මයක කථාව" මුළු ලොවටම බෙදා හැර ඇති අතර එය කියවීමෙන් යහපත් ප්‍රතිඵල ඇත්වනු ඇත."

"ආත්මික ළදරු භාවයට ඇතුළාන්තය පත් කිරීමට, එතුමිය පෙන්වා දී ඇති ක්‍රමය අනුගමනය කිරීම සඳහා සියලුම සැදැහැවතුන් එතුමියගේ ජීවිතය අධ්‍යයනය කළ යුතු බැව් ද "ඔබ වෙනස් වී කුඩා දරුවකු වගේ නුනොත් ස්වර්ග රාජ්‍යයට ඇතුළුවිය නොහැකිය" යන මතෙව් 18:2 සඳහන් ජේසු සමිඳුන්ගේ වචන ද සඳහන් කරමින්, උන්වහන්සේගේ දේශනය අවසන් කරන ලදි.

1927 දෙසැම්බර් මස 14 වන දින, ජේසු සමිඳුන්ගේ කුඩා මල වූ තෙරේසා මුනිවරියට ධර්මදූත කටයුතුවල ආරක්ෂක ශුද්ධවන්තිය ලෙස ද එතුමිය සා. ප්‍රැන්සිස් සේවියර් තුමාගේ තත්ත්වයට සමාන බැව් ද, xi වන පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

දැනට අවුරුදු 85 පෙර කලුඑළිය ග්‍රාමයේ සමාජ ප්‍රශ්න දේවස්ථානයේ කටයුතු වල දී වගකීම් භාර ගැනීමට හා ජනතාව වෙනුවෙන් රජයට හඬක් නැගීමට කිසිම සංවිධානයක් තිබී නැත. දුප්පත් කෙනෙක් නැසීගිය අවස්ථාවක, ඔහුගේ අවසාන කටයුතු කිරීමට අනිත් අයගෙන් මුදල් එකතු කිරීමට සිදුවිය. ග්‍රාමයේ එවකට තිබූ එම තත්ත්වය දුටු කලුඑළිය සා. තෙරේසා මහජන සභාවේ ආරම්භක සාමාජිකයින් වන නැසීගිය, නීතිඥ ඕ. ඇම්. පෙරේරා ඇතුළු පිරිස මෙම ප්‍රශ්න වලට විසඳුම් අඩංගු කර ව්‍යවස්ථාවත් 1925 වර්ෂයේ දී පිළියෙල කළහ. එම අවස්ථාවේ ප්‍රධාන අරමුණ වූයේ ග්‍රාමීය ජනතාවගේ ආත්මික හා ශාරීරික අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමය. ව්‍යවස්ථාව පිළියෙල කිරීම අවසන් වීමෙන් පසු යෝජිත සංවිධානයට කුමන නමක් තිබිය යුතු ද යන ප්‍රශ්නය සාකච්ඡා කරමින් සිටිය දී 1925 මැයි මස 17 වන දින රෝම පුරවරයේ සිදු වූ සුවිශේෂ සිද්ධියක් නිසා ප්‍රශ්නයට විසඳුමක් ලැබිණ. මෙදින xi වන පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් ජේසු සමිඳුන්ගේ කුඩා මල වූ තෙරේසා තුමිය ශුද්ධවන්ත භාවයට, ඔසවනු ලැබුවා ය.

උන්වහන්සේගේ දේශනය අවසන් කරනවාත් සමඟ, සා. පීතර දෙව්විමනේ සිදුවූ ප්‍රාතිහාර්ය ඔවුන්ට දැනගන්නට ලැබිණ. තෙරේසා යන නාමය අතිශයින් ජනප්‍රිය විය. එම නිසා අපගේ ආරම්භක සාමාජිකයෝ තෙරේසා යන ඒ උතුම් නාමය ඔවුන්ගේ සංවිධානයට තබා, එතුමියගේ රැකවරණයට එය භාරකර 1926 සැප්තැම්බර් මස කටයුතු ආරම්භ කළහ.

තෙරේසා තුමියගේ ආදර දෙමාපියන් වන ලුවිස් මාටින් තුමා හා සේලි ශූරින් තුමිය, xvi බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා විසින්, දැන් භාග්‍යවරයට ඔසවා ඇත. තෙරේසා තුමියගේ සීයා හා ආච්චි හා පරපුර ද ආදර්ශමත් කතෝලිකයෝ ය. වර්ෂයකට වතාවක් කළ එළියේ පවත්වන කුඩා තෙරේසා මුනිවරියගේ මංගල්‍යය අවස්ථාවේ මෙම ශුද්ධවූ පවුල පිළිබඳ කතෝලික ජනතාව දැනුවත් කිරීමට දැනට වඩා වැඩි කාලයක් ලබා දීම සුදුසු බව පෙනේ.

ජන වන්දනාව

# මතු පැමිණෙන සදා ජීවිතය බලාපොරොත්තු වෙමු

**"හමුවේ දිනක ඒ ලස්සන ලොවෙහි අප, හමුවේ දිනක ඔබ හා මා හා එතැන..."**

යන ගීතිකාව අපගේ සවන් ගත වූ කල් හි සිහිපත් වනුයේ මරණය පිළිබඳ අත්දැකීමකි. "මරණය" වනාහි මෙලොව ඉපදෙන කා හට වූවත් පොදු ධර්මතාවයකි. සෑම ධර්මයකම මරණය පිළිබඳව විවිධ වූ ඉගැන්වීම් හා නිර්වචන ඉදිරිපත් කොට ඇත. කිතුනු ධර්මයට හා කිතුනු විශ්වාසය දෙස විමසා බැලීමේ දී මරණය වනාහි දුකක්, වෙන්වීමක්, පරාජයක්, සංවේගයක්. නොව එය විජයග්‍රහණයකි.



ලෝකාරම්භයේ දී පළමු මිනිසා හා ස්ත්‍රිය ද වන ආදම් සහ ඒවගේ අකීකරුකම හා උඩඟුවේ ආදීන බවේ ප්‍රතිඵලය වූයේ මරණයයි. දේව වන්දනා වසරේ ඉල් මාසය හෙවත් නොවැම්බරයේ දේව ජනතාවක් ලෙස අප, අපට පෙර දෙවිඳුන් හමුවට ගිය විශ්වාසයේ තිළිණය අපට දායාද කරදුන් අපගේ ආදර දෙමාපියන්, නෑදෑ හිත මිතුරන් ආදරයෙන් සමරමු. ඔවුන් උදෙසා යාච්ඤා කරමු. මෙහි දී කිතුනුවාගේ මරණය, සෙසු ධර්මයන් හා සසඳන කල, දුකක්, වේදනාවක්, සංතාපයක්, සංවේගයක්, වෙන්වීමක්. නොවන්නේ ය.

කිතුනුවාගේ මරණය ක්‍රිස්තු උත්ථානය තුළ සන්නද්ධ වූවකි. මෙහි දී නොවැම්බරය හෙවත් ඉල් මාසයේ දී අපට පෙර දෙවිඳුන් තුළ සැතපුනා වූ ද, අපට පෙර දෙවිඳුන් හමුවට ගිය විශ්වාසකයින් උදෙසා අපි දානධර්ම දෙමු, දිව්‍ය පූජාවන් පවත්වමු, සුසාන භූමි ශුද්ධ පවිත්‍ර කරමු. මෙහි දී කතෝලික සුසාන භූමියක් වනාහි අපවිත්‍ර, අශුද්ධ ස්ථානයක් නොව, එය ශුද්ධවූ ස්ථානයකි. වන්දනා හා පිදුම් ලබන හා කරන ස්ථානයකි. එය බොහෝ විට දේවස්ථානයක් යාබදව පැවතීම බෙහෙවින් ම උචිත ය. මන්ද අපට පෙර විශ්වාසයේ දේව තිළිණයන් හා අපට විශ්වාසය තිළිණ කළා වූ සැදැහැවතුන් ස්වාමින් වහන්සේගේ දෙවන පැමිණීම තෙක් එහි සමාදානයේ සැතපී සිටිති. ඔවුහු ද අපගේ වන්දනාවට, ප්‍රශංසාවට හවුල් වෙති. උදාහරණ ලෙස දිව්‍ය පූජාව තුළ මළාවූ සියල්ලන් ද ඊට සම්බන්ධ වෙති. සහභාගි වෙති.

කිතුනුවාගේ මරණය වනාහි ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය මත රඳා පවතී. ඔවුන් වහන්සේ උත්ථානය වූයේ යම් සේ ද, කිතුනුවා ද ඔවුන් වහන්සේගේ විජයග්‍රාහී උත්ථානයේ කොටස්කරුවෝ වන්නාහ. මරණින් පසුව ශරීරය හා ආත්මය වෙන්ව යයි. දුබල ශරීරය මෙහි දී දිරාපත් වේ. එය ලෝක ධර්මතාවයයි. එනමුදු ආත්මය සදා පවතියි. යම් දිනක ශරීරයේ ආත්මය නැවත පොදු විනිශ්චය දවසේ දී එක්වන්නේ ය. (ජොහාන් 5:28-29, මතෙව් 25:31-46). මරණය වනාහි පාපයේ ප්‍රතිඵලය හා විපාකයයි. මරණින් පසුව පව් හා පින් හෙවත් හොඳ නරක කිරීමේ හැකියාව අහිමි වන්නේ ය. වත්මන් සමාජය තුළ ජීවත් වන මිනිසා මෙලොව දිවි ගෙවීමේ දී නිරතුරුවම මරණය පිළිබඳව සූදානම් විය යුතු අතර, කිතුනුවාට මරණය වනාහි නව ජීවිතයේ ඇරඹුමකි. එනම් වතට වත දී ඔවුන් වහන්සේගේ මුව කමල දැකීමේ භාග්‍යයයි. මෙලොව තුළ අප ජීවත් විය යුත්තේ ද, එකී සත්‍යතාව වටහාගෙන සැම විටම ක්‍රියාකාරී ලෙස ද, නිවැරදි ලෙස දිවි ගෙවීම තුළිනි. මෙහි දී "වළලනු ලබන සිරුර දිරා යන්නකි. උත්ථාන කරනු ලබන සිරුර නොදිරන්නකි. වළලනු ලබන සිරුර දුබල වූවකි. උත්ථාන කරනු ලබන සිරුර ප්‍රබල වූවකි. වළලනු ලබන සිරුර ස්වභාවික ශරීරයකි. උත්ථාන කරනු ලබන සිරුර ආධ්‍යාත්මික ශරීරයකි. ස්වාභාවික ශරීරයක් ඇති සේ ම ආධ්‍යාත්මික ශරීරයක් ද ඇත...."

**අසේල දසනායක විසිනි**

(1 කොරින්ති 15:42-45) එම නිසා උත්ථානයේ දේව ජනතාවක් ලෙස ක්‍රිස්තු උත්ථානයෙන් උදම් ව, ඔවුන් වහන්සේගේ උත්ථානයේ පංගුකාරයෝ වන්නෙමු. (රෝම 6:4-11). එසේ වූයේ ක්‍රිස්තුන් වහන්සේගේ යාගය ද, බිළිපඬුර ද ලෙසින් පාපයට වන්දි ගෙවා, අකීකරු කමින් කීකරු කම ද, උඩඟුවෙන් බැහැපත්කම ද බිඳ වැටී තිබූ දෙවි මිනිස් සබැඳියාව යළිඳු එක්කළ බැවිනි. (පිලිප්පි 2:6-11) එම නිසා වත්මන් සමාජයේ දිවි ගෙවන කිතුනුවන් ලෙස නිතොරව මරණයට සූදානම් ව ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ විය යුතු වෙමු. (පිලිප්පි 1:21).

කිතුනුවන් ලෙස අප කවදාවත් පෞද්ගලිකව ගැලවීම ළඟා කර ගන්නේ නැත. ගැලවීම ළඟා කර ගන්නේ කිතුනු සංඝය තුළයි. සංඝයෙන් ඈත් වී සාන්ත සභාවේ විමුක්ති මාර්ගය සොයා ගැනීම දුෂ්කර ය. එම නිසා සංඝයක්, සභාවක් ලෙස ශු. සභා මාතාව තම දර්ශනය හා අභිධර්මය තුළ සාන්තුවරයන්ගේ සමෝසධර්මලාභය ඉතා සුවිශේෂී දෙයක් ලෙස සැලකිය හැකිය. මෙමඟින් මෙලොව විශ්වාසකයින්, සාන්තුවරයින් හා දැනට ශුද්ධත්වය ලබන (ශුද්ධිකාග නිස්ථානය) විශ්වාසකයින් ද ස්වර්ග යේ සිටින ශුද්ධවන්තයින් අතර පවතින ආත්මික සබඳතාව වන්නේ ය. සරල ලෙස කිවහොත් සාන්තුවරයන්ට "අප නිසා යාච්ඤා කළ මැනව" යනුවෙන් අයදිමු. ඔවුහු ද දෙවිඳුන් ඉදිරියේ අප වෙනුවෙන් මැදිහත් වන්නාහ. මෙහි දී ශුද්ධත්වය ලබා ශුද්ධිකාගිනිස්ථානයේ සිටින ආත්මයෝ උදෙසා අපි යැදුමින් ද, දාන ධර්ම දීමෙන් ද, දිව්‍ය පූජාවන් ඔප්පු කිරීමෙන් ද, මෙකී ආත්මික සම්බන්ධතාව ඇති කරගනිමු.

සභා සම්ප්‍රදායට අනුව ශුද්ධගිනිස්ථානය වනාහි ගින්නේ බන්ධනාගාරයක් වන අතර සියලු ආත්මයෝ මරණයෙන් ඉක්බිති දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වන තෙක් එහි සිටින අතර එහි දී ඔවුහු ඉතා බරපතල වේදනාවන්ට මුහුණ දෙන බව සාම්ප්‍රදායික සභා ඉගැන්වීම වන්නේ ය. ශු. තෝමස් ඇක්වයිනස් මුනිඳුන්ට අනුව "ශුද්ධගිනිස්ථානය නිරයේ ගින්නට සමානය. එහි ඉතා කුඩා දැවීමක් පවා මේ පෘතුවියේ පවත්නා සියලු දුක් වේදනාවන් පරදවන සුළුය. ශු. අගුස්තීනු මුනිතුමාට අනුව ශුද්ධගිනිස්ථානය වනාහි "ස්වර්ගයට පිවිසීමට පෙර ආත්මයන් පරිශුද්ධ කිරීම සඳහා යොමු කරනු ලබන ස්ථානයයි. මරණයෙන් ඉක්බිති ආත්මයන් වඩාත් විනිවිද යන ආකාරයෙන්, භයංකාරත්වය, සංතාපය දනවන ගින්නෙන් දැවීමක් සිදු කරනු ලබයි. මෙසේ මේ ගින්න වනාහි පිරිසිදු කිරිමක් හා ආත්ම විශුද්ධියට හේතු කාරක වන අතර මේ පොළොවේ ඕනෑම දෙයකට වඩා එය බරපතල වේ...." දෙවන වතිකාන කතිකාවතෙන් පසුව නූතන දේව ධර්මයට සභා සම්ප්‍රදායට අනුව "ශුද්ධිකාගිනිස්ථානය" ගැන ප්‍රකාශ කරනුයේ දෙවියන් වහන්සේගේ රාජ්‍යයට යෑමට පෙර ශුද්ධවන්තවන්නා වූ ද, පිරිසිදු වන්නාවූ ද ස්ථානය ලෙසය (2 මකබි 12:4-5), (එළිදරව්ව 21:27).

මරණින් මතු සදාතන දිවිය අපේක්ෂා කරන බලාපොරොත්තු වන දේව ජනතාවක් අපි "ජීවතුන් ද මළවුන් ද නැවත වතාවක් විනිශ්චය කරන්නට ඔවුන් වහන්සේ වඩිනා බව විශ්වාස කරමු. දේව වචනයේ (එසකියෙල් 36:1-4) පරිච්ඡේදය මීට කදිම නිදසුනකි. නව ගිවිසුම තුළ දේව පුත්‍ර ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තුළ ද "පුනර්ජීවනය" පිළිබඳව මැනවින් උගන්වයි. (ජොහාන් 14) එම නිසා පුනර්ජීවනය හා අවසාන විනිශ්චය දේව වචනය මත පදනම් වූ ඇදහිල්ලේ කොටස් නිසා එය අනාගතයේ ඉටුවන බව විශ්වාස කරමු. එම නිසා ම විශ්වාස ලක්ෂණය තුළ නිරන්තරයෙන් මේ පිළිබඳව සැදැහැවතුන් සූදානම් කරයි.

"ජීවතුන් ද මළවුන් ද විනිශ්චය කරන්නට ඔවුන් වහන්සේ නැවත වඩින සේක....." "තවද මළවුන්ගෙන් නැවත නැගිටීම ද, මතු පැමිණෙන සදාතන ජීවිතය ද බලාපොරොත්තු වෙමි...."

**(පරිශීලනය - කතෝලික සභා ධර්මෝපදේශ සංග්‍රහය)**

## මිනිස් ඉරණම

නොවැම්බර් මාසය මළවුන් සිහිකිරීම පිණිස වෙන් කර ඇතත්, අප සභා මාතාව නොවැම්බර් 2 වන දින මළවුන්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. එම නිසා දේවස්ථානයට අයත් සුසාන භූමි පවිත්‍ර කිරීම පමණක් නොව, ආගමික වත් පිළිවෙත් සිදු කිරීම ද මෙදින සිදුවෙයි. සුසාන භූමිය වෙත පැමිණෙන කාගෙත් නෙත්, සිත් තුළ සිතුවිල්ල නම් අපත් කවදා හෝ දවසක මෙම ඉරණම ට පාත්‍ර වන බවයි. මේ මාසය මළවුන්ට කැප කර ඇති බැවින් මළවුන් වෙනුවෙන් දිව්‍ය පූජා පැවැත්වීමත්, දානය දීමත් සිදු කෙරේ.

මළවුන් සමරන මේ මාසය පුරා, මළවුන් වෙනුවෙන් දෙවියන් අයැදීම කිතුනු විශ්වාසයේ "සමෝස ධර්ම ලාභය" පිළිබඳ ඇදහිල්ල ප්‍රකාශයට පත් කිරීමකි.

විශ්වාස ලක්ෂණයෙහි අඩංගු පාප ක්ෂමාවෙහි ද, මාංශ උත්ථානයේ ද, අනන්ත ජීවිතය ද විශ්වාස කරමියි" යනුවෙන් සිහිපත් කරන කිතුනු ඇදහිල්ල මේ මාසය පුරා ජීවිත ගැන ද මෙනෙහි කිරීම වැදගත් විය යුතුයි. ජීවිතය ගැන ගැඹුරු අදහස් ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වෙයි.

හොඳ නාමය - සුවඳ විලවුන්වලට වඩා මිහිරිය.

උපත ලබන දවසට වඩා - අපවත් වන දවස හොඳය.

මන්ද? මරණය - හැම මිනිසාගේම ඉරණම වේ.

ජීවත්ව සිටින කවුරුත් - එය සිතට ගත යුතුයි. (ධර්මදේශකයා 7:1-2)

ජීවිත ජීවත් කරවීම වෙනුවට ජීවිත මළවුන් මෙන් ජීවත් වේ නම් එය ක්‍රිස්තු ප්‍රතිපත්තියට පටහැනි වේ. අප ජීවත්වන මෙම කෙටි කාලය තුළ දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුකරන්නේ නම් මරණයට නොබියව මුහුණ දෙන්නට හැකි වන්නේ ය. අපගේ ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගෙන කවදා හෝ දවසක අපිත් මළවුන්ගේ ලෝකයට පිවිසෙන බව වටහා ගනිමු. ස්වාමින් වහන්සේ මෙසේ වදාරණ සේක. අවංක කමින් ජීවත්වන අය මරණයේ දී ශාන්තියට පිවිස විවේක සුවයෙන් පසුවෙති. (යෙසායා 57:2)

භූමියෙන් වූ නුඹ, යළි භූමියට යන තෙක් දහදිය මහන්සියෙන් ආහාර උපයන්නෙහිය. දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නේ ය. (උත් 3:19) මෙම දේව වචනය චතාරික සමයේ ආරම්භක දින අළු බදාදා අපගේ නළල මත අළු තැවරීමෙන් සිහිපත් කරන්නෙමු. මනුෂ්‍යා කවරෙක් ද? ඔහුගේ පරමාර්ථය කුමක් ද? ඔහුගේ යහපත කුමක් ද? අයහපත කුමක් ද? මිනිසාට නියමිත දවස් ගනන කොතෙක් ද? ඉතා වැඩි වුනොත් අවුරුදු සීයකි.

මේ අවුරුදු ස්වල්පය සදාකාලය හා සසඳා බැලුවොත් එය මුහුදෙන් ගත් දිය බිඳක් මෙනි. වැලි ඇටයක් මෙනි. (උ.සි. 18:8-10) එම නිසා දේව වචනය පිළිපදිමින් මරණය ගැන මළවුන්ගේ මාසය තුළ පමණක් නොව ජීවිත කාලය තුළ මෙනෙහි කරමින් සදාකාලික සැප සම්පත් හිමි දේව රාජ්‍යයට උරුමක්කාරයෝ වන්නට අප සැම උත්සාහ කරමු.

**මයිකල් සෙබස්තියන්**

ගරු හෙන්රි සිල්වා පියතුමා

09

# ශු. බයිබලයට පොදු හැඳින්වීමක්




### 6. ශු. බයිබලය තේරුම් ගැනීම හා අර්ථ කථනය කිරිම.

බයිබල් අර්ථ කථනය ක්‍රි.පු. 440 දක්වා එනම්, එස්රා හා නෙහිමියාගේ කාලය දක්වා ඈතට විහිදෙයි. (නෙහිමියා 8, 1-12)

ක්‍රිස්තු වර්ෂ වලදි එය හරිහැටි අර්ථ කථනය කිරීමේ වගකීම ඇලෙක්සැන්ඩ්‍රියානු හා අන්තියෝකියානු ගුරුකුල මගින් භාර ගැණිනි. ඓතිහාසික ගැටළු හා පරස්පර විරෝධි අදහස් දක්නට ලැබීමද අර්ථකථනයේ තාක්ෂණික අවශ්‍යතාවය මතු කළේය. බයිබලය තේරුම් ගැනීම හා අර්ථ කථනය කිරිම පිළිබඳව මහත් බලපෑමක් ඇති කළ බුද්ධිවාදය මෙන්ම පුරා විද්‍යාත්මක සොයා ගැනීම් ද නිසා එය වඩා උත්සන්න විය. 19 වන ශතවර්ෂයේ සිට මේ දක්වා බයිබලීය අර්ථකථනය වැඩි දියුණුවී ග්‍රන්ථ විමර්ශනය, මූලාශ්‍ර විමර්ශනය, නිබන්ධනය විමර්ශනය, සංස්කරණ විමර්ශනය, ඉතිහාසමය විමර්ශනය හා වෘත්තාන්ත විශ්ලේෂණයද උපයෝගි කර ගන්නා වැදගත් විද්‍යාත්මක විෂයයන් බවට එය පත්ව ඇත. මේ සියල්ලම, එකිනෙකාට ආවේනික අයුරින් ද බයිබලය තේරුම් ගැනීමට අපට උපකාරි වෙයි. බයිබල් අර්ථ කථනය විවිධ ජන කොටස් අතර. වචනාර්ථ අර්ථකථනය, බැතිබර අර්ථකථනය. විමුක්තිවාදී හා කාන්තා විමුක්ති අර්ථ කථනයද වැනි විවිධ පැතිවලට බර අර්ථ කථනයන් බවටද පත් වෙයි. මෙහිදි අපගේ අධ්‍යයනය මූලාශ්‍ර, නිබන්ධන හා ප්‍රබන්ධන (සංස්කරණ) විමර්ශනයනට සීමා කිරිමට අදහස් කරමු.

**මූලාශ්‍ර විමර්ශනය**

මූලාශ්‍ර විමර්ශනය සතුව 1753 ජාන් අස්ට්‍රැක් දක්වා දිවයන ඉතිහාසයක් ඇත. පසුව මෙම ක්‍රමයට ජර්මන් විශේෂඥයන්ගේ, විශේෂයෙන් ජුලියස් වෙල්හවුසන් විශාරදයාගේ දායකත්වය හිමි විය. එය මුලිකව පාඨයක් පසුපස පිහිටි දේව ධාර්මික සම්ප්‍රදායයන් සෙවිම වෙත අවධානය යොමු කරයි එවැනි සම්ප්‍රදායයන් සතරක් අධ්‍යයනය කර ඇති අතර පුරාණ ගිවිසුමේ මුල් පොත් වලට එනම් 2 රාජාවලිය දක්වා ඒවා ආදේශ කර ඇත. යාවිස්ත. එලෝයිස්ත, ද්විතිය නීති සහ පූජක යන සම්ප්‍රදායයන් ඉහත සඳහන් කළ පොත් වල ඇති බවද ගණනය කර ඇත.

**(යාවිස්ත) යාවේ සම්ප්‍රදාය (ජේ)**

මෙහි දෙවියන් වහන්සේ සඳහා භාවිතා කළ නාමය යාවේ. (ස්වාමින් වහන්සේය) ය. දෙවියන් වහන්සේ ඉදිරිපත් කරනු ලබන්නේ මානව රූපාකාරයෙන්ය. සාහිත්‍යමය (භාෂා) ශෛලීය විස්තරාත්මක කථාන්තර ස්වරූපයක් ගනි. මෙම සම්ප්‍රදාය යටත් පිරිසෙයින් ක්‍රි.පු. 950 වන විට ජෙරුසලමෙහි (දකුණු රාජ්‍යයෙහි) ආරම්භ වන්නට ඇත. නිදසුන් :- උත්පත්ති 2-4

**එලොයිස්ත සම්ප්‍රදාය** (ඊ)

දෙවියන් වහන්සේ හඳුන්වනු ලබන්නේ එලොහිම් යන නමිනි. දෙවියන් වහන්සේ ඉදිරිපත් කෙරෙන්නේ මිනිසාට ළඟා විමට නොහැකි උත්කෘෂ්ඨ ආකාරයෙනි. එනම් ඔවුන්වහන්සේ දර්ශන, සිහින හා දේව දුතයන් මගින් මිස මිනිසා සමඟ සෘජුව සබඳතා නොපවත්වන සේක. මෙයට හේතුව ඊ සම්ප්‍රදාය බිහි වී ඇත්තේ ඊශ්‍රායෙල් නොවන ජනතාව අතර මැටි වලින්, ගලෙන්, ලීයෙන් සහ ලෝහ වලින් තැනූ දෙවි දේවතාවියන් සිටි උතුරු රාජ්‍යයේ වන බැවිනි. ඊශ්‍රායෙල්ගේ දෙවියන් වහන්සේ මේවාට වඩා වෙනස් බව පෙන්නුම් කළ අතර, කිසිවිටක මැව්ල්ලක ස්වරූපයෙන් ඔව්හු ඔවුන්වහන්සේ ඉදිරිපත් නොකළහ. සාහිත්‍යමය ශෛලිය සෘජුය කෙටිය. එතරම් විස්තරාත්මක නොවේ. මෙම සම්ප්‍රදාය ක්‍රි.පු. 800 පමණ උතුරු රාජ්‍යයේ බිහිවු බව සිතිය හැකිය. නිද. උත්පත්ති 22, 1-19

**ද්විතිය නීති සම්ප්‍රදාය (ඩී)**

දෙවියන්වහන්සේසඳහාභාවිතාකරනවිශේෂනාමයක් නොමැත. සාහිත්‍යමය ශෛලිය අනුශාසනාත්මකය. මුලික අවධානය දෙවියන් වහන්සේ සමඟ වු ගිවිසුම හා එයට විශ්වාසවන්ත වීම පිළිබඳවය. ක්‍රි.පු. 621 ජෙරුසලෙම් දේව මාලිගයෙහි තිබී හමුවු ලියැවිල්ලක් මෙයට මූලාශ්‍ර වු බව කියැවෙයි. 2 රාජාවලියේ 22 හි පැවසෙන ලෙස එය සිදුවී ඇත්තේ ජොසියා රජතුමාගේ කාලයේ සිදුවු ආගමික ප්‍රතිසංස්කරණ අවධියේදීය.
නිද :- ද්විතිය නීති සංග්‍රහය

**පූජක සම්ප්‍රදාය** (පී)

දෙවියන් වහන්සේ සඳහා භාවිතා වන නාමය එලොහිම්ය. දෙවියන් වහන්සේ අතිශයින් උත්කෘෂ්ඨ ය. කිසිසේත් මිනිසාට ළඟාවිය නොහැකිය. සාහිත්‍යමය ශෛලිය එකම දේ නැවත නැවත කියන ස්වරූපයක් පෙන්නුම් කරයි. වතාවත් හා නීතිය කෙරෙහි වන අවධානය කැපී පෙනෙයි. ක්‍රි.පු. 587 සිදුවු ජෙරුසලෙම් විනාශයට පසුව බැබිලෝනිය විප්‍රවාසි සමයේ බිහිවු බව කියැවේ. නිද : උත්පත්ති 1, 1:2, 4

(තවත් කොටසක් ලබන සතියේ...)

# පොලීසියට එරෙහිව ජනතාව නැගී සිටින්නේ ඇයි?

**කතුතුමනි,**

ජනතාව නීතිය සියතට ගෙන වරදකරුවන්ට දඬුවම් පැමිණවීම හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීමෙන් බැඳී සිටින පොලිස් නිළධාරින්ට හා පොලිස් ස්ථානවලට පහර දීම අනුමත කළහැකි ක්‍රියා නොවේ. එහෙත් මෑතක සිට එවන් පහරදීම් වර්ධනය වීම තුළින් ද්වනිත වන්නේ පොලිසිය කෙරෙහි මෙරට ජනතාව විශ්වාසය බිඳී ඇති බව ය; නැතහොත් පොලිසියට පහර නොදුනහොත් යුක්තිය ඉටුකරවා ගත නොහැකි බවට ජනතාව තුළ මතයක් ගොඩනැගී ඇති බවය.

මෙයට වසරකට පමණ පෙර තරුණයින් දෙදෙනකු ඝාතනයට ලක්වීමට එරෙහිව සංවිධානය වු ජනතාව අඟුලාන පොලිසියට පහරදීමද, මෙයට සති කීපයකට පෙර ත්‍රි රෝද රථ රියැදුරකු ගේ ඝාතනයට එරෙහිව දොම්පෙ පොලිසියට එල්ලවූ ප්‍රහාරයද ජනතාවගේ ආරක්ෂකයා විය යුතු පොලිසිය ඝාතකයකු වීම නිසා සිදුවු ජනතා නැගිටීම්වල ප්‍රතිඵලයන්ය. අඟුලානේදී මෙන් පොලිසියට ගල්මුල් ප්‍රහාර එල්ලකිරීමෙන් නොනැවතී අති විශාල ජනතාවක් දොම්පෙ පොලිස් ස්ථානයට කඩාවැදී පොලිස් වාහන කීපයකට ප්‍රහාර එල්ල කිරීමද පොලිස් ස්ථාන



ගොඩනැගිල්ලේ කොටසකට ගිනි තැබීමද ජනතා කෝපාග්නියේ තරම කියාපායි.

මෙයට පෙර පොලිස් අත් අඩංගුවේ සිටියදී මරණයට පත්වූ සැකකරුවන් සම්බන්ධයෙන් පොලිසියද පොලිස් වාර්තා මත අධිකරණයද කටයුතු කර ඇති ආකාරය ද සැලකිල්ලට ගැනීමේදී ජනතා නැගිටීමක් සිදු නොවුයේනම් අඟුලාන පොලිසිය අතින් ඝාතනයට ලක්වූ තරුණයන්ගේ මරණද "පොලිසිය ආත්මාරක්ෂාව සඳහා කරණ ලද සාධාරණ වෙඩි තැබීමෙන් සිදුවු මරණ" ලෙස හංවඩු ගැසී යටයන්නට හැම අතින්ම ඉඩකඩ තිබුණි. එහෙත් අඟුලානේ ජනතාව පාරට බැස පොලිසියට පහරදී යුක්තිය ඉල්ලා සිටීම නිසා මහාධිකරණ විනිසුරුවරුන් තිදෙනකු විසින් වරදකරුවන්වූ පොලිස් නිළධාරින්ට මරණීය දඬුවම පනවන්නට තරම් එම සිදුවීම් දුරදිග ගියේය.

ත්‍රිරෝද රථ රියැදුරකුගේ ඝාතනයට එරෙහිව දොම්පෙ පොලිසියට ජනතාවගෙන් එල්ලවූ මහා ප්‍රහාරය සිදුවී විසිහතර පැයක් යන්නටද පෙර පොලිස් මාධ්‍ය ප්‍රකාශකයා නිවේදනය කළේ සොරබඩු සෙවීම සඳහා පොලිස් ජීප් රථයකින් රැගෙන යමින් සිටියදී එම ත්‍රි රෝද රථ රියැදුරා ජීප් රථයෙන් පැනීම නිසා මරණයට පත්වූ බවය. එහෙත් එම ප්‍රකාශයේ නිරුවත හෙළිවූයේ එකී ප්‍රකාශය රටට ප්‍රකාශකර දිනක් හෝ ගතවීමට පෙර ත්‍රි රෝද රථ රියැදුරා පොලිස් ජීප් රථයෙන් පැන්න බවට කිසිදු සාක්ෂියක් නැතැයි පොලිසියට අණදෙන පොලිස්පති විසින්ම ප්‍රකාශකරනු ලැබීමෙනි. දොම්පෙ ජනතාවගේ ප්‍රහාරයේ බරපතල බව නොවන්නට පොලිස් ප්‍රකාශකයාගේ නිළ නිවේදනය සනාථ වී එම ත්‍රි රෝද රථ රියැදුරා දරුණු සොරකු වන්නටද ඔහුගේ මරණය සාධාරණීයකරණය වන්නටද හැකිකම තිබුණි.

ජනතාව නීතිය අතට ගත්විට එහි ප්‍රතිඵල ඉතා භයානක විය හැකිය. එබැවින් එම ප්‍රවණතාවය වර්ධනය වීම නවතාලීම සමාජයේ යහපත සඳහාම වෙයි. සිය ජීවිතවලට එල්ලවිය හැකි තර්ජන පවා නොතකා ජනතාව පොලිසියට එරෙහිව ප්‍රචණ්ඩත්වය මුදාහැරීමට පෙළඹෙන්නේ පොලිසියේම වරදින් බව මෙහිදී අමතක කළ නොහැකිය. සිය අත්අඩංගුවේ සිටින සැකකරුවකු මියයාම පිළිබඳව වගකීම දැරිය යුත්තේ පොලිසියමය. කවර අන්දමේ අපරාධකරුවකු වුව ඔහුගේ අපරාධ සාපරාධී ලෙස ඔහු ඝාතනය වීමට මෙරට නීතිය අනුව හේතුවිය නොහැකිය.

මෙහි සඳහන් සිද්ධීන් පොලිසියට එරෙහිව ජනතා නැගිටීම් ඇතිවු පළමු අවස්ථාවන් නොවේ. එසේම නිසි පියවර නොගතහොත් ඒවා අවසාන සිදුවීම් නොවීමටද ඉඩකඩ නැත්තේ නොවේ. එබැවින් නීතිය අතට නොගන්නැයි ජනතාවට අවවාද කරන උසස් පොලිස් නිළධාරින් හා දේශපාලනඥයින් නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමට කටයුතු කිරීම ජනතාවට නීතිය ඉගැන්වීමට වඩා යහපත්ය.

**ලිඩ්වින් කිරිඇල්දෙණිය**
හලාවත

## ළමා ප්‍රදීපයට කුඩම්මාගේ සැළකිල්ල ද?

**කතුතුමනි,**

ශුද්ධාත්ම මඟ පෙන්වීම යටතේ මීට තෙවසරකට පෙර වෙනම පුවත්පතක් ලෙස ආරම්භ කළ ළමා ප්‍රදීපයට පළමු කොට මම සුබ පතමි. වසර තුනක් සපිරෙන දින නිකුත් කළ පුවත්පතේ "ළමා ප්‍රදීපයේ ඉදිරි ගමන පුංචි ඔබයි" මැයෙන් සහය සංස්කාරක කුමර නයනජිත් මහතා ඉදිරිපත් කර ඇති අදහස කියවීමෙන් විමතියට මෙන්ම කණගාටුවට පත් වුනෙමි. එහි සඳහන් වූයේ ඇතැම් කතෝලික පාසල් එකදු ළමා ප්‍රදීපය පුවත් පතක් හෝ විකිණීමට දායක නොවේ" යන්නයි ඇතැම් කතෝලික පාසල් වල දකුණු ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත්පතේ පිටපත් එකක්වත් අලෙවි නොවීම කණගාටුවට කරුණක් නොවේද?

කතෝලික සභාවට අයත්ව තිබු පාසල් 1961 වර්ෂයේදී රජයට පවරා ගැනීමත් සමඟම දරුවන්ගේ බිඳ වැටුණු ආගමික අධ්‍යාපනය ගොඩනැගීම සඳහා විකල්ප මාර්ග යක් ඇති විය. ඒ නිසාවෙන් ආගමික පත පොත හා පුවත් පත්, සඟරා වැඩි වැඩියෙන් බිහිවේ. එවැනි සඟරා, පත පොත තුළින් ළමුන්ගේ ජීවිතයට උකහාගත හැකි දහම් කරුණු මෙතෙක් යැයි කියා නිම කළ නොහැක.

උද්ගතව ඇති මෙම තත්ත්වයට වැඩිහිටි පාසල් ගුරුවරුන්ද, දහම් ගුරුවරුන්ද වග කිව යුතුව ඇත.




මෙය ජය ගැනීමට හැකියාව ඇත්තේද එම පාර්ශවයන්ටමය. උදාහරණ ලෙස සැලකුවහොත් ළමුන්ගේ අනවශ්‍ය වියදම් ඉවත් කර පුංචි රුපියල් 10 කට වටිනාකමක් ලබා දී මෙම පුවත් පත මිලදී ගැනීමට ළමුන් යොමු කිරීම වැඩිහිටියන්ගේ වගකීම හා යුතුකමය.

දහම් ගුරුවරුන්, පාසල් ගුරුවරුන් දරුවන්ගේ විවිධ නිර්මාණ එක් කර ළමා ප්‍රදීපයට භාර දීම ද එම නිර්මාණ ළමා ප්‍රදීපයේ පළවු විට එම ළමුන්ව උදැසන රැස්වීම් තුළදි අගය කිරීම මගින් අනිකුත් ළමුන්ද ළමා ප්‍රදීපය මිළදී ගැනීමට මෙන්ම නිර්මාණ යොමුකිරීමට වැඩි වැඩියෙන් පෙළඹවිය හැකිය. එවිට ළමුන් හට ළමා ප්‍රදීපය තුළ අන්තර්ගත ශ්‍රී ලාංකීක බවින් සන්නද්ධ වී ජීවන මඟ සුවසේ ඉදිරියට යා හැකිය. මේ පිළිබඳව වගකිව යුත්තන්ගේ අවධානය වැඩි වැඩියෙන් යොමු වේවා!

**ලක්ශාන් ප්‍රනාන්දු**
මිනුවන්ගොඩ

## මඩු පුදබිමේ පාදනමස්කාර ප්‍රතිමා තනිවෙලා



**කතුතුමනි,**

උතුර දකුණ යා කරමින් ගරු ජයලත් ජයවර්ධන මැතිඳුන්ගේ බැතිබර දායකත්වයෙන්, ජනතා හරසර මැද මඩු පුද බිමට වැඩමකරන ලද පාදනමස්කාර ප්‍රතිමා අද අව්වට වැස්සට තෙමෙමින් (සමහරු ප්‍රතිමාවල අත් පා කැඩිබිඳී ඇත) මඩු පුද බිම තුළ බැතිමතුන්ගෙන් ඈත්ව හුදකලාවී ඇත. මෙය ඉතාම කණගාටුදායක තත්ත්වයකි.

මේ පාදනමස්කාර ප්‍රතිමා ආවරණ සහිතව දර්ශනීය ලෙස ස්ථාන ගත කිරීම තුළින් බැතිමතුන්ගේ අවධානයට යළි යොමු කළ හැක. නාත්තන්ඩිය ලූර්දු දේවමාතා පුදබිමේ පාදනමස්කාර ප්‍රතිමා ස්ථානගතකර ඇති ආකාරය මෙයට කදිම නිදසුනකි. මේ තුළින් කිතුනු ජනවන්දනාවේ සුවිශේෂ 'පාදනමස්කාර බැතිය' මඩු පුදබිම තුළ වඩාත් අරුත් ගැන්විය හැකිය. මේ පිළිබඳ ජයලත් ජයවර්ධන මැතිතුමාගේ බැතිබර අවධානයට යොමුවේවා!

**ජෝශප් එම්මානුවෙල් පෙරේරා**
නාත්තන්ඩිය

## කොළොන්නාව මීසමෙන් "යහපත්" ආදර්ශයක්

**කතුතුමනි,**

මාස කිහිපයක් තිස්සේ පොර බදා සටන් කැර සූදානම් කළ පුංචි ඡන්දයත් වෙඩි ශබ්දයක් නඟා නිමාවට පත්විය. කුමන ආයතනයකට හෝ කුමන බලධාරියකුට, කොමසාරිස් වරයකුට, දේශපාලනඥයකුට පසුගිය ඡන්දය 'පුංචි ඡන්දයක්' වුවද කවරාකාරයේ මැතිවරණයක් දෙස මධ්‍යස්ථ බුද්ධිමත් මතධාරි තලයක සිටින ශ්‍රී ලංකා කතෝලික සභාව එය පුංචි කොට සිතා හැල්ලුවට ලක් නොකළේය. කතෝලික සභාව නිතරම සිය සැදැහැවතුන්ට අනුශාසනා කළේ ඡන්දය පාවිච්චි කරන ලෙසත්, හෘද සාක්ෂියට එකඟව එය ප්‍රකාශ කරන ලෙසත්ය.

ඒ අපක්ෂපාත ප්‍රකාශයට බහුතර ඡන්ද දායකයෝ සිය ප්‍රසාදය පළ කළහ. එයින් කතෝලික සභාව බලාපොරොත්තුවන්නේ සියයට සියයක් සුපිරිසිදු දේශපාලනඥයන් මෙරට බිහිකිරීම නොව, මෙරට යහපත් සමාජයක් ඇතිවනු දැකීමය. උක්ත අදහසට සාක්ෂි දරමින් කොළොන්නව මීසමෙන් සිය දේව ජනතාව මෙලෙස දැනුවත්කර තිබුණි. ඡන්දය පැවැත්වෙන දින උදැසනම ගොස් ඔබේ ඡන්දය ප්‍රකාශ කරන්න. එය ඔබේ කිතුනු වටිනාකමකි. එමෙන්ම යහපත් කිතුනු ගුණාංග ඇති කතෝලික අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඡන්දය පාවිච්චි කිරීමේ වරදක් නැත."

මෙම ඉල්ලීම හා අදහස කොළොන්නාව මීසම්වාසින්ට පමණක් නොව රටට ම මහඟු ආදර්ශයක් සපයන ප්‍රකාශනයකි. විශේෂයෙන් රටේ කිතුනු ආගමික පුරවැසියට සිය හෘද සාක්ෂිය දෙස නෙත් යොමන්නට කරන ආරාධනයකි.

මෙවර ඥනාර්ථ ප්‍රදීපය පුවත්පත මගින් කළේ ද මැතිවරණ නිසා (මෙරට මැතිවරණ ක්‍රමය නිසා) උදාසීන ව සිටි ජනතාව බුද්ධිමත් ලෙස අවදි කිරීමයි. ඉදිරි මැතිවරණ ව්‍යාපාරවලදීත් කතෝලික සභාව මෙලෙස ඍජු ප්‍රතිපත්තියක සිටිනු දැකීම රටේ පොදු (කිතුනු) ජනතාවගේ අපේක්ෂාවයි.

**මංගල ජයවර්ධන**
ගිංතොට

## එඬේරික සේවය ප්‍රචලිත කළ හැකිනම්

**කතුතුමනි,**

කිතුනු අපකාගේත් එකම අභිලාශය වනුයේ අර්ථවත් කිතුනු ජීවිතයක් ගතකිරීමටයි. මෙය සාක්ෂාත් කරගනුවස්, විවිධ ක්‍රියා මාර්ගයන් අප විසින් ගනු ලැබේ. සමහරෙක් දැනට මීසමක් තුළ පවතින සමිති සමාගම් වලට සම්බන්ධවී, ලොකු උනන්දුවකින් හා කැපවීමකින් කටයුතු කරති. තවත් සමහරෙක්, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අනුව, කලාප මට්ටමින් හෝ පදවි මට්ටමින් සංවිධානය කරනු ලබන කෙටිකාලීන හා දිගු කාලීන පාඨමාලාවලට සම්බන්ධවී, දැනුමක් හා අවබෝධයක් ලබාගෙන, මීසම තුළ තම සේවාවන් වඩාත් නිවැරදිව හා කාර්යක්‍ෂමව කිරීමට ඉදිරිපත් වෙති.

එහෙත්, එය එසේ වූවත්, බොහෝවිට මෙවැනි අයට තම මීසම තුළ යම් සේවාවක් හෝ ඉටුකිරීමට ඉඩ ප්‍රස්ථා නොලැබෙන බව මෙහිදී කිවයුතුය. අනෙකුත් වැඩිපිරිස, සුපුරුදු ලෙස සාමාන්‍ය පිළිවෙලට, බාහිර ක්‍රියාකාරකම්, වත් පිළිවෙත් යනාදියට සම්බන්ධවී තම කිතුනු ජීවිත ගතකරනු ලබති. නාමිකව කිතුනු ජීවිත ගතකරන අයද නැතුවා නොවේ. අපගේ උත්සාහයේ ප්‍රතිඵල නෙළාගන්නට උත්සුක වූවත්, ඊට අවශ්‍ය පසුබිම, අප මීසම් තුළ දක්නට නොමැත.

බොහෝවිට තමන් යෙදී සිටින දූත සේවාව අඛණ්ඩව හා කාර්යක්‍ෂමව කරගෙන යාමට අතදීම්, කලින් කලට දැනුවත් කිරීම් හෝ පෝෂණයක් හෝ ලබාදීමට ඉදිරිපත් වීමක් ද නොමැති බව පෙනේ. ඒ නිසා තමන් යෙදී සිටින දූත කාර්යයයේ අරමුණු කරායාමට අපොහොසත් වන අතර, අධෛර්යයට පත්වීමද සිදුවිය හැක. තවද, විවිධ ප්‍රශ්න ගැටළුවලට මුහුණ දෙන්නට සිදුවන අවස්ථාවලදී ඒවා නිරාකරණය කරගැනීම සඳහා එඬේරික මඟපෙන්වීම් ලබා ගැනීමට අවශ්‍ය වේ. ඒ සඳහා ක්‍රමවත් පිළිවෙතක් දක්නට නොමැති වීම හේතුවෙන් ඉතා අසරණ තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදුවේ. මෙවැනි තත්ත්වයන් මඟහරවා ගනු වස් පූජක පක්ෂය තම සුපුරුදු අධිකාරි බලෙන් අත්මිදී, සැබෑ එඬේරිකත්වය තුළ සංවේදීව ක්‍රියා කළොත්, ගැටුමකින් තොරව ප්‍රශ්න, ගැටළු නිරාකරණය කළ හැකි යයි සිතමි.

**රිචඩ් වික්‍රමසිංහ**
බටගම



මුවා



ජ් මුල්
ණෝ !

තින් පිදූ
ඇඳුරු දම් විදූ
දෙවන රන් බඳු
වරෙන් ලදූ

ගුරු වරම් ලැබූ
ම අසුනෙ තැබූ
ළ දිවැසි බව තිබූ
වියම හෙබූ

නල් තුමා
ස නමා
වි කර කමා
ජේවා! නොව පමා

ගේ මානුෂික දුර්වලකම
මට සිදු වූ වරදට මට
ය් බව මම දන්නවා.
ැහැ. කෙසේ වුවත්
ද ආවේ ඒ සඳහායි.
දහා ගනු බැරිවිය.
දයකි. ඉතින් මෙවන්
තුමන් අතින් වරදක්
න්දට යනු පෙර සිත
ස් තුමන් දිනපතාම
වී සමාව ගෙන දෙන
ාතැනක හෝ කියවා
හෝ විට කරන අන්දමට
බි නම් කොන්දේසි
ැහැ. වරද සිදුවී ඇති
වකි. මගේ සම වයසේ
භාතක මෙවැන්නක්
ත. එහෙත් කාදිනල්
ගෙවා මගේ නිවහනටම
මන් තුළ පැවති දෙව්
ැවතුම් තුළින් සාධු
දෙවතට ද කථා කිරීමේ

කෙනෙකුටම මහඟු

ටි රූපසිංහ

# දේව සේවක තෝමස් කුරේ කාදිනල් උතුමාණෝ

**අති උතුම් තෝමස් කුරේ කාදිනල් හිමිපාණන් ස්වර්ගස්ථ වී මෙම ඔක්තෝබර මස 29 දාට 23 වසර පිරේ. එතුමන් ගේ ශ්‍රී දේහය භූගත කරන ලද්දේ එම නොවැම්බර මස 3 වැනි දා ය.**

ක්‍රි.ව. 1901 දෙසැම්බර මස 28 වැනි දා මෙලෝ එළිය දුටු තෝමස් බෙන්ජමින් කුරේ බිළිඳා ප්‍රථමයෙන් දළුපොත (මීගමුවේ) සා. අන්තෝනි කතෝලික පාසලේ ඉගෙනුම ලබා කොළඹ සාන්ත ඇලෝසියුස් පූජක සිසුහලට ඇතුළු විය. එහි දී අධ්‍යාපනය සඳහා සාන්ත ජෝසප් මහා විදුහලට ගිය මෙම පූජක සිසුවා, සියලු දෙනා මවිත කරවමින් ඉගෙනීමෙහි දස්කම් පෑවේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ (එවකට කොළඹ යුනිවර්සිටි කොලේජිය) උපාධි පාඩම් මාලාවක් හැදෑරීම සඳහා වරම් ලැබීය. ඉනික්බිති නි.ම. නිකායේ පූජකවරයකු වීම සඳහා බම්බලපිටියේ පිහිටි එම නිකායේ මූලික පුහුණු ආරාමයට ගොස්, වසරකට පසු කොළඹ බොරැල්ලේ දෙව්සත්හලේ දර්ශන ශාස්ත්‍රය ඉගෙනුම ආරම්භ කළේ ය. මෙහි ද දස්කම් පෑ තෝමස් කුරේ ගරු සහෝදර තුමා දේව ධර්ම ශාස්ත්‍රය හදාරනු පිණිස රෝමයේ ඇන්ජෙලිකුම් ශාස්ත්‍ර පීඨයට යවන ලදි.

එහි දී ශාස්ත්‍රපති උපාධිය දිනාගත් එතුමන් පූජාත්වරයට ඔසවන ලද්දේ ක්‍රි.ව. 1929 ජුනි මස 23 වැනි දා ය. පෙරළා දිවයිනට සැපත් වූ පසු සා. ජෝසප් මහා විදුහලේ ගුරු මඬුල්ලේ ද, කොළඹ සරසවි සිසුන් සඳහා බම්බලපිටියේ එවකට පිහිටා තිබූ ඇක්වයිනස් නේවාසිකාග ාරයේ උපාධ්‍ය ලෙස ද සාන්ත බර්නාඩ් දෙව්සත්හලේ කථිකාචාර්යවරයකු වශයෙන් ද, අවසානකොට නිමල මරිය නිකායේ පූජක පුහුණු ආයතනයේ ශ්‍රේෂ්ඨ පියතුමන් වශයෙන් ද ක්‍රියා කළ එතුමෝ ක්‍රි.ව. 1945 දෙසැම්බර මස 14 වැනි දා ප්‍රෙස්ලාව්හි නාමධාරී කොළඹ යුව අගරදගුරු වශයෙන් පත්වීම් ලදහ. ක්‍රි.ව. 1946 මාර්තු මස 7 වැනි දා කොටහේනේ සාන්ත ලුසියා ආසන දෙව්මැඳුරේ රදගුරු අබිසෙස් ලද එතුමෝ ක්‍රි.ව. 1947 ජුලි මස 28 වැනි දින අති උතුම් ජෝන් මේරි මසෝන් අගරදගුරු හිමිපාණන් ස්වර්ග ස්ථ වීම හේතුකොටගෙන පූර්ණ වගකීම් හා බලතල ද සහිතව කොළඹ අගරදගුරු වශයෙන් වැඩ බාර ගත්හ. ක්‍රි.ව. 1965 පෙබරවාරි මස 22 දා තෝමස් කුරේ හිමිපාණන් 6 වැනි පාවුලු සසුනිසුරාණන් විසින් කාදිනල් තනතුරට ඔසවන ලදි.

පූර්වෝක්ත සියල්ල ලක්දිව කතෝලික ඉතිහාසය තුළ අති උතුම් තෝමස් කුරේ කාදිනල් හිමිපාණන්ට හිමි වන ප්‍රථම අවස්ථා කිහිපයකි. ඔවුන් වහන්සේ අද කොළඹ බොරැල්ලේ පිහිටි සාන්ත ඇලෝසියස් පූජක සිසුහලට ඇතුළු කරගන්නා ලද පළමු සිසුවා වන්නහුය. කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළු වීමේ වරම් ලැබූ පළමු කතෝලික පූජක සිසුවා එතුමෝ ය. කතෝලික සභාව තුළ පළමු වරට අගරදගුරු පදවි ලද සහ පළමු වරට කොළඹ අගරදගුරු තනතුරට පත් ලාංකිකයා මෙන් ම හෙළයා ද එතුමෝ ය. කාදිනල් තනතුර ප්‍රථම වරට හිමිකැරගත් ලාංකික උත්තමයාණෝ ද එතුමෝ ම ය. එසේ ම පාප් වහන්සේ දෙ නමක් පත් කැර ගැනීම සඳහා පළමුවතාවට මෙන් ම දෙවරක් ද ඡන්දය පාවිච්චි කිරීමේ අවසරය හිමිකැර ගත්තෝ
උන්වහන්සේ ය.

සැකෙවින් මෙහි සඳහන් කළේ තෝමස් කුරේ කාදිනල් හිමිපාණන් ගේ පැවැත්ම පිළිබඳ විස්තරයකි. මෙහි විශේෂය වනුයේ දෙවි සමිඳුන් මෙම යුග පුරුෂයාණන් උන්වහන්සේ ගේ ලක්වැසි දේව ජනතාව හෙවත් අප උදෙසා සූදානම් කළ පුදුම ආකාරය යි.

මෙ රට කතෝලික සභාව ඕලන්ද පීඩනයෙන් දරුණු ලෙස බැට කා, යළි පුනර්ජීවයක් ලැබුවේ වසර දෙසියයකට වැඩි කාලයක් හෙවත්, ක්‍රි.ව. 1687 සිට ක්‍රි.ව. 1906 ජුනි මස දක්වා, ඔරතෝරියාන පියවරුන් ගෙන ගිය සටනේ ප්‍රතිඵලයක් වශයෙනි. ජුසේ වාස් පියතුමා පැමිණ ආරම්භ කළ දහම් ප්‍රබෝධය ක්‍රමයෙන් ව්‍යාප්ත වී ඕලන්ද පාලකයිනට මෙල්ල නො කළ හැකි බලවේගයක් බවට පත්විය. එහෙත් දිනෙන් දින දියුණු වෙමින් ව්‍යාප්ත වීමත් සමඟ අවාසනාවක් වූයේ පෘතුගීසි රජය විසින් ඒ රටේ පිහිටි සියලු පැවිදි නිකායන් තහනම් කැර දැමීම යි. මෙම තහංචිය පෘතුගාලයට යටත් ව පැවැති විදේශීය රටවල් කෙරෙහි ද බලපෑ හෙයින් ගෝවේ නුවර කේන්ද්‍රස්ථානය පිහිටි ඔරතෝරියාන නිකාය ද රාජ්‍ය නියෝගය අනුව තහනම් නිකායක් බවට පත්විය.

ඉහත සඳහන් කාරණය හේතුකොටගෙන ඉන්දියානු ජාතික ඔරතෝරියාන නිකායික පියවරුනට මෙහි පැමිණීම සම්පූර්ණයෙන් ම බාධා විය. මේ බාධකය නිසා මෙ රට සිටි එම ඔරතෝරියාන නිකායේ ම අනු රදගුරුවනට සිදු වූයේ පූජකවරුන් වෙනත් රටවලින් සොයා ලබා ගන්නට යි. එ කල බෙහෙවින් පූජා ප්‍රසාදීන් වහන්සේ සිටියේ යුරෝපයේ ප්‍රංසය, බෙල්ජියම, ඉතාලිය ආදි රටවල ය. මේ හේතුවෙන් ජුසේ වාස්, ජාකොමේ ගොන්සාල්වේස් ආදි පියවරුන් ගේ අනුග්‍රහයෙන් හා මඟ පෙන්වීමෙන් ද පෙරදිග බස දෙස හැදියාව පදනම් කොටගෙන නැඟී ආ කතෝලික සභාව බටහිරට නැඹුරු විය.

මෙතැන් සිට පූජාප්‍රසාදීන් වහන්සේ මෙන් ම රාජගුරුප්‍රසාදීන් වහන්සේ සියලු දෙනා ද යුරෝපීය ජාතිකයෝ වූහ. මේ අතර සියලු දෙනා ම පාහේ දේශීය භාෂා උගත්හ. ඇතැමෙක් භාෂා විශාරදයන් බවට ද පත් වූහ. වැඩිදෙනා තම සිත කය තැන්පත් කළේ දිවයින සඳහා දිවයින තුළ ම ය. එසේ වුව ද මෙ රට බහුතරයට කතෝලික සභාව පෙනී ගියේ විදේශීය හෙවත් යුරෝපීය සංවිධානයක් සැටියට යි. දේශීය ගති පැවැතුම් කිතුනුවන් අතුරින් - වෙසෙසින් නගරබද පිරිස අතුරින් - හීන වීම හේතුකොටගෙන ඉහත සඳහන් හැඟුම් වඩාත් ප්‍රචාලිත විය.

මෙසේ සියලු ම බලතල මෙන් ම පූජකවරුන් විශාල පිරිසක් ම ද විදේශිකයන් ව සිටි අවධියක සභාවේ නායකත්වය සියතට ගෙන සියලු දෙනා පොදු එක් අරමුණක් කෙරෙහි යොමු කිරීම පහසු කාරියක් නො වන බව අමුතුවෙන් කිව යුතු නො වේ. එහෙත් මෙම කාරිය පැවැරුනේ තෝමස් කුරේ හිමිපාණන් වෙත යි.

කොළඹ අගරදගුරු වසම ස්ථාපිත කළ දා සිට එය පාලනය කළෝ ප්‍රංස ජාතික අගරදගුරු හිමිවරු ය. මෙ වන් පස් නමකි . ඒ සියල්ලෝ ද නිමල මරිය නිකායේ පියවරු ය. එවකට මෙහි සේවා කළ ගරු පියවරු වැඩියක් ද එම නිකායට අයත් යුරෝපීය ජාතිකයෝ ය. ඒ අනුව සය වැනි වරටත් අගරදගුරු තනතුර එම පූජකයකුට පැවැරෙනු ඇතැයි අපේක්ෂා තැබීම පුදුමයට හේතුවක් නො වනු ඇත. එහෙත් රෝමය දූරදර්ශීව ක්‍රියා කළේ ඊට හාත්පසින් වෙනස් ආකාරයට යි. දේශපාලන නිදහස ලබා ලාංකික රට ලාංකිකයන් අතට පත් වන්නට පෙර ලාංකික කතෝලික සභා නායකත්වය ලාංකික පුතකු අතට පත් කළේ ය.

දේව බැල්ම ලා තෝරා ගනු ලැබූ තෝමස් කුරේ පැවිදි උතුමාණන් ගේ කර මත දෙවි සමිඳුන් තැබුවේ එදා ස්වකීය පුත් කුමර ජේසු සමිඳුන් ගේ කර මත තැබූ කුරුසියේ අනුකරණයක් මැයි කිව හැකි ය.

මෙසේ පළමු වරට කොළඹ අගරදගුරු වගකීම් බාරගත් මෙතුමන් වෙත පැවැරුණු කාර්යයන් රැසක් අතර ප්‍රමුඛත්වය ලැබූ දෙක තුනක් පමණක් මෙහි සඳහන් කරනු කැමැත්තෙමි.

පළමුවෙන් ම තෝමස් කුරේ හිමිපාණන්ට සිදු වූයේ විදේශීය පූජවරුන් ගේ සහයෝගය දිනා ගෙන දේශීය පූජකවරුන් හා විදේශීය පූජකවරුන් එක් සිතැති සමඟි ව වැඩ කරන කණ්ඩායමක් ලෙස මෙහෙය වන්නට යි. මේ කාර්ය එතුමෝ ඉතා උපායශීලිව ඉටු කළෝ ය.

මසෝන් අගරදගුරු හිමිපාණන් ගෙන් ඉක්බිති එම තනතුරට අනුප්‍රාප්තිකයා වශයෙන් පත්වනු ඇතැයි බොහෝ දෙනා අපේක්ෂා කළ ගරු ජෙරාඩ් ෆෝර්ටින් නි.ම.නි. පියතුමන් තමන් ගේ ප්‍රධාන අනුනායක වශයෙන් පත් කැර ගත්තේ ය. එතුමන් පෙර දැරූ තනතුරට හෙවත් සා. බර්නාඩ් දෙව්සත්හලේ අධ්‍යක්ෂ ධුරයට ගරු මාර්ටින් ගුණරතන පියතුමන් පත් කළේ ය. තව ද අගරදගුරු වසමේ අමතර පරිපාලනය සඳහා අතිගරු ඩී. ජේ. නික්ලස් පෙරේරා පියතුමන් ද (රජය සමඟ සම්බන්ධතා) අතිගරු පීටර් ඒ. පිල්ලේ පියතුමන් ද (අධ්‍යාපන කටයුතු) සඳහා එතුමෝ පත් කැර ගත්හ. මෙයින් සිංහල, දමිළ ප්‍රංස ආදි ජාති තුනට ම අයත් පියවරු එක් රැස් කැර ගැනීමේ මාර්ගය නව අගරදගුරු හිමි වෙත පැහැදිණි.

පෘතුගීසීන් මේ රටේ කලක් දහම ප්‍රචාරය කළත් රජ කුමරුන් දෙ තුන් දෙනකු හැර අන් කිසිදු හෙළ දරුවකු පූජකවරය සඳහා පුහුණු කළේ නැත. මේ නිසා සිදු වූයේ ඕලන්දයිනට ඔවුන් පරාජ වී පලා ගිය පසු මෙ රට කතෝලික ගිහි පිරිස අනාථ වීම යි. මෙය හොඳින් දැන සිටි තෝමස් කුරේ හිමිපාණෝ මතු දාක මෙ රට වෙසෙන විදේශීය මිශනාරිවරුනට ද එවැනි ම ඉරණමක් උදාවිය හැකි බව වටහා ගෙන සිටියෝ ය. එසේ ම තමා ද නිමල මරිය නිකායට අයත් පියතුමකු ව සිටි නමුත් එතුමන්ලා ධර්මදූත කටයුතු සඳහා නව ක්‍රියා ප්‍රදේශ බලා ලොව පුරා යා යුතු බව හොඳින් වටහා ගෙන සිටියෝ ය. මේ කරුණු මත අනාගතය සඳහා දේශීය පූජක පරපුරක් බිහි කළ යුතු බවත් ඒ අතර වැඩියක් ම පදවි සේවාව සඳහා පදවි පූජක පියවරුන් රැසක් පුහුණු කළ යුතු බවත් වටහාගෙන එය අරමුණ කැර ගත්තේ ය.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**
**85**

නව අගරදගුරු හිමිපාණෝ පත්වීම් ලබා දෙ වසරක් පිරෙන්නට පෙර කොළඹ පූජක සිසු හල විශාල කිරීම සඳහා පියවර ගත් හ. එහි ඇති දෙව්මැඳුරට දකුණු කොටස සඳහා මුල්ගල තබන ලද්දේ ක්‍රි.ව. 1950 මාර්තු මස 7 වැනි දා ය. මේ අතරතුර දේව කැඳවීම් වර්ධනය කිරීම සඳහා එතුමෝ ඒ ගැන තමන් ගිය මීසම් රැසක දේශන පැවැත්වූහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රි.ව. 1950 දී සාන්ත ඇලෝසියස් පූජක සිසු හලේ සිසුන් සංඛ්‍යාව දෙසීය ඉක්ම විය. ක්‍රි.ව. 1951 නව ගොඩනැගිල්ල සූදානම් වන තුරු කුඩා සිසුන් කණ්ඩායමක් මග්ගොන සාන්ත වින්සෙන්ති නිවෙස අසල තිබුණු ශාඛාවේ රඳවා තබන ලදි. තවදුරටත් හෙළ පූජක සංඛ්‍යාව සහ දේව කැඳැවීම් වැඩි කරගනු වස් “මරිය වසර” ලෙස සලකනු ලැබූ ක්‍රි.ව. 1954 අගෝස්තු මස “රන් පළඳාව” නමින් විශාල දේව කැඳැවීම් ප්‍රදර්ශනයක් පවත්වන ලදි. මෙය පැවැත්වුනේ කොළඹ සාන්ත ජෝසප් විදුහල් භූමියේ ය.

ඈත අතීතයේ දී පූජකවරයකු වීම සඳහා පැවිදි නිකායක් ම තෝරා ගත යුතුය යන දුර්මතය පැවැතියේ ය. කොළඹ රදගුරු වසම තුළ එය පැවැතියේ නිමල මරිය නිකායේ පියතුමකු විය යුතුය යනුවෙන් ය. මෙ වැනි දුර්මත පොහොණි කළ පියවරුන් ද නො සිටියා නො වේ. එහෙත් තමන් ද පැවිදි නිකායකට අයත් ව සිටියත් සභාවේ උන්නතිය නිකායේ වාසියට ඉහළින් සලකන්නට තෝමස් කුරේ අගරදගුරු හිමිපාණෝ පුළුල් මනසකින් යුක්ත වූහ. ඒ අනුව උන්වහන්සේ ගේ පූර්ණ සහයෝගය දැක්වූයේ පදවි පූජකවරය ගැන කරුණු හෙළි කැර දීම සඳහා යි. එයින් කොළඹ පමණක් නො ව මුළු දිවයින පුරාම පදවි පූජක සංකල්පය ව්‍යාප්ත විය.

මෙම දූරදර්ශී ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ පූජක කැල ශීඝ්‍ර දියුණුවක් ලැබුවේ සංඛ්‍යාව අනුව පමණක් නො ව උගත් කමින් ද බව පිළිගත යුතු වේ. කොළඹ පදවි පූජකවරුන් කොළඹට මෙන් ම හලාවත, ගාල්ල, බදුල්ල, කුරුනෑගල, රත්නපුර සහ අනුරාධපුර රදගුරු වසම්හි රදගුරු තනතුරු සඳහා තෝරා පත් කැර ගැනීම මෙම සාර්ථකත්වයට සාක්ෂි නො වන්නේ ද?

පූජක සිසු හලට සමගාමීව සා. බර්නාඩ් දෙව්සත් හලේ ද ගොඩනැගිලි මදක් ව්‍යාප්ත කරන ලදි. අවසානයේ ක්‍රි.ව. 1955 සැප්තැම්බර මස පූජක සිසුන් 42 ක් සමඟ දෙව්සත්හල නුවර අම්පිටියට ගෙන ගොස් එහි ජාතික දෙව්සත් හල ස්ථාපිත කළෝ ය. ක්‍රි.ව. 1976 සැප්තැම්බර මස තෝමස් කුරේ කාදිනල් හිමිපාණන් සමුගන්නා විට කොළඹ අගරදගුරු වසම තුළ පදවි පූජකවරුන් සංඛ්‍යාව ..... දක්වා දියුණු වී තිබිණි.

දේශීය පූජක පරපුරක් බිහි කිරීම මෙන් ම සභාව දේශීයකරණය කැර ජනතාවට සමීප කැර වීම ද තෝමස් කුරේ අගරදගුරු හිමිපාණන් ගේ අරමුණ විය. ඉන්දීය ඔරතෝරියාන පියවරුන් යටතේ ලැබූ හෙළ නැඹුරුව යුරෝපීය ආභාෂයෙන් වෙනස් වී යාම ඇතැම් කරුණු සම්බන්ධයෙන් කණගාටුවට හේතු වූවත් ඒ සියල්ල සැණෙකින් ආපසු හැරවීම පහසු කාරියක් නො වීය. එහෙත් විවෘත මනසකින් හා ප්‍රඥාවෙන් යුතුව එතුමෝ ඒ දේ ක්‍රමවත් ව කළෝ ය.

යුරෝපීය සංස්කෘතික ලක්ෂණ එවකට කතෝලික උත්සවයන් හි දී රජ කළ බව නො රහසෙකි. මඟුල් බෙර, උඩරට නැටුම්, ගොබ් කලා, දේශීය සැරැසිලි යනාදිය හුදෙක් බෞද්ධ හා හින්දු ආගමික උත්සවයනට ම සීමා විය. මේවා දෙව්මැඳුරට පිවිසියේ අප පළමු හෙළ අගරදගුරු හිමිපාණන් ගේ අවසරයෙන් ම ය.

බොහෝ දෙනා නොදැන සිටියත් තෝමස් කුරේ කාදිනල් හිමිපාණෝ සභාව තුළ හැකි තාක් ධන - නිධාන භේදය තුරන් කරන්නට පියවර ගත්හ. යුරෝපා සමාජ ක්‍රමයෙන් දෙව්මැඳුර නඩත්තුව සඳහා මිල මුදල් ලබා ගැනීමේ “විසම” ක්‍රමය අපට ද බෝවී තිබිණි. එනම් සල්ලි ගෙවා දෙව් මැඳුරේ බංකු වෙන් කැර ගැනීමේ ක්‍රමය යි. මේ අනුව ඇතැම් ධනවත් පවුල් සඳහා ස්ථාන වෙන් කැර තිබුණු අතර ඔවුන් පමා වී පැමිණියත් ඔවුනට ඒ තැන් හිමි විය. මෙම ක්‍රමය නව අගරදගුරු හිමිපාණන් ගේ දැඩි අප්‍රසාදයට හේතු විය. මේ නිසා බොහෝ බලවතුන් ගේ හා ධනවතුන් ගේ ද බලවත් විරෝධය මැද එතුමෝ එම ක්‍රමය අහෝසි කැර දැමුවෝ ය.

මීගමුවේ ධීවර ජනතාව ගේ අසරණ තත්ත්වය ගැන අගරදගුරු තෝමස් කුරේ හිමිපාණන් ගේ අවධානය යොමු වූයේ මුල් කාලයේ දී ම ය. ඔවුනට සෙත සැලැසීම සඳහා පූජක තුමකු කැනඩාවේ ඇන්ටිගොනිෂ් සරසවියට යවා පුහුණු කැර නව ධීවර ක්‍රම මීගමු ජනතාවට හඳුන්වා දුන්හ. වැල්ල වීථියෙන් ආරම්භ වූ ඒ පරිවර්තනයේ ප්‍රතිඵලයක් වශයෙන් පළමු වරට නයිලෝන් ධීවර දැල් දිවයිනට හඳුන්වා දෙන ලද්දේ මීගමුවෙන් ය.

කාදිනල් කුරේ හිමිපාණන් ගේ දිරි ගැන්වීම ඇතිව ක්‍රියා කළ ගරු ජී. ජෝසප් ප්‍රනාන්දු පියතුමා තව දුරටත් මෝටර් සවිකරන ලද බෝට්ටු සහ තෙප්පම් ධීවරයිනට හඳුන්වා දුන්නේ ය. මෙයින් මෙරට ධීවර කර්මාන්තය විශාල ප්‍රගතියක් ලැබූ බවත් පැරැණි “මාළු රේන්ද ක්‍රමයේ” ගැති වී සිටි මීගමු ධීවරයිනට විශාල ආර්ථික ප්‍රගතියක් ලැබීමේ අවස්ථා උදා වු බවත් කිව යුතුයි. මෙසේ තවත් බොහෝ දේ ලියන්නට ඇතත් ඉඩකඩ අප සීමා කරයි. එම නිසා මෙයින් නිම කරමු.

අති උතුම් තෝමස් කාදිනල් කුරේ උතුමාණන් සැම අතින් ම යුග පුරුෂයකු යැ යි කිව හැකි ය. එතුමෝ සුපේශල ශික්ෂාකාමියෙන් සහ ධර්ම විනය ගරුත්වයෙන් ජීවත් වූහ. උන්වහන්සේ ගේ සබා සේවාව මෙන් ම ධර්ම ශාස්ත්‍රිය සේවාව ද නො මැකෙන රන් අකුරෙන් ලක් ඉතිහාසයේ ලියැවෙනු ඇත.

කලා සංග්‍රහය

# කණ්ඩායම් සංගීතයෙන් දෙසවන් පිනවූ ජෝ. බී. පෙරේරා

**මුලු ගතම වෙහෙසුනා - දහදියෙන් නැහැවුනා කුසගින්න නිවා ගන්න - මෙමා යකඩ තලන්නා...** මේ කණ්ඩායම් ගීතය 60 දශකයේ පටන් දශක 5 ක් පුරාවට, එනම් අදටත් සුවහසක් ප්‍රේක්ෂකයන් අතර ඉතාමිත ජනප්‍රියවූ ගීතයකි. ගත වෙහෙසවා වැඩ කරන දුගී කම්මල්කරුවාගේ දුගී දුක්බර ජීවිතය පිළිබඳ චිත්ත රූප මැවීමට සමත් එම ගීතය රචනය කරමින්ද, සුමිහිරි සංගීතය එක් කරමින්ද, ගයන එම ගීතයේ, නිර්මාතෘ ජෝශප් බෙනඩික් පෙරේරා මහතාය. දක්ෂ ගීත රචකයකු, වාදකයකු ගායන ශිල්පියකු ලෙස සුපතල ඔහු කවුරුත් හඳුන්වන්නේ ජෝ. බී. පෙරේරා යනුවෙනි.

ශ්‍රී ලංකාවට පළමුවෙන්ම ලතින් ඇමරිකානු සංගීත ශෛලීය හඳුන්වා දෙමින් සංගීත ක්ෂේත්‍රයට නව මුහුණුවරක් එක්කළ ජෝ. බී. පෙරේරා මීගමු පුරවරයේ "මීමැස්සෝ" නමින් ප්‍රකට සංගීත කණ්ඩායමේ නිර්මාතෘ මෙන්ම කණ්ඩායම් නායකයාද වේ. සිය කටහඬ අපිරිමිතවූ ඉසව් ගවේෂණය කරමින් මීමැස්සෝ සමඟින් ජෝ ගැයූ මාලගිරව්, ටිකිරිමලී, අත්පුඩි පුඩි පුවත්තා ඇසළ පෙරහැර, සිරිපා ගමන, සුදුමල, ඕපදූප, සහල් තියෙන්නේ කොයිකොයි දේසේ, මීගමු මීමැස්සෝ අපියි ආදී ගීත සුවහසක් ශ්‍රාවක ප්‍රේක්ෂකයන්ගේ සිත් පිනවීමට සමත්වී ඇත. එපමණක් නොව ගුවන් තරංගමාලා අතරේ රැව්දෙන ළයාන්විත ගී ස්වරයක් ඔහු සතුය.

මේ සංගීතයට ඔහු උපයෝගී කොට ගත්තේ බොක්ස් ගිටාරය, කොන්ගෝ ඩ්‍රම්ස්, ශ්වේරෝ, මකරාස් වැනි භාණ්ඩ කිහිපයකි. ඔහු ස්පැනිෂ් ගිටාරය වයමින් කණ්ඩායම මෙහෙය විය. ජෝන්ස් පෙරේරා, රෙජී පෙරේරා වන තම සහෝදරයන් දෙදෙනා ඇතුලුව, ස්ටැන්ලි පෙරේරා, සිසිල් පෙරේරා. ෂර්ලි පෙරේරා, ගාමිණී ප්‍රනාන්දු යන 7 දෙනෙකුගෙන් මෙම කණ්ඩායම සමන්විතය. අනිකුත් සංගීත කණ්ඩායම් වල ඇති බටහිර නම්වලින් වෙනස්ව "මීමැස්සෝ" යන සිංහල නමකින් ඔහුගේ කණ්ඩායම හැඳින්විය. ඔවුනට සංගීත ප්‍රසංග, ප්‍රිය සාදවලට ඇරියුම් ලැබුණු අතර, 2000-2002 වසරවල ඕමාන්, ඩුබායි යන මැද පෙරදිග රටවල් වල සංචාරය කරමින්, ඔහු ප්‍රසිද්ධ සංගීත සංදර්ශන කිහිපයකටම සහභාගී විය. මේ වන විට නව තාක්ෂණය යටතේ 86 වසරේදී කැසට්පට 2 ක් හා 1996 වසරේදී සී. ඩී. සංයුක්ත තැටියක්ද මඟින් වත්මන් ගීත රසිකයන්ට තම ගීත දායාද කොට ඇත. අංග රැසකින් කලා ක්ෂේත්‍රයේ නිපුණතා පළ කළ ඔහු රංගනයෙන්ද දස්කම් පෑ අයෙකි. 60 දශකයේ අවසාන භාගයේදී රසාංජලී කලා සංගමය සංවිධානය කළ, ලෙස්ලි බොතේජු මහතා අධ්‍යක්ෂණය කළ 'එසේය අපි ඔහු මැරුවෙමු' පාස්කු නාට්‍යයේ රඟ පෑමෙන් ඔහු ජනප්‍රිය නලුවා බවට පත්විය.

මූල්‍ය ආයතනයක විධායක නිලධාරී තනතුර හෙබවූ ඔහු 1957 දී ලංකා බැංකුවට එක්විය. දිවයිනේ විවිධ ලංකා බැංකු ශාඛාවල සේවය කළ ඔහු විශ්‍රාම ගියේ කොළඹ ලංකා බැංකු මූලස්ථානයේ අභ්‍යන්තර ගණක අංශයේ කළමණාකරු වශයෙන් සේවය කරමින් සිටියදීය. 1969 වසරේදී විවාහ දිවියට පිවිසි ඔහුගේ ආදරණීය බිරිඳ ප්ලෝරන්ස් පෙරේරා මහත්මියයි. ඇය අද විශ්‍රාමිකය. ඔවුන් දෙපලට පුතුන් දෙදෙනෙකු හා එක් දියණියක් සිටී. වැඩිමහල් දරුවන් විවාහවී සිටින අතර, ඔහු සිය බිරිඳ ප්ලෝරන්ස් හා බාල පුතුනුවන් සමඟ මිනුවන්ගොඩ පාරේ, උඩුගම්පල, ශාන්ත පීතර විද්‍යාලය ඉදිරිපිට පිහිටි 'වසන්තය' නමැති සොඳුරු නිවහනේ විශ්‍රාම සුවයෙන් පසුවෙයි. මේ දිනවල ඔහු අසනීප ගතියෙන් පෙලෙන නිසා දුර බැහැර ගමන් වලින් වැළකී සිටී.



සංගීත ක්ෂේත්‍රයට මෙවැනි සේවාවක් කිරීමට ලැබීම ගැන මං අද සතුටු වෙනවා. මේ සියල්ල මට ලැබුණේ දෙවි පියාණන්ගෙන්. මට ලැබුණ තලෙන්තු වලට දෙවිපියාණන්ට නිරතුරුවම ස්තූති ප්‍රශංසා කරනවා.

**පද්මිණී නානායක්කාර**

# 35 වන සිග්නීස් (OCIC/UNDA) උත්තමාචාර උලෙළ සම්මාන ප්‍රතිඵල සටහන

| සම්මාන විශේෂය | සිනමා සම්මාන | චිත්‍රපටය | සම්මානය |
|---|---|---|---|
| කුසලතා සහභාගීත්වය | සේමිනි ඉද්දමල්ගොඩ | සුදු හංසි | සහතික |
| | ජයනාත් ගුණවර්ධන | සුවඳ දැනුනා ජීවිතේ | සහතික |
| | බිමල් ජයකොඩි | ඉර හඳ යට | සහතික |
| | රොජර් සෙනෙවිරත්න | දකින දකින මල් | සහතික |
| | ශාමිලා නිමන්ති | විදු | සහතික |
| | ලාල් හරින්ද්‍රනාත් | සුවඳ දැනුනා ජීවිතේ | සහතික |
| නිර්මාණශීලි කලා අධ්‍යක්ෂණය | මංජුල අයගම/ අතුල ලියනගේ | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි ශබ්ද පරිපාලනය | අරුණ ප්‍රියන්ත කලුආරච්චි | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි අංග රචනය | ප්‍රියන්ත දිසානායක | ඉර හඳ යට | ස්වර්ණ |
| නිර්මාණශීලි සංගීතය | කසුන් කල්හාර ජයසේකර | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි සංස්කරණය | අජිත් රාමනායක | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි ගීත රචනය | අශෝක හඳගම | | ස්වර්ණ |
| | "මගේ ලෝකයට වීරයෙක්" | විදු | රජත |
| නිර්මාණශීලි ගායනය | උරේෂා රවීහාරි "අහස හැඩුවා" | උත්තරා | ස්වර්ණ |
| නිර්මාණශීලි කැමරාකරණය | ත්‍රිශූල දීප තඹවිට | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි තිර රචනය | අතුල ලියනගේ | බඹර වළල්ල | රජත |
| නිර්මාණශීලි සහය නළුවා | ශ්‍රියන්ත මෙන්ඩිස් | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි සහය නිළිය | ජයනි සේනානායක | ස්තුතියි නැවත එන්න | ස්වර්ණ |
| නිර්මානශීලි රංග කුසලතා (පුරුෂ) | මහේන්ද්‍ර පෙරේරා | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි රංග කුසලතා (වනිතා) | දමිතා අබේරත්න | දකින දකින මල් | රජත |
| නිර්මාණශීලි අධ්‍යක්ෂණය | අතුල ලියනගේ | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි චිත්‍රපටය | බඹර වළල්ල | බඹර වළල්ල | ස්වර්ණ |
| නිර්මාණශීලි සහය අධ්‍යක්ෂක | ඩොනල්ඩ් ජයන්ත | - | ලෝකඩ |
| හොඳම නිෂ්පාදන කළමණාකරු | අශෝක ආරියරත්න | - | ලෝකඩ |

| සම්මාන විශේෂය | ටෙලි සම්මාන | ටෙලි නාට්‍යය | සම්මානය |
|---|---|---|---|
| කුසලතා සහභාගීත්වය | හරිදු රංගජිත් අබේසූරිය | තක්ෂලාව | සහතික |
| | ඊෂානි යසෝධා රංගනාත් | යස ඉසුරු | සහතික |
| | මනෝජ් වික්‍රමසිංහ | දෙගංමැදියාව | සහතික |
| නිර්මාණශීලි කලා අධ්‍යක්ෂණය | පිරිනොනැමේ | - | |
| නිර්මාණශීලි ශබ්ද පරිපාලනය | නිලන්ත ප්‍රදීප් කුමාර | ඇබෑර්තු ඇත | රජත |
| නිර්මාණශීලි අංග රචනය | පී. ඩී. නන්දසේන | ඇබෑර්තු ඇත | රජත |
| නිර්මාණශීලි සංගීතය | රෝහණ වීරසිංහ | ඔබ කවුද | ස්වර්ණ |
| නිර්මාණශීලි සංස්කරණය | විශ්ව රංග සුරේන්ද්‍ර | දියමත රුව | රජත |
| නිර්මාණශීලි ගීත රචනය | ගයා රම්‍ය අල්විස් "සංසාරේ" | යස ඉසුරු | ස්වර්ණ |
| නිර්මාණශීලි ගායනය | සමන් ලෙනින් /ඊෂානි යසෝධා "සංසාරේ" | යස ඉසුරු | ස්වර්ණ |
| නිර්මාණශීලි කැමරාකරණය | පිරිනොනැමේ | - | - |
| නිර්මාණශීලි තිර රචනය | පිරිනොනැමේ | - | - |
| නිර්මාණශීලි සහය නළුවා | ජගත් මනුවර්ණ | තක්ෂලාව | රජත |
| | සුමින්ද සිරිසේන | ඇබෑර්තු ඇත | ස්වර්ණ |
| නිර්මාණශීලි සහය නිළිය | මාධනි මල්වත්තගේ | ඇබෑර්තු ඇත | රජත |
| | හිමාලි සයුරංගි | ඔබ කවුද | ස්වර්ණ |
| නිර්මාණශීලි රංග කුසලතා (පුරුෂ) | මහේන්ද්‍ර පෙරේරා | තක්ෂලාව | ස්වර්ණ |
| නිර්මාණශීලි රංග කුසලතා (වනිතා) | පිරිනොනැමේ | - | - |
| නිර්මාණශීලි අධ්‍යක්ෂණය | පිරිනොනැමේ | - | - |
| නිර්මාණශීලි චිත්‍රපටය | පිරිනොනැමේ | - | - |
| නිර්මාණශීලි සහය අධ්‍යක්ෂක | රොෂාන් කුරුප්පු | | ලෝකඩ |
| හොඳම නිෂ්පාදන කළමණාකරු | රාජා රණසිංහ | | ලෝකඩ |

**නිර්මාණශීලී ඒකාංගික ටෙලි නාට්‍ය නිර්මාණයන් සඳහා ප්‍රදානය කෙරෙන විශේෂ සම්මාන**
ආනන්ද අබේනායක
අනුරුද්ධ ජයසිංහ
චාමර ජයවීර
අනෙකුත් සම්මාන
**සිරිල් බී. පෙරේරා අනුස්මරණ සම්මානය**
බුද්ධදාස ගලප්පත්ති
**ජයවිලාල් විලේගොඩ අනුස්මරණ සම්මානය**
යු. එන්. අනුරාජ් ඉලංග විජේරත්න
**සිග්නීස් වාර්ෂික අන්තර් ජාතික ප්‍රණාම ත්‍රිත්වය**
සනත් ගුණතිලක, රෝයි ද සිල්වා, චරිතා ප්‍රියදර්ශනී
**නිර්මාණශීලි වාර්තා චිත්‍රපටය**
සුදත් මහදිවුල්වැව
("වැල්ලට දෙවියෝ ඇවිත්")



**නිර්මාණශීලි කෙටි චිත්‍රපටය**
සීමා (සුජීව ගුණරත්න)
**නිර්මාණශීලි සංගීත වීඩියෝව**
චමිල් පතිරණ
("අපි හමුවුනොතින්")
**නිර්මාණශීලි වෙළෙඳ දැන්වීම**
සුදත් මහදිවුල්වැව
("අවුරුද්දට ගමේ ඇවිල්ලා - ඩයලොග්")
**නිර්මාණශීලි පූර්ව ප්‍රචාරක පටය**
සසංක දිපාල් අමරවීර
("ආදරණීය යෞවනය")
**නිර්මාණශීලි නාමාවලිය**
සසංක දීපාල් අමරවීර
("ඉසුරු භවන")



ශුද්ධවර අන්තෝනි මුනිතුමන් පිළිබඳව ලියැවුණු නවතම ග්‍රන්ථය වන සාන්ත අන්තෝනි උදානය එහි කතුවර විශ්‍රාමලත් විදුහල්පති ජෝන් ඇන්තනි ප්‍රනාන්දු මහතා විසින් කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙත පසුගියදා පිළිගන්වන ලදී. අගරදගුරු පදවි විශේෂ ව්‍යාපෘති භාර කලාපීය නාහිමි අතිගරු අයිවන් පෙරේරා පියතුමා හා කතුවරයාගේ බිරිඳ කමලා ප්‍රනාන්දු මහත්මියද මෙහි වෙති.

## ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 186

### යාච්ඤාව

ප්‍රංච, මංචක, වංචාව, සංචාර යන වචනවල දැන් බින්දුව තිබුණද ඉස්සර නම් ඤ යන්න යෙදිය යුතුය. එහෙත් යාච්ඤාවේ නම් අමුතු අකුරු පෙරළියකි. සංස්කෘත වචනයක් වූ යාච්ඤාවට භික්ෂාව සමානාර්ථ වේ. භික්ෂු යනුත් සත්තකින්ම යාචක යනුයි. යාච්ඤාව යටපත් පහත් බැගෑපත් ආයාචනයක් බව පැහැදිලිය. හිඟමනින් ලද ආහාරයටත් භික්ෂාව යයි කියැවේ.

යාච්ඤාව එහි අකුරු අනුවම ශබ්දවිය යුතුය. එහි කයනු, ග යනු ජයනු නැත්තටම නැත. යාඥව නම් වචනයක් නැත. යාගයට නම් යඥය කියා වචනයකි. ජ්+ඤ=ඥ ලෙස ලියනුයේ මේ සංයුක්ත අක්ෂරයේ සංස්කෘත රූපය අනුකරණයෙනි. ඊට 'ග' යන්න සම්බන්ධ නැත. ප්‍රඥා, ප්‍රතිඥා, ආඥා, අනුඥා (අවසරය), සංඥා, අවඥා, ප්‍රඥප්ති, අඥාන යන තැන්වල ජ්ඤ ලෙස ශබ්ද වුණද ඥාන, ඥාති කියද්දී එසේ ශබ්ද නොවෙන්නේ දුෂ්කර නිසාය.

ඒ පුරුෂ තෙමේ බිම වැද හෙව නමස්කාර කරන්නේ නිබඳව යාච්ඤා කළේය. ඔහුගේ අතුරක් නැතිව කරන යාච්ඤාව වළකාගත නොහෙනසේක් (එළු අත්තනගලු වංශය) මා නිදහස් කරන්ට යයි ඔහුට යාච්ඤා කරන්ට මම සතුටු නැහැ. (මාටින් වික්‍රමසිංහ සූරීන්ගේ මිරිඟුව 1925)

වර්තමාන ව්‍යවහාරයේ යාච්ඤාව අභාවයට ගොසිනි. කිතුනු වහරට සීමාවු යාච්ඤාව ක්‍රිස්තියානි ජනතාවගේ පරම භාෂා උරුමයක් තරමය.

ශුද්ධ බයිබල පරිවර්තනයේ යාච්ඤා කළා යයි කිව යුතු තැන්වල කන්නලවු කළා, ආයාචනා කළා, ඉල්ලුව, යැදුවා යයි යෙදෙන්නේ යාච්ඤාවට ලැබිය යුතු විශේෂ වූ උත්කෘෂ්ට ස්ථානයට ඉඩ තබමිනි.

ඔබේ සැදැහැවත්තු විපතේදී ඔබට යාච්ඤා කරත්වා. (ගීතා 32:6)

ඔබට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරන්න.
(මතෙව් 5:44, ලූක් 6:28)

උන්වහන්සේ උදෑසන වේලාසන අවදිව කාත් කවුරුත් නැති තැනකට වැඩමකර හුදෙකලාව යාච්ඤා කළ සේක. (මාක් 1:35)

148




ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු

යන්නෙ කොයිද පොල් මල්ලේ පිරිලා
බිම ගියාට හැට වඳුරට පිරිලා
ගහට ගිහින් රට තණකෙල කපාලා
ගහේ කුටුම පිහියෙන් උල් කරාලා

අමාවකට පුන්සඳ හිනැහුනාදෝ
අමා වතුර කාණු දිගට ගලා ගියා දෝ
අමා රසය වමනෙට හැරුනාදෝ
අමා දහම වලපල්ලට ගියා දෝ

**ගායනය : නිවන් (දම) අමා ශාන්ත**

# වියතුනි දෙන්න අත !

**(ජාතික කතෝලික ලේඛක හවුල නොවැ 6 දින පවත්වන කතෝලික සාහිත්‍ය උත්සවය වෙනුවෙනි.)**

නැණරුත් පහන කන්තෝරුව පියස යට
අපි හමුවුනෙමු පෙර විසිහය වසර කට
කතිකා කෙරුණි මතු ලේඛක දියුණු වට
නව මං පැදුණේ එහෙමයි හවුල කට

ජාතික කතෝලික ලේඛක හවුල නමින්
එය බිහිවුණා නද කිංකිණි රබන් හඬින්
තරුණන් තරුණියන් ඇඳුනා සතර දිගින්
පර්ෂද මට්ටමෙන් බැඳුනා වැඩට තොසින්

වැඩිහිටි යොවුන් සමඟින් ළමයින්ද කුඩා
පෙළ ගස්වමින් ආ ගමනෙකි නොදැනි විඩා
මැසිවිලි කිසිත් නොකියමු නාහෙන් දොඩා අඬා
සැලකිය යුතු නේද හවුලට මෙයිට වඩා

සාහිත දියුණුවේ දියුණට දෙන්න හිත
දැ හිත පෙමින් බැඳි පිරිසක් බිහිව ඇත
ජාතික කතෝලික ලේඛක හවුල වෙත
ශාසන ආලයෙන් වියතුනි දෙන්න අත

ජාතික කතෝලික ලේඛක හවුලේ ගිහි අනුශාසක
**කලාභූෂණ මොරිස් බොල්ලෑගල**

බැසිල් ෆොන්සේකා විසිනි

# අකුණු ගහන ධාරානිපාත වැස්සේ සුදොතුම් පියා නොසැළී සිටියා

ප සුගිය අගෝස්තු මාසයේ ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් හි පැවැති තාරුණ්‍ය දිනැ එළිමහන් යැදුම පවත්වද්දී අකුණු පුපුරා මහා ධාරානිපාත වැස්සක් ඇද හැලුණා.

ලක්ෂ 20 ක් තරුණ තරුණියන් සහභාගි වූ එම අවස්ථාවේදී අති උතුම් XVI බෙනඩික්ට් ශුද්ධොත්තම පියා ඔවුන් සමඟ නොසැළී රැඳී සිටි අයුරු මාධ්‍යවේදීනි 26 හැවිරිදි එරිකා රිවේරා පසුගියදා ලෝක මාධ්‍යයට අනාවරණය කළා. අකුණු සහිත වාර්තාගත මහා වැස්සේ සුදොතුම් පියා නොසැලී ප්‍රීති මුහුණින් සිටි ස්ථානයේම රැඳී සිටි බැව් එරිකා විසින් පවසා ඇත. අභියෝගාත්මක අකුණු සහිත මහා වැස්ස නිසා ශුද්ධෝත්තම පියාගේ ආරක්ෂාව තකා වැස්ස පායන තෙක් එතැනින් ඉවත්ව සිටින ලෙසට සංවිධායකයෝ 'ශුද්ධෝත්තම


© Getty Images

පියාගෙන් දෙතුන් වරක්මැ ඉල්ලා සිටියෝය. එතුමා වචනයෙන් හා සංඥාවෙන් එකමුතු යැදුමට ප්‍රීති නැටුමේ යෙදී සිටි තරුණ තරුණියන් සමඟ සිටින්නේ යයි ප්‍රකාශ කළ බැව් එරිකා මාධ්‍යවේදිනිය සියලුම තරුණ තරුණියන් වෙනුවෙන් ලොවට ප්‍රකාශ කරන්නීය, ශුද්ධෝත්තම පියාණන් විසින් ප්‍රීතියෙන් හෙළිදැක්වූ දේවාරක්ෂාවේ සාක්ෂිය ජීවිතය පුරා දිවෙන එකක් බවට පත් වූ බව පවසන එරිකා මාධ්‍යවේදිනිය මෙලෙස ද ප්‍රකාශ කළා. "මා මෙන් සහභාගි වූ සියලු තරුණ තරුණියන් විසින් ද ජීවිතය පුරා ගෙන යා හැකි පණිවුඩයක් එතුමා ප්‍රකාශ කළා. අකුණු හා විදුලිය රැගත් නොවූ විරූ වර්ෂාවකින් ඇති වූ බිය සැක මොහොතකින් පහව ගියා. පුදුමයකට මෙන් කඩා වැටුණු මහා වැස්ස පැය භාගයකින් පමණ නතර වූවා. "එවිට ශුද්ධෝත්තම පියා මෙලෙස පැවැසූ බැව් ඈ වාර්තා කරයි. තාරුණ්‍යයේ ජවය මහා වැස්සකට වඩා බලගතුයි. වැස්ස මෙන් ආසිරි වැසි වලින් ඔබ හැම නාවන්නට ජේසුස් වහන්සේ සූදානම්." එවිට සියල්ලෝ ඔල්වරසන් දුන්හ.

# හොංකොං හි කාදිනල් හිමියෝ උපවාසයක

හොංකොං හි කතෝලික පාසල් පිළිබඳ පාලනය රජයට ගැනීම සඳහා පසුගියදා එම රජයේ අභියාචනා අධිකරණය විසින් තීන්දුවක් දී තිබිණි. එ අනුව කතෝලික පාසල් වල පරිපාලනය ද රජය යටතට පත්වීම සිදුවන හෙයින් කතෝලික ජනතාව සන්තාපයට පත්ව සිටිති.

එම තීරණය කෙරෙහි කණගාටුව ප්‍රකාශ කරනු වස් කාදිනල් ජෝශප් ෂෙනි ෂෙකියුන් හිමිපාණෝ ඔක්තෝබර් මස 19-21 දක්වා උපවාසයක නිරතව සිටියහ. "පාසල් රජය පාලනයට ගැනීමට එරෙහිව කතෝලික ජනතාව වෙනුවෙන් මගේ පෞද්ගලික උපවාසයෙන් කණගාටුව ප්‍රකාශ කරමු. උපවාස කාලයේ සියලු වර්ග යේ ආහාර ගැනීමෙන් තොරව පානීය ජලය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පමණක් ලබාගනියි. 80 හැවිරිදි කාදිනල් තුමන් එලෙසින් ප්‍රකාශ කරනු ලැබුවේ, උපවාසය ආරම්භ කිරිමට පෙරාතුව රැස්ව සිටි 50 කට අධික පුවත්පත් වාර්තා කරුවන් අමතමිනි. එම කණගාටුව ප්‍රකාශ කිරීමේ උපවාසය පවත්වන ලද්දේ කාදිනල් තුමා වෙසෙන ස්ථානයේ දොරටුව අසලය. කතෝලික ස්වෙච්ඡා පිරිසක් ද එතුමා වටා එක්රැස්ව සිටියහ. උපවාසය ආරම්භ කිරිමට ප්‍රථමයෙන් කාදිනල් තුමන් විසින් අනුශාසනා කරනු ලැබුවේ කිසිදු ජනතා විරෝධතාවයක් නොදක්වන ලෙසටයි. ඒ අනුව එතුමාගේ පෞද්ගලික කණගාටුව ප්‍රකාශ කිරීම හැර වෙනත් ජනතා විරෝධයක් ඇති නොවීය. එතුමා විසින් රජය වෙත ඉදිරිපත් කැරුණු පිටු 10 ක ප්‍රකාශනයේ පෙන්වා දී



තිබුණේ, රජය විසින් කතෝලික පාසල් රජයේ පාලනයට ගැනීම ව්‍යවස්ථා විරෝධී බවයි.

# ඉන්දුනීසියාවේ කතෝලිකයන්ට අන්තවාදී තර්ජන වර්ධනය වේ



ඉන්දුනීසියාවේ රදගුරු මණ්ඩලයේ සභාපති අති උතුම් මාටිනස් සිතුමොරාන් රදගුරු හිමි කතෝලික මාධ්‍යයට පැවැසුවේ, පසුගිය අවුරුදු 10-15 කාල පරාසය තුළ දී ඉන්දුනීසියාවේ කතෝලිකයන්ට එරෙහි මුස්ලිම් අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් වර්ධනය වෙමින් පවත්නා බවය.

ඇතැම් ප්‍රදේශයන් හි පසුගිය කාලයේදී දේවස්ථාන පවා කඩා බිඳ දමා තිබුණි. පසුගිය පාස්කු සමයේදී උග්‍රව පැවැති ක්‍රියාකාරකම් නිසා ඇතැම් ප්‍රදේශයන් හී පාස්කු මෙහෙයන් ද නවතාලීමට සිදුවිය. බොහෝ ඉස්ලාම් නායකයන් මෙලෙස අන්තවාදී මුස්ලිම් වරුන්ගේ හැසිරීම් රටාවට අකමැත්ත දැක්වූවත්, එම පීඩාකාරීත්වයන් වළකාලීම සඳහා ඉදිරිපත් වීමට ඔවුන්ට ද නොහැකි තත්ත්වයක් උදා වී ඇතැයි ද වාර්තා වේ.ඉන්දුනීසියාවේ ජනගහණය මිලියන 245 කි. සියයට 85 ක් ඉස්ලාම් බැතිමත්තු වෙති. ජනගහණයෙන් සියයට තුනක් පමණක් කතෝලිකයෝය. ඉන්දුනීසියාව ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙසින් පිළිගනු ලැබූවත්, ආගමික නිදහස තහවුරු කැරෙන රිතීන් එරටේ ව්‍යවස්ථාවේ අන්තර්ගත වී නොමැත. ඇතැම් සුළුතර ආගමිකයන්ට ආගමික නිදහස තහවුරු කැරෙන ව්‍යවස්ථාවක් සම්මත කර ගැන්මට අවශ්‍ය වූවත් ඒ සඳහා බහුතර සහයෝගය ලැබේද යන්න අතිශය සැක සහිතය. හෙළිවී ඇති කරුණු අනුව කතෝලිකයන් ඇතුලු සුළුතර ආගමිකයන් සඳහා යම් සහන ලබාදීම කෙරෙහි ප්‍රාදේශීය මට්ටමේ අන්තවාදීන් දැඩි ලෙස විරෝධතාවයන් පානා බැව් දැක්වේ. දැනටත් ඉන්දුනිසියාවේ පළාත් 22 කින් අඩක් පාලනය කැරෙන්නේ ඉස්ලාම් ආගමික ෂාරියා රෙගුලාසි වලට අනුකූලවයි. ඒ නිසාවෙන් දේවස්ථානයක් ගොඩ නැගීමට අවසර ලබා ගැනීම පවා දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. මෙම පිඩාකාරී හා අභියෝගාත්මක වාතාවරණය යටතේ වුවද පූජක හා පැවිදි ජීවිත සඳහා කැඳවීම් වැඩිවී ඇති බව ගිහියන්ගේ කැපවීමේ දායකත්වය වර්ධනය වී ඇති බවද මාටිනස් රදගුරු තුමෝ අවධාරණය කරති.

# පැවිදි සොහොයුරියෝ හා පූජකයෝ දිළින්දන් වෙනුවෙන් මැරතන් චාරිකාවක



චීනයේ පැවිදි සහෝදරියෝ 52 ක් ද, පූජකවරු සතර දෙනෙක් ද, පූජකවරයට පුහුණු වන්නෝ කීපදෙනෙක් ද පරෝපකාර කටයුතු සඳහා මුදල් සෙවීමේ අරමුණින්, ඔක්තෝබර් 16 වැනිදා චීනයේ බීජින් නගරය වටා මැරතන් චාරිකාවක නිරත වූහ.

ඒ ඒ කතෝලික සංඝයන්ගෙන් පැමිණි කතෝලිකයෝ 30,000 ක් දෙනා ද ඊට සහභාගිත්වය දැක්වූහ. මැරතන් චාරිකාවට සහභාගි වූවෝ යුරෝ 60.000 ක් පැය කීපයක් තුළදී ලබා ගත්තෝය. ඉරිදා උදේ බීජින් හී පැවැති දිව්‍ය යාගයෙන් පසුව මැරතන් ආරම්භ කරුත. ජනතාව වෙත ගිය තවත් පැවිදි සොහොයුරියෝ පිරිසක් චීන යුආන් 16,000ක් ද එක්රැස් කළහ. බීජින් ජනතාව දානය කළ එම මුදල් වලින් වැඩිහිටියන් සඳහා නිවසක් ද, අනත්දරු නිවසක් ද, වෛද්‍ය මධ්‍යස්ථානයක් ද, මානසික රෝගීන් සඳහා මධ්‍යස්ථානයක් ද තැනෙනා බැව් ප්‍රකාශ විය. පැවිදි සහෝදරියෝ සත් දෙනෙක් ද, එක් පූජක වරයෙක් ද කලින් නිර්ණය කළ පරිදි පැය පහක් ඇතුළත කිලෝමීටර් 42.19 සම්පූර්ණ කළහ. මග දෙපස රැඳී සිටි කිතුනු ජනතාව තරඟකරුවන් වෙත ප්‍රීති සෝෂා පැවැත්වූහ. එවන් මැරතන් චාරිකාවකට එතරම් විශාල පැවිදි සහෝදරියන් සංඛ්‍යාවක් සහභාගිවීමත් සමහරක් දෙනා මුළු කිලෝමීටර සංඛ්‍යාව සම්පූර්ණ කිරීමත් වාර්තාවක් බැව් සංවිධායකයෝ මාධ්‍යයට ප්‍රකාශ කළෝය. තවද දයාව හා කරුණාව අවැසි අසරණ ජනතාව වෙනුවෙන් ක්‍රියා කිරීමේ කතෝලික පණිවුඩය එම කන්‍යා සහෝදරියන් හා පූජක පුතුන් විසින් චීනයේ සිට ලොවට ප්‍රකාශ කර ඇතැයි ද කතෝලික පුවත් වාර්තා කරයි.

# මුස්ලිම් වරුන්ට කිතුනු දහම වැළඳ ගත හැකි සුන්දර භූමියක්

"ප්ලොරෙස්" නම් භූමි පෙදෙස ඉන්දුනීසියාවේ පාලනයට යටත් වේ. එහි වෙසෙන ජනතාවගෙන් සියයට අනූවක් පමණ දෙනා කතෝලිකයෝය. ඉන්දුනීසියාව තුළද එක්තරා ප්‍රමාණයකට කිතුනු පීඩනය පවතී. එහෙත් ඉන්දුනීසියාවට අයත් මෙම පෙදෙසේ කතෝලිකයන්ට කිසිදු බාධාවක් කිරීමේ ප්‍රවණතාවයක් නොපවතී. සෑම වසරක් තුළදීම මුස්ලිම් පිරිස් කතෝලිකයන් වශයෙන් බෞතිස්ම ලබනා බැව් ද වාර්තා වේ. මේ බව කතෝලික මාධ්‍ය වෙත ප්‍රකාශ කරනු ලැබුවේ, "ප්ලොරෙස්" හි රුටෙන්ග් පදවියේ අති උතුම් හියුබර්ටස් ලෙටෙන්ග් නම් රදගුරු හිමිපාණෝය. එතුමාගේ පදවියේ ජනතාවගෙන් සියයට 93 ක් කතෝලිකයන් වන අතර එම සංඛ්‍යාව දසලක්ෂයකි. මෙම පෙදෙසේ ජනතාව අතුරෙන් පූජකවරුන් හා පැවිදි සහෝදරියන් විශාල සංඛ්‍යාවක් වාර්ෂිකව බිහිවන බැව් ද එතුමෝ ප්‍රකාශ කරති. එතුමාගේ පදවියේ පමණක් පැවිදි සහෝදරියෝ 800 කට අධික සංඛ්‍යාවක් සේවයෙහි යෙදී සිටිති. ඉන්දුනීසියාවට අයත් මෙම දේශයේ ඇත්තාවූ ආගමික නිදහස, අනෙකුත් මුස්ලිම් රටවලට පරම ආදර්ශයක් යයි ද වාර්තාවේ.

# දෙවිඳුන් ඇති තැන බලාපොරොත්තුව ඇත ශුද්ධෝත්තම පියා

ජර්මනියේ සංචාරය අවසන් කොට ලහිර් ගුවන් තොටුපොළේ ශුද්ධෝත්තම පියා ජර්මානු ජනතාව මෙලෙසින් ආමන්ත්‍රණය කළේය. "ඇදැහිල්ලේ මංපෙතේ පිය මනිනා ලෙසට මම ඔබ සැමට ආරාධනය කරමි. එවිට ඔබේ ජීවිත ගමන ක්‍රිස්තුන් වහන්සේගේ සුබ වදනින් මල්ඵල ගෙනෙනු ඇත. දැන් දැන් ඒ ඒ තන්හි ඇදැහිල්ලේ කුඩා කණ්ඩායම් මතුවෙමින් පවතී. එම කණ්ඩායම් තුළ දෙවිඳුන් අත්දකිනා විට එමගින් අප තුලින් විහිදෙන ආලෝකය කරා අන් අයද පැමිණෙනු ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ මිත්‍රත්වය හා එතුමන් අන් අයට හඳුනාදීම පරයා යන සුන්දර අත්දැකීමක් තවත් නොමැත. එමගින් උදා වෙන්නේ "දෙවිඳුන් ඇති තැන අනාගතය මතුවීම යි. නව අනාගතයක් මතුවීම යි. තවද නව බලාපොරොත්තු පුහුදුන් වීමයි. එමගින් වර්තමානයෙන් ඔබ්බට නව සිතිජයක් උදාවනු නියතයි. ඒ සුන්දර ඇදැහිල්ල තුළ සිතින් හා වචනයෙන් අත්වැල් බැඳ ගනිමු.

# ඊශ්‍රායෙල් අගමැතිගෙන් වසර 200 ක් වයසැති ඔලිව් ගසක් ශුද්ධෝත්තම පියාට

පැළ සිටවීමේ උලෙළක් ඔක්තෝබර් මස 26 වැනි දින වතිකාන භූමියේ සිදු කිරීමට නියමිත විය, එම පැල සිටවීම අර්ථවත් කරමින් ශුද්ධවු දේශයෙන් වසර 200 ක් වයසැති ඔලිව් ගසක් කිලෝමීටර් 2000 ක් ගෙවා වතිකානයට ලඟා විය. ඇත්තෙන්ම ශුද්ධවු දේශයේ රෝපනය වී වසර 200 ක් පැවැති එම ඔලිව් ගස අති උතුම් XVI වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියා වෙත ත්‍යාග කරනු ලැබ ඇත්තේ ඊශ්‍රායෙල් අගමැති බින්යාමින් නෙතන්යා විසිනි.

අගමැතිවරයාගේ පණිවුඩයේ දක්වා ඇත්තේ එම ඔලිව් ගස ඊශ්‍රායලය හා වතිකානය අතර

මල්ඵල ගැන්වෙන මිත්‍රශීලිත්වයේ සංකේතයක් බවයි. "දෙරටේ සාමය හා ආගමික සංහිඳියාව වසර 200 ක් වයසැති ඔල්වි ගස සංකේතවත් කරනවා. "ඊශ්‍රායෙල් අගමැති තුමා එලෙසින් ද පවසයි. ශුද්ධවු දේශයේ බිහිවූ මෙම ඔලිව් ගස ඊශ්‍රායෙල් දේශයේ රාජ්‍ය නායකයා විසින් ලෝක කතෝලික නායක අති උතුම් XVI වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියාණන් වෙත ත්‍යාග කිරීම ඉතිහාසගත සිද්ධියක් බැව් කතෝලික

සංවාද මණ්ඩපය

# නූතන සමාජ අභියෝගයන් හමුවේ කිතුනු විශ්වාසය කොතැන ද?



*2011. 10. 09 පළවූ ලිපිය හා සබැඳේ......*

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙලොව මනුකය ගෙන මනුෂ්‍යයාට ගැලවීමේ මාර්ගය පෙන්වා දුනි. එම මාර්ගය තුළ දිවි ගෙවීමට අපට ද ආරාධනා කරන උන්වහන්සේ එම ජීවිතය පහසු මල් මාවතක් නොවන බව ද උන්වහන්සේගේ ජීවන පැවැත්ම තුළ මිනිසාට අවබෝධ කර ඇත.

ප්‍රශ්න ගැටළු අභියෝග හමුවේ දිවි ගෙවීමටත් සමාජ බලපෑම් හමුවේ යටපත් නොවී එකම අරමුණක් ඔස්සේ ගමන් කරන්නටත් උන්වහන්සේගේ ජීවිතය මඟින් මනුෂ්‍යයා උගත ගත යුතු පාඩමක් වන්නේ ය. ක්‍රිස්තියානි ජීවිත පැවැත්මේ පරමාර්ථය නම් ස්වර්ග රාජ්‍ය උරුම කර ගැනීමයි.

තවද අපගේ මෙලොව ජීවිතයේ වස්තු සම්පත් රැස් කිරීමට වඩා ස්වර්ග යෙහි වස්තු රැස් කර ගත යුතු බව ක්‍රිස්තුන් වහන්සේම ප්‍රකාශ කර ඇත. (මතෙව් 6:19-20) එසේම මෙලොව වස්තු සම්පත් රැස් කරන තැනැත්තාගේ ඉරණම පිළිබඳ ක්‍රිස්තුන් වහන්සේ ඉගැන් වූ උපමාවක් මෙහිදී මතක් කරමි. එනම් පොහොසත් මෝඩයා පිළිබඳ කතා වස්තුවයි. (ලූක් 12:13-21) එම කතා පුවතේ අවසාන වගන්තිය නම් "දෙවියන් වහන්සේ ඉදිරියෙහි පොහොසත් නොවී තමාට ම වස්තු රැස් කරගන්නා අය එවැනිය" (එනම් පොහොසත් මෝඩයා වැනිය) ස්වර්ග රාජ්‍ය පිළිබඳ ඉගැන්වීම මෙපමණකට පමණක් සීමා නොවේ. උන්වහන්සේගේ මුළු ධර්ම ව්‍යාපාරයේම හරය නම් ස්වර්ග රාජ්‍යයි.

මා මෙතෙක් ඉදිරිපත් කරන්නට වූ අදහස, ක්‍රිස්තියානි ජීවිතයේ හරය ද ස්වර්ග රාජ්‍ය බවත් ඒ සඳහා මෙලොව වස්තු රැස් කිරීමට වඩා ස්වර්ගයෙහි වස්තු රැස් කිරීම අප ජීවිතයේ ප්‍රමුඛතාව විය යුතු බවයි.

තවත් අතකින් ගත් කළ ක්‍රිස්තියානි ජීවිතය ඒක දේව වාදී විශ්වාසය මත ගොඩනැගුණකි. කිතුනුවාට පැමිණෙන දුක කඳුල, සතුට, ප්‍රීතිය, වාසනාව මේ සැම දෙයක්ම දෙවියන් වහන්සේ ගෙන් ම ය.

වහල් සේවයේ යෙදී සිටි ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා ගෙන යමින් දෙවියන් වහන්සේ සීනයි කන්දේ දී දුන් දසපනතේ පළමු පනත නම්, "වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම ය. මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය." (නික්මයාම 20:2-3) යන්නයි. ඉශ්‍රායෙල් ජාතියේ මොරගැසීම් වලට ස්වාමින් වහන්සේ මැදිහත් වූවාසේම අප ජීවිතයේ සැම ප්‍රශ්නයකටම ගැටළුවකටම අභියෝගයකටම පිළිතුර ඇත්තේ උන්වහන්සේ තුළය. එහෙයින් කිතුනුවන්ගේ විශ්වාසය විය යුත්තේ එම දෙවි පියාණන් වහන්සේ මත පදනම්ව තම ජීවිතයේ තීරණ තීන්දු ගැනීමය.

තවද කිතුනුවන් මෙන්ම නොකිතුනුවන් ද යම් ආකාරයක ජීවිත අසාර්ථක අවස්ථා වල දී තම ජීවිත පැවැත්ම තුළ හේතු සෙවීම වෙනුවට වෙනත් පිටස්තර පුද්ගලයකු හෝ දෙයකට තම අසාර්ථකත්වය ආරෝපණය කරමින් හේතු සෙවීම නම් විහිළුවකි.

මා මෙයින් නිගමනය කිරීමට උත්සාහ ගන්නේ කිතුනු ජීවිත පැවැත්ම නම්, දෙවියන් වහන්සේගේ දේව ආශිර්වාදය ලබා ඇති අප ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවන මාර්ගය අනුගමනය කරමින් ශුද්ධාත්මයාණන්ගේ මාර්ගෝපදේශය තුළ සමාජයේ ක්‍රියාකාරී විය යුතු බවයි.

එසේ නොකර බයිබල් පාඨ බෝඩ්වල ගසා නිවෙස්වල / වාහනවල එල්ලා තැබීම නිෂ්ඵල දෙයකි. තවද කිතුනු විශ්වාස ලක්ෂණයේ පළමු ප්‍රකාශය මෙහි දී මතක් කරන්නට අවශ්‍යය. සැබෑ වූ එකම දෙවියන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි. අහස හා පොළවද පෙනෙන නොපෙනෙන සියල්ල ද මවා වදාළ සියලු බලැති දෙවි පියාණන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි. අප දිව්‍ය පූජාවේ ද නැගී සිට එඩිතරව ප්‍රකාශ කරන්නේ හුදෙක්ම වචන මාලාවකට පමණක් සීමා කරගෙන දැයි යන්න පිළිබඳව නූතනයේ විචාල යුතුය.

මා නැවතත් ෆෙංෂුයි ශාස්ත්‍රයට ඔබේ අවධානය යොමු කරමි. ෆෙංෂුයි වල දී මා මුලින් සඳහන් කළාක් මෙන් සංකේත භාවිතා කිරීම මඟින් ජීවිතයේ ධනය, සතුට, සෞභාග්‍ය උදා කර ගැනීමට වාසනාව ලැබෙන බව විශ්වාස කරයි. තවද කිතුනුවකු ලෙස ක්‍රිස්තියානි ජීවිතයේ අරමුණ පැහැදිලි කළ අතර ඒ සඳහා තම ජීවිත පැවැත්ම කෙසේ සකසා ගත යුතු ද යන්න ද ඉහතින් විග්‍රහ කර ඇත.

එසේ නම් කිතුනුවන් ෆෙංෂුයි ශාස්ත්‍රය පිළිපැදීම වැරදිද? ෆෙංෂුයි ශාස්ත්‍රය පිළිපැදීම තුළින් කිතුනුවන් තම කිතුනු ජීවිත පැවැත්මේ අරමුණින් ඔබ්බට යන්නේ නම් ඒ පිළිබඳව සිතිය යුතුය. එක් අතකින් මනුෂ්‍යයා කිතුනු හෝ වේවා නොකිතුනු හෝ වේවා ධනයෙන් බලයෙන් උගත් කමින් ඉහළට යන විට දේව විශ්වාසයන් හා දේව සංකල්පයන් පිළිබඳව අමතක වීමට හෝ අමතක කිරීමට පෙළඹෙති. නැතහොත් එය විහිළුවක් කොට සලකති. අවසානයේ දුකක දී කරදරයක දී නැවතත් දෙවිඳුන් සොයා එති.

කිතුනුවන් ද ජීවිත පැවැත්මේ ප්‍රමුඛතාව දෙවිඳුන්ට නොදී ලෞකිකත්වයට නැඹුරු වන්නේ නම් එහි ප්‍රතිඵලය පොහොසත් මෝඩයාට අත් වූ ඉරණම වන්නේ ය. තවත් අතකින් ශු. පාවුළු තුමා කොරින්ති සංඝයට යවන ලද හසුනේ ( 1 කොරින්ති 8:1-13) සඳහන් දේවතා පිදේනි අනුභව කිරීම හා යම් සහෝදරයකුගේ විශ්වාසයට බාධා වන යම් දෙයක් නොකළ යුතු යැයි ප්‍රකාශ කරන ලද දේ නූතන කිතුනුවන්ට ද අදාළ කර ගත යුතු බව කිව යුතු වේ.

සමස්තයක් ලෙස ගත් විට ඉහත කරන ලද සියලුම කරුණු කාරණා පිළිබඳව සිතන කල්හි කිතුනු නිවෙස්වල ෆෙංෂුයි සංකේත තබා ගැනීමේ යථාර්ථය කුමක් ද යන්න සිතීමට කාලය ඔබ සතුය. ලාෆින් ගෝඩ් ප්‍රතිමා කිතුනු නිවෙස් වල තබා තිබෙනු මා දැක ඇත. එසේම දේව මාතා වහන්සේට භක්තිය, ගෞරවය දැක්වීම උදෙසාත් එතුමියගේ රැකවරණය පතාත් කිතුනුවන් පළඳින කොන්ත මුදුව වෙනුවට ඇතැම් කිතුනුවන් ෆෙංෂුයි මුදු පැළඳ සිටිනු මා දැක ඇත. එය වැරදි යැයි මා නිගමනය නොකරන නමුත් දෙවියන් වහන්සේ මත තබන විශ්වාසයට හානියක් නොවේ යැයි ද කිතුනුවන්ගේ මෙම ක්‍රියා කලාපයන් දුබල විශ්වාසිකයකුගේ විශ්වාසයට කැළලක් නොවන්නේ යැයි යන උපකල්පනය මත ෆෙංෂුයි ශාස්ත්‍රයේ ඇතැම් සංකේත සංකල්ප කිතුනුවන් පිළිපැදීම සම්බන්ධයෙන් එකඟ විය හැකි යැයි සිතේ.

එනමුත් කරන ලද උපකල්නය කොතෙක් දුරට සාර්ථක ද යන්න ප්‍රශ්නයකි. එම උපකල්පනය නිවැරදි නොවන්නේ නම් කිතුනු සමාජ දර්ශනයට හා සදාචාර ධර්ම වලට අනුව ෆෙංෂුයි ශාස්ත්‍රය කිතුනුවන් පිළිපැදීම සම්බන්ධයෙන් තෙවරකවත් සිතිය යුතු වේ.

අවසාන වශයෙන් මනුෂ්‍යාට ලැබී තිබෙන මානව නිදහසට මා කිසිදු බාධාවක් නොකරමි. දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යා මැවීමේ දී ම එම නිදහස දේව තිළිණයක් සේ පවරා දී ඇත. එහෙත් මනුෂ්‍යා එය නිවැරදිව භාවිතා කළ යුතු වේ. එසේ නම් ෆෙංෂුයි ශාස්ත්‍රය, සංකේත, සංකල්පයන් හෝ වෙනත් ගුරු හරුකම් කිතුනුවන් අනුගමනය කිරීම සුදුසු යැයි හෝ නුසුදුසු යැයි හෝ මා නිගමනය කරන්නේ නැත.

එය තීරණය කිරීමේ පරම යුතුකම ඔබ සතුය. එනමුත් ඒවායේ සැබෑ යථාර්ථය සොයා බලා කිතුනු විශ්වාසය, කිතුනු පැවැත්ම කිතුනු ජීවිත අරමුණ මත පදනම්ව තම තීරණය කුමක් ද යන්න අවබෝධ කරගත යුතු වේ. එසේ නොකර සමාජයෙන් පැමිණෙන සැම දෙයකටම එහෙයි කීම කිතුනු සදාචාර පැවැත්මට බාධාවක් වන්නේ ය.

\- නිමි -

> **"දෙවියන් වහන්සේ සීනයි කන්දේ දී දුන් දසපනතේ පළමු පනත නම්, "වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම ය. මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය." (නික්මයාම 20:2-3) යන්නයි. ඉශ්‍රායෙල් ජාතියේ මොරගැසීම් වලට ස්වාමින් වහන්සේ මැදිහත් වූවාසේම අප ජීවිතයේ සැම ප්‍රශ්නයකටම ගැටළුවකටම අභියෝග යකටම පිළිතුර ඇත්තේ උන්වහන්සේ තුළය."**

කැලණිය සරසවියේ දෙවන වසර ක්‍රිස්තියානි අධ්‍යයන අංශයේ
**ඔස්මන් සුසන්ත විසිනි**

# නූතන කතෝලික අපිත්, සභාවත් අද කොයිබට ද?

*2011. 10. 09 පළවූ ලිපිය හා සබැඳේ......*

ක්‍රිස්තුන් වහන්සේට, මරියතුමීට විරුද්ධව මාධ්‍යයන් මඟින් කෙරෙන බොරු ප්‍රචාර නින්දා අපහාස වලට මාධ්‍යයන් මඟින්ම නොපැකිළව පිළිතුරු දීම සභා ශ්‍රේෂ්ඨයන්ගේ වගකීම වන්නේ ය. ආගමික වැඩසටහන් විද්‍යුත් මඟින් ප්‍රචාරය කිරීමේ දී අන්‍යාගමිකයන්ටත් වැටහෙන පරිදි ආකර්ෂනය වෙන පරිදි, සරල, සිත්ගන්නා සුලු ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය. සුළු ප්‍රතිශතයත් සහිත කතෝලිකයන් වෙසෙන දුෂ්කර පළාත්වල පාසල් දරුවන්ට දහම ඉගැන්වීමට එවැනි පළාත් වලට යාමට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වෙන ගුරුවරුන්, කරදර මධ්‍යයේ වුවද සේවය සඳහා යැවිය යුතුය. එසේ නොකළහොත් වැඩි කලක් යාමට ප්‍රථම ඔවුන් ද අන්‍යාගම් වලට හැරෙන එක නම් වැළැක්විය නොහැකිය.

පහසුකම් ඇති සැම මීසමක, ඉරිදා වෙනුවට තැබෙන සෙනසුරාදා දිව්‍ය පූජාව අවලංගු කොට ඉරිදා පමණක් පූජාව තැබිය යුතුය. ඉරිදා රැකියාවට නොයන පුද්ගලයන් පවා සෙනසුරාදා පූජාවට සහභාගී වී ඉරිදා දිනය පටන්ගත් වේලේ පටන්ම අශුද්ධ ලෙස ගත කිරීම අරඹන නිසාත් ඉරුදිනත්, ණය මංගල්‍ය දිනත් ශුද්ධ ලෙස ගත කිරීම අවශ්‍ය නිසාත් ය.

පූජක පුතුන්ට පූජාත්වරය ලැබීමට ඇති අපහසුතා පහසුකොට සකසා දීම නූතන පූජක පරපුරට මඳ අස්වැසිල්ලක් හෝ වේ යැයි සිතන්නෙමු.

ඉන්දියාවේ වේලන්කන්නි, ගෝව ඇති සිද්ධස්ථාන වලට යාමට ඉන්දියාවෙන් පහසුකම් වෙනත් රටවල බැතිමතුන්ට සලසා තිබෙනවා මෙන්ම, ශ්‍රී ලංකාවේ "බැසිලිකාව", "මඩු", "තලවිල", "වහකෝට්ටේ" "කොච්චිකඩේ" යන සිද්ධස්ථානවල ඇති ප්‍රාතිහාර්යාත්මක භාවයන් ඔවුන් අතරේ ප්‍රචාරය කිරීමට සලස්වා ඉන්දියානු බැතිමතුන් අපේ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට ද පහසුකම් සැලැස්විය යුතුය.

දවසකට පමණක් සීමාවෙන සත්ප්‍රසාද මංගල්‍යය, මුනිවරයින්ගේ මංගල්‍යය පවත්වන ආකාරයෙන්ම නුවාන මට්ටමින් සතියක් පුරා ධර්ම විවේකයක් තබා උත්කෘෂ්ඨවත් ආකාරයෙන් පැවැත්විය යුතුය. "දිව්‍ය සත්ප්‍රසාදය" යනු "මේ ලෝ දනන්ගේ වස්තුව" මෙන්ම "සිරින් පිරි ධනයෙන් අනූන සුරපුරේ විපාකය ද" වන නිසාය.

"මිශ්‍ර විවාහය" න් බෝට්ටු දෙකක දෙකකුල් තබාගෙන යන අවිනිශ්චිත ගමන වෙනුවට, එක බෝට්ටුවකට ගොඩ වී ගමනේ කෙළවරට සුව සේ යාම හිතකර බව, එම විවාහයට ඇතුළත් වන කතෝලිකයා සිහි තබාගැනීම මැනවි.

ආදම් - ඒව, ලාසරුස්, සකේවුස්, අයකැමියන්, පරිසිවරුන් සහ හෙරෝද්, පිලාත්, ජුදාස්ලා ගැන පමණට වඩා කතෝලිකයන් දන්නා බැවින් ඉරුදින පූජාවල් වල දී පියතුමන්ලා ඉහත කී පුද්ගල නාම වලින් බැහැරව අද කතෝලික ඇදහිල්ලට ඇති වී තිබෙන බාධක හිරිහැර ගැනත්, මං මුළාව සිටින කතෝලිකයන්ට නිසි මාර්ගයට අවතීර්ණ වෙන ආකාරය ගැනත් දේශනාවන් තුළින් ඒත්තු ගන්වන්නේ නම් එය කාලෝචිත බව අපේ හැඟීම යි.

මීසම් සභාවල අනුග්‍රහයෙන් නොමිලේ ඇස් කණ්නාඩි බෙදා දෙන්නා සේම, කුරුස, පදක්කම්, දුවා දරුවන් අතරේත්, බැතිමතුන් අතරේත් නොමිලේ බෙදා දීමට යම් කිසි ආයතනයක අනුග්‍රහයෙන් සලසා දීම අත්‍යවශ්‍යයි හැඟේ. අද කතෝලික බොහෝ දෙනා "කුරුස" පළඳිති. නැත්නම් කතෝලිකයන් යැයි කියා ගන්නට අද කතෝලිකයන්ට සළකුණක් නැති තරම් ය. පෙනෙන්ට ඇති එකම සලකුණ නම් සෙල් ෆෝන් එක පමණි.

පූජා යාගය පැවැත්වෙන අවස්ථාවේ දී එළිමහනේ සිට වාහනවලට, බිත්තිවලට, හේත්තු වී, චුවිංගම් සපමින්, සෙල්ෆෝන් පාවිච්චි කරමින්, ක්‍රිකට් තරග, සුපිරි තරු ගැන විවේචනය කරමින් හැසිරෙන්නෝ කතෝලිකයෝ ද එසේත් නැත්නම් කතෝලික වීමට ඉල්ලුම් පත් දමාපු අය දැයි වටහා ගැනීමට නොහැකි තරම් ය.

විවාහ මංගල පූජා අවස්ථාවල දී පූජාව සිදු කරන්නේ වත් පිළිවෙත් ඉටු කරන්නේ පූජක තුමා ද, නැතිනම් කැමරාකරුවෝ ද යන්න සොයා ගැනීමට තරම් අපහසු කාරණාවකි. ඒ තරමටම ඔවුන් පූජාසනයත් ඒ අවටත් ආක්‍රමණය කරමින් තමාගේ කාර්යය පමණක් කිරීමට වෙර දරණ නිසා ය.

මූල ධර්ම වාදය නමැති විෂ බීජය කතෝලිකයන් බහුතරයක් වෙසෙන පලාත් වල විසිරී, පැතිරී ඇති නිසාත්, ඔවුන්ගේ ගැත්තන් වී සිටින කතෝලික යයි කියා ගන්නා බඩ ගෝස්තර වාදීන්ගේ පවුල් පොත් ඔවුන් අයිති මීසම් සංඝයෙන් ඉවත් කොට එවන් පුද්ගලයින් මිය ගිය පසු අර පාස්ටර්ලාගේම ගෙවතුවල වැළලීමට උපදෙස් දිය යුතු අතර, ඔවුනට චරිත සහතික පල්ලියෙන් නිකුත් කිරීම යනා දී කාරණාත් වහා නතර කළ යුතුය.

ජේදුරු තුමා මත ගොඩ නැඟූ ශුද්ධවූ සභා පර්වතය මූලධර්මවාදී, බයිබල් හොරුන් නමැති නිරා දොරටුවලට පහුරු ගසා විනාශ නොකළ හැකි බවත් ලෝකාන්තය දක්වා එය නොසැලී, නොකැඩී, නොබිඳී ඒකායන විශ්වාසකයන්ට රැකවරණය සලසමින් මිහිකත සිසාරා වැජඹෙන බව ඉර හඳ මෙන් විශ්වාසය. - නිමි -

**කැෂියන් බර්ට්‍රම් පෙරේරා**

